
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත



අදට යෙදෙන ජාතික ගිහි ඉරුදින නිමිත්තෙන් කළ පිළිසඳරකි.

**දේව වචනය ගිහියාට අභියෝගයක්**


3 පිටුව



**දියඹට දියත් කරමු**

කුරුණෑගල පදවියේ රජත ජයන්ති මහෝත්සවය වෙනුවෙන් පිදෙන තිළිණයක්.

8 පිටුව



ප්‍රදීප "සංවාද මණ්ඩපයෙන්" කැරෙන විමසීමකි.

**අරගලයේදී සභා මඟ පෙන්වීම**

12 පිටුව



2010 වසරේ හොඳම ආගමික පුවත්පත


# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07




"මිදිවැල මමය, ඔබ අතුය"
උත්ථාන සමයේ පස්වන ඉරුදින

ක්‍රි.ව. 2012 ක් වූ මැයි 06 ඉරිදා 146 වෙළුම 47 කලබ සතිපතා පත්‍රය - පිටු 20 - මිල රු. 25.00 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

# දූත කාර්යයේ ගැඹුරට ගමන් කරන්න; එය නොනිම් ගමනකි

## ඇතුගල්පුර රජත ජයන්තිය නිමිත්තෙන් කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ අවධාරණය කරති

**ධර්මදූත සේවයට අවශ්‍ය යටිතල ව්‍යුහය සැකසී ඇතත් කිතුනු දිවියේ ඉලක්කය වන ශුද්ධවන්තභාවයට ළඟා විය හැකි වන්නේ ආධ්‍යාත්මිකව එකිනෙකා කිතුනු ජීවිතයේ ගැඹුරට ගමන් කිරීමෙන් යැයි ඇතුගල්පුර රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ රදගුරු වසමේ රජත ජයන්තිය නිමිත්තෙන් අනුශාසනා පත්‍රයක් නිකුත් කරමින් අවධාරණය කරති.**

1987 මැයි මස 15 වැනි දා කුරුණෑගල නව රදගුරු වසම ස්ථාපිත කළ අතර මේ වසරේ මැයි මස 15 දාට වසර විසිපහක් සපිරේ.

මේ නිමිත්තෙන් වැඩසටහන් රැසක් දියත් වූ අතර, ජයන්ති සැමරුම මැයි 12 දා පෙ.ව. 8.45 ට කට්ටිමහන සා. ආනා සිද්ධස්ථාන බිමේ දී උත්සවාකාරයෙන් පැවැත්වේ. මේ නිමිත්තෙන් නිකුත් කළ රදගුරු හිමි අනුශාසනා පත්‍රයේ මෙසේ ද දැක්වේ. "ගිහි, පැවිදි, පූජක වන අප, අපව දවසින් දවස ශුද්ධවන්ත කරගනිමින් අන් ජීවිත ද ශුද්ධවන්ත කරවමින් ජීවිතයේ සැබෑ කිතුනු ශ්‍රාවකත්වයට ගමන් කරමු."

අති උතුම් 16 වන බෙනඩික් ශුද්ධෝත්තම සසුනිසුරාණන්ගේ "විශ්වාසයේ දොරටුව" නමැති අපෝස්තලික අනුශාසනා පත්‍රයෙන් විශ්ව සභාවට කරන ආරාධනය, විශ්වාසයේ ගැඹුරට දියත් කරන්නට සූදානම් වන රදගුරු වසමට මේ රජත ජයන්තිය පැමිණෙන වෙස් වලාගත් ආශිර්වාදයකි."

## දේව වචනය තුළින් විශ්වාසයේ නවෝදයකට



"දේව වචනයේ" වසර තුළ දූත සේවා සජීවක කණ්ඩායම ආශිර්වාද කිරීමේ හා කැප කිරීමේ දේව මෙහෙයේදී අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් සජීවිකාවක් වෙත අදාළ නිල පත්‍රිකා පිළිගැන්වූ අයුරු...දේව ධර්ම නිකේතනයේ අදියුරු ගරු දයා වැලිකඩආරච්චි පියතුමා ද පසෙක සිටී. **(සේයා - අසික ප්‍රියදර්ශන)**

## කාදිනල් හිමිපාණන්ව 13 දා කන්ද උඩරටට පිළිගනී

කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් මැයි 13 වැනිදා කන්ද උඩරටට පිළිගැනීමට කටයුතු පිළියෙළ වෙමින් තිබේ.

මධ්‍යම පළාතේ ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුවක් මඟින් මහනුවර කොටුගොඩැල්ල වීදියේ සාන්ත අන්තෝනි ආසන දෙව්මැඳුරට සැපත් වන කාදිනල් හිමිපාණන් හේවිසි පෙරටු කරගත් කන්ද උඩරට සාම්ප්‍රදායික පෙරහරින් පිළිගැනේ. කන්ද උඩරටට කාදිනල් හිමිපාණන් නමක සැපත් වන දෙවන අවස්ථාව මෙය වන අතර අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන්ට පසු වසර හතළිහකින් මේ අවස්ථාව උදා වී තිබේ.

මේ කමිටු රැස්වීම ටිකිරි කොබ්බෑකඩුව මධ්‍යම පළාත් ආණ්ඩුකාර තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති අතර අනුනායක අතිගරු මිල්රෝයි ෆොන්සේකා, ගරු අයිවන් ජයසුන්දර පියතුමන් ද, නියෝජ්‍ය පොලිස්පති ජී. බී. පෙරමුණ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කිත්සිරි ගනේගම, පොලිස් අධිකාරි ගාමිණී ඇල්ලෙපොළ මහත්වරුන් ඇතුලු පිරිසක්ද මේ අවස්ථාවට එක්වූහ.

## නිවේදනයයි

සංශෝධිත රෝම මිසාල් ග්‍රන්ථය සහ ජන පූජා ඔර්ඩෝ පිටපත් දැන් ලබාගත හැකි හෙයින් ඉංග්‍රීසි නව මිසාල් පොත අප රටේ භාවිතය 2012 මැයි 27 පෙන්තකොස්ත ඉරුදින පටන් අනිවාර්ය කොට තිබේ.

එහෙයින් අපි සියලු පූජකතුමන්ගෙන් නව ඉංග්‍රීසි මිසාල් පොත අනුයමින් සැදැහැවතුන් ද එය භාවිතාවට පුරුදු පුහුණු කරමින් 2012 මැයි 27 දා පෙන්තකොස්ත ඉරුදින පටන් එය භාවිතයට ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමු.

**අති උතුම් වියානි ප්‍රනාන්දු හිමි**
සභාපති
ජනවන්දනාව හා සංස්කෘතිය පිළිබඳ ජාතික කොමිසම

**අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමි**
සභාපති ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව

## ජාතික කිතුනු සාහිත්‍ය උලෙළ 2012

බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව සංවිධානය කරන ජාතික කිතුනු සාහිත්‍ය උලෙළ, 2012 ඔක්තෝබර් මස පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කෙරෙමින් පවතී. මෙම උලෙළට සමගාමීව කතෝලික / ක්‍රිස්තියානි ගීතිකා සාහිත්‍යයට අමිල සේවාවක් ඉටුකළ කලාකරුවන්ට උපහාර තිළිණ ප්‍රදානය කිරීමට තීරණය කර ඇත. එබැවින් එම කලාකරුවන්ගේ තොරතුරු රැස්කරගැනීම සඳහා අයදුම්පතක් නිකුත් කර ඇත. එය 15 පිටුවේ පලවේ.

## ජංගම පොත්හල මෙදා පේරලන්දේ

කොළඹ කතෝලික මුද්‍රණාලයේ ජංගම පොත් සේවාව මැයි 05 සෙනසුරාදා හා 06 ඉරිදා දිනවල පේරලන්ද සා. ජෝශප් දෙව්මැදුරු බිමේ පැවැත්වේ.

## බලගල සහ කෙරවලපිටිය නව මීසම් වේ

නව මීසම් ලෙස අලුතින් බිහි වූ බලගල මීසම සහ කෙරවලපිටිය මීසම යන මීසම් දෙකෙහි නවක මීසම් සේවක පියවරුන් පිළිගැනීම, නේවාසික පියවරුන්ට සමුදීම හා මීසමක් බවට පත්වීම ප්‍රකාශයට පත්කිරීමේ කටයුතු අති උත්සවාකාරයෙන් ලබන 13 වැනි ඉරිදා සිදු කිරීමට නියමිතය. අති උතුම් මැක්ස්වල් සිල්වා සහයක රදගුරු හිමිගේ සහභාගීත්වයෙන් කෙරවලපිටිය මීසම සිය වාර්ෂික මංගල්‍යය ද එදින සමරනු ලබයි.

## "ඥානාර්ථ ප්‍රදීපයට" 150 යි

තව වසර දෙකකින් එළැඹෙන "ඥානාර්ථ ප්‍රදීප"යේ 150 වැනි සංවත්සරය ඉලක්ක කොට දීප ව්‍යාප්ත ප්‍රජා සත්කාරක ව්‍යාපෘතියක් හා කතෝලික වෘත්තීය හා ආධුනික පුවත්පත් කලාකරුවන් ඇගැයීමෙන් මෙතුවක් ප්‍රදීපයෙහි පලවූ සාහිත්‍යමය, කාව්‍යමය හා ස්වතන්ත්‍ර නිර්මාණ අළලා ග්‍රන්ථ කිහිපයක් නිකුත් කෙරුමටත් බලාපොරොත්තු වේ. ඔබේ අදහස් ප්‍රදීප කතුතුමා වෙත යොමු කරන්න.

## "ඥානාර්ථ ප්‍රදීපය" සැම කතෝලික පවුලක්ම මිළදී ගත යුතුයි

**ටෙස්මා රෝස් ශ්‍රියන්ති විසිනි**

මෙරට ඉපැරැණිම පුවත්පතේ වගේම සඟරාවේත් උරුමය කතෝලිකයටයි. "ඥානාර්ථ ප්‍රදීපය" වගේම "භක්ති ප්‍රබෝධනය" කතෝලික ප්‍රකාශන සැම කිතුනු පවුලක්ම මිළදී ගෙන කිතුනු වටිනාකම් පවුල තුළ සවිගන්වන්නට උරදිය යුතුයැයි හලාවත රදගුරු වසමේ පැවැත්වීමට 15 පිටුවට ▶

## සාමය ගොඩනැඟීමක් හා සමඟි සන්ධානයක් කරා

### ශ්‍රී ලංකා කතෝලික රදගුරු මඬුල්ලෙන් විශේෂ නිවේදනයක්

වසර 30 කට අධික යුද්ධයක ආදීන පිළිබඳව ආවර්ජනය කරමින් සැබෑ සංහිඳියාවක්, සමඟියක්, සාමයක් හා එකමුතුකමක් ගොඩනැංවීමේ ඇඩි අවශ්‍යතාවය පිළිබඳ දේශයේ අවධානය ප්‍රබලව යොමුවෙද්දී උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසමේ නිර්දේශ ද මූලික කොටගෙන ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය ඒ පිළිබඳව සිය අපේක්ෂාව හා දැක්ම විස්තර කරමින් විශේෂ නිවේදනයක් නිකුත් කර තිබේ. (සම්පූර්ණ නිවේදනය ඉදිරි කලාපයෙන් බලාපොරොත්තු වන්න)

## ජා-ඇල වික්ෂෝප දේවමාතා 2000 සංවත්සරය

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි විසිනි**

ජා-ඇල වික්ෂෝප දේවමාතා දෙව්මැදුරේ "වික්ෂෝප දේවමාතා නිරන්තර නොවාන මාලාවේ 2000 වැන්න පසුගිය මැයි මස 04 වන දින බැතිබරව පැවැත්විණි.

ජා-ඇල මීසම් සේවක ගරු ග්‍රෙගරි ජයන්ත ප්‍රනාන්දු පියතුමා සමඟ මීසම් ධර්ම සේවා සභාව සංවිධානය කළ මෙම වික්ෂෝප දේවමාතා නොවානයේ 2000 වැන්න පසුගිය මැයි මස 04 වන දින සවස 4.30 නොවානය කොළඹ සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන්, හා සවස 6.30 නොවානය කොළඹ සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ද පැවැත්විණි. එදින උදේ 6.30 පූජාව කොළඹ උතුරු කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

ජා-ඇල වික්ෂෝප නොවාන මාලාවේ 2000 වැන්න වෙනුවෙන් ජුබිලි සමරු කළඹක් ද ප්‍රකාශයට පත් කෙරිණි.

## සෙත්තප්පාඩුවට දේව දයාවේ ජේසු සමිඳුන්ගේ සිද්ධස්ථානයක්

බැතිබර කතෝලික ගම්මානයක් වන සෙත්තප්පාඩුවේ දේව දයාවේ ප්‍රථම සිද්ධස්ථානය ගොඩනැංවීමට පියවර ගන්නා බව ප්‍රදීපයට වාර්තා වේ.

දැනට දේව දයාවේ ජේසු සමිඳුන් නමින් සිද්ධස්ථානයක් දිවයිනේ නොමැති අතර, මෙම සිද්ධස්ථානය ගොඩනැංවීමත් සමගම එය දේව දයාවේ ජේසු සමිඳුන්ගේ ප්‍රථම සිද්ධස්ථානය බවට පත්වේ. කැපුන්ගොඩ, සෙත්තප්පාඩුවේ පිලීෂියා පෙරේරා මෙනෙවිය පරිත්‍යාග කළ අක්කරයට වඩා වැඩි භූමිය සිසාරා ගොඩනැංවීමට මුල පිරෙන මෙම සිද්ධස්ථානය දිවයිනේ කාගේත් ඇස ගැටෙන වන්දනීය සිද්ධස්ථානයක් බවට පත් වෙනු ඇතැයි යන්න පොදු අපේක්ෂාවයි.

**"යමෙක් මා තුළ වසන්නේ ද , ඒ තැනැත්තේ බොහෝ ඵල දරයි."** (ජුවාම් 15:1-8)

පදවියෙන් පදවියට

# දෙවියන්වහන්සේට නොදෙන කිසිවක් අප ළඟ නැත

## අගරදගුරු හිමිපාණෝ කණුවන නව මණ්ඩපය ආසිරි ගන්වමින් පවසති


**දේවස්ථාන ගොඩනැගිලි හදන්නේ ස්වාමින් වහන්සේගේ ගෘහයේ උන්වහන්සේ වැඩ සිටින ස්ථානය අපගේ මීසමේ ප්‍රධාන ස්ථානය බව පෙන්වීමටයි. දේවස්ථාන අලංකාර කිරීම අගය කළයුතු බවත්, දේවස්ථානය ලස්සන කිරීමෙන් පෙනී යන්නේ දෙවියන් වහන්සේට නොදෙන කිසිවක් අප ළඟ නැති බව යැයි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ කනුවන දෙව් මැඳුර විශාල කර අභිනවයෙන් ඉදිකළ මණ්ඩපය ආසිරි ගන්වා විවෘත කරමින් ප්‍රකාශ කළහ.**



මේ ඓතිහාසික අවස්ථාවට කොළඹ උතුරු කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා, ඥානාර්ථ ප්‍රදීපය සංස්කාරක ගරු ශාන්තසාගර හෙට්ටිආරච්චි, තුඩැල්ල දිසා නායක ගරු ග්‍රෙගරි ජයන්ත, ක්‍රිස්තුරාජ විදුහල්පති ගරු නිහාල් රුද්‍රිගු පියතුමන්ද සහභාගි වූ අතර, මීසම් සේවක ගරු නික්ලස් බටේපොල පියතුමා ස්තුති කථාව කළේය.

ධර්මසිරි ප්‍රනාන්දු

## සුබාසිංසන



ත්‍රිකුණාමලය මඩකලපුව රදගුරු අතිඋතුම් කිංස්ලි ජේ. ස්වාමිපිල්ලේ හිමිපාණන්ගේ රාජගුරු අභිෂේකයේ 29 සංවත්සරය මැයි 07 දාට යෙදේ. එතුමනට ප්‍රදීප සුබාසිරි සමඟ දේවාසිරි පතා යදිමු.

## උතුර දකුණ යා කළ පූජකවර ප්‍රදාන මෙහෙයක්



යාපනය සා. මරියා ආසන දෙව්මැඳුරේදී ගරු එම්. ආර්. රූබන්, ගරු එම්. ජේකබ් සහ ගරු එස්. එක්ස්. රවිකාන්ත් යන ක්ලාරේෂියානු නිකායික තේවාචාර්ය තුමන් තෙනමට යාපනය රදගුරු අති උතුම් තෝමස් සෞන්දරනායගම් හිමිපාණන් විසින් පූජකවරයට ඔසොවනු ලැබීය. දකුණේ බැතිමතුන් රැසක් මීට සහභාගි වීම කැපී පෙනෙන දුලබ දර්ශනයක් බව උතුරේ වැඩිහිටි බැතිමත්හු පැවසූහ.

ශ්‍රී ලංකාවේ රදගුරු පදවි 10 නියෝජනය වන අයුරින් පදවි හා විවිධ නිකායික ගරු පියවරුන් ද, විවිධ නිකායික ගරු සොයුරියන් මෙන්ම කීරපත්දෙනිය, නුවරඑළිය, බදුල්ල යන මීසම් වල බැතිමතුන් රැසක්ද මේ අවස්ථාවට ඒකරාශි වූහ.

තියබෝල්ඩ් සමරතුංග

# දේව දයාවේ මංගල්‍යය දන්කොටුවේදී





දේව දයාවේ ජේසුතුමන් නමින් කැප කරන ලද ශ්‍රී ලංකාවේ පළමුවැනි දෙව් මැඳුර වන දන්කොටුව දිසා රෝහල් භූමියේ ස්ථාපිත කර ඇති දෙව් මැඳුරේ දී නව වන වරටත් දේව දයාවේ ජේසු තුමන්ගේ මංගල්‍යය පවත්වන ලදී. සන්ධ්‍යා මෙහෙය ආරම්භයට පෙර දන්කොටුව නගරය වෙත ගමන් ගත් පෙරහරට මහා වැස්ස ද නොතකා විශාල ජනකායක් සහභාගි වූහ.

හාල්දඩුවන මීසම් සේවක ගරු ප්‍රැන්සිස්ලාවුස් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන්, දුම්මලකොටුව මීසම් සේවක ගරු ජූලියන් හයසින්ත් පියතුමා ඇතුළු පියතුමන් පිරිසකගේ සහයෙන් සන්ධ්‍යා මෙහෙය සිදුකෙරින. මංගල්‍ය දිව්‍ය පූජා යාගය හියුබට් ඇන්තනි පියතුමාගේ ප්‍රධානත්වයෙන් ගරු ජූලියන් හයසින්ත් පියතුමන්ගේ සහයෙන් පැවැත්විණ. දේව දයාවේ ජේසු තුමන්ගෙන් ලද විස්මය ජනක පිහිටෝපකාරයන් පිළිබඳව කිතුනු නොකිතුනු ජනතාව ඉදිරිපත් කළ ලිපි තුති ප්‍රශංසා ලෙස ප්‍රකාශයට පත් කිරීම විශේෂත්වයකි.

ටෙක්ලා කල්දේරා

# ඇතුගල්පුර පදවි රජත ජයන්තියට නාලවලානේ අධ්‍යාත්මික නවෝදයක්!

කුරුණෑගල රදගුරු වසමේ රජත ජයන්තිය නිමිත්තෙන් නාලවලාන මීසමේ ක්‍රියාත්මක කළ විශේෂ ආගමික වැඩසටහන මගින් එම දේව ජනතාවට අධ්‍යාත්මික පෝෂණයක් ලබා ගැනීමට අවස්ථාව උදාවිය.

කුරුණෑගල පදවි ජුබිලි කමිටුව විසින් මේ ජයන්ති වසරේ ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා පිළිවෙලින් මව්වරුන්, ළමුන්. පියවරුන් සහ තරුණ තරුණියන් සඳහා කැපකරන ලදී. ඒ අනුව ගරු පියතුමා අදාල කණ්ඩායම් වෙත එම මාසවල ඉරුදින ජනවන්දනාව සංවිධානය පවරා විශේෂ උපදේශකයන් මගින් පුළුල් දහම් අවබෝධයක් ලබාදීමට ක්‍රියා කළේය. මීසමේ දහම් පාසල් ළමුන් සඳහා එක්දින ධර්ම විවේකයක් මීසම් ශාලාවේදී පවත්වන ලදී. මේ අවස්ථාවට පැවිදි සොහොයුරියන් ඇතුලු සැදැහැවතුන් විශාල පිරිසක් සහභාගිවූහ.

ජුබිලි වසර ආරම්භයත් සමඟ ගරු පියතුමා මීසමේ සියළු කිතුනු නිවාස බැහැදැක එම නිවෙස් ආසිරිගන්වන ලදී. මේ කාලයේ කිතුනු ඒකක දහසයේ රැස්වීම් අසිපා ක්‍රමවේදය අනුව දේව වචනය මෙනෙහි කරමින් යෝජනා සහ අදහස් බෙදාගන්නා ලදි. තවද කුඩා කිතුනු ඒකක පිළිබඳ ජාතික අධ්‍යක්ෂ ගරු එරික් ඩී. ප්‍රනාන්දු පියතුමාට ආරාධනාකර මීසමේ සියළු කිතුනු ඒකක නායිකාවන්ට අසිපා ක්‍රමවේදය නව ඒකක තුළ ක්‍රියාත්මක කිරීමට පුළුල් අවබෝධයක් ලබාදුනි. දින තුනක් පුරාවට පැවති එම වැඩමුළුවට සියළුම කිතුනු ඒකක නායිකාවන්ගෙන් සහ පියවරුන්ගෙන් පුළුල්දායකත්වයක් ලැබුණි.

නාලවලාන මීසම් සේවක ගරු ලීනස් මැක්ලවුඩ් පියතුමාගේ පූර්ණ මෙහෙයවීම ඇතිව නාලවලාන ගරු පැවිදි සොහොයුරියන්ගේ දායකත්වය යටතේ මෙම සියළු ආගමික පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක විය.

එෆ්. ජේ. එල්. කරුණාරත්න



මැදවච්චිය සා. ජෝශප් දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය වෙනුවෙන් මීසමේ කතෝලික තරුණ කැළ ප්‍රදේශයේ එළවළු උපයෝගි කරගෙන මීසම් සේවක ගරු සරත් පෙරේරා නි.ම.නි පියතුමාගේ මඟපෙන්වීම ඇතිව ඉදිකළ තොරණයි මේ.

## පමුණුගම මීසමේ වැඩිහිටි දහම් පංති

**පමුණුගම මීසමේ සැම ඉරුදිකම පෙරවරු 8.00 ට වැඩිහිටි අය සඳහා කතෝලික ධර්මය උගැන්වීමේ පංති පැවැත්වේ.**


මීසම් සේවක ගරු ආනන්ද විතාන හා ගරු මංජුල නිරෝෂන් පියවරුන්ගේ අධීක්ෂණයෙන් පමුණුගම ඇලෙන්එගොඩ සා. සෙබසතියන් දෙව්මැඳුරේදී මෙම පංති පැවැත්වේ. මෙම පංති සඳහා විවාහාපේක්ෂක වැඩිහිටියන් බොහො 'දෙකේ සහභාග වෙති.

බෙන්ජමින් කිරිහෙට්ටි



පල්ලන්සේන මීසමේ දුගී ජනතාවට නිවෙස්වල පිළියෙල කරන පාස්කු ඉරුදින මංගල දිවා ආහාරයෙන් බත් පාර්සල් පන්සීයක් බෙදා දීම මීසම් සේවක ගරු ජයන්ත නිමල් පියතුමාගේ මුලිකත්වයෙන් හා මීසමේ තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයේ ආත්මීක අධ්‍යක්ෂ මීසම් සහයක ගරු සිසිර සමරකෝන් පියතුමාගේ උපදෙස් පරිදි ඔස්කා සිල්වා ගුරු පියානන්ගේ නායකත්වයෙන් සමාජිකයන් විසින් දොලොස්වන වරටත් සිදුකරන ලදී.

මෙල්වින් ද කොස්තා



හංවැල්ල මීසමේ පොදු පාදනමස්කාරය හංවැල්ල දේවස්ථානයේ සිට කටුක මාර්ගයන් ඔස්සේ පහත්ගම දේවස්ථානයට ලඟා විය. පාදනමස්කාරයේ දේශන වෙරිටාස් අධ්‍යක්ෂ ගරු ජූඩ් ක්‍රිෂාන්ත පියතුමා මෙහෙයවූ අතර හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස්, සහයක ගරු ටිරොන් අජිත් පියතුමන් සමඟින් ඒකාබද්ද මීසම් සභාව විසින් සංවිධානය කර තිබුණි.

ඇන්තනි හෙට්ටිආරච්චි



තේවත්ත ජාතික බැසිලිකා සිද්ධස්ථානයේ මහාසිකුරාදා පාදනමස්කාරයෙන් අනතුරුව කුරුසියේ ඇණගැසීම, උකුත්වීම, රංග විලාසයෙන් විශාල පිරිසක් මැද සිදුකැරිණ. ගරු ප්‍රියජයමාන්න, ශ්‍රියන්ත රත්නසේකර පියතුමන්ද තුසිත සහෝදර තුමා සහ පැවිදි සහෝදරියන් පිරිසක්ද සහභාගී වුහ.

සටහන - කේ. ඩී. රුවිරා, සේයා - එච්. ඒ. කල්දේරා

# 'කල්වාරි යාගය' පාස්කු නාට්‍යය මෙදා දෙහිවලදී

**දෙහිවල සා. මරියා මීසම් සේවක ගරු මාකස් ෆර්ඩිනැන්ඩස් පියතුමාගේ ආරාධනය පරිදි, මට්ටක්කුලිය මීසම් සේවක ගරු කැලිස්ටස් ප්‍රනාන්දු පියතුමාගේ අනුමතිය මත 2007 දී ප්‍රථමවරට මට්ටක්කුලියේ රඟදැක්වූ 'කල්වාරි යාගය' පාස්කු දර්ශනය මෙවර දෙහිවල සා. මරියා දෙව්මැඳුරු භූමියේ දී වේදිකාගත විය. මේ සඳහා දෙහිවල මීසම් ජනතාවගේ පූර්ණ සහයොග්‍ය ලැබුන අතර ඔවුන්ගේ මතකයට අනුව අවු. 40 කට පමණ පසු දේවස්ථාන භූමියේ පාස්කු දර්ශනයක් රඟදැක්වූයේ මෙවරය. ගරු ක්‍රිස්ටෝපර් පෙරේරා පියතුමාගේ මඟපෙන්වීම සාර්ථකත්වයට බෙහෙවින් ඉවහල් විය.**

දෙහිවල, ගල්කිස්ස නගරාධිපති ධනසිරි අමරතුංග, ගරු මාර්ක් ප්‍රනාන්දු පැ.තු.නි ප්‍රාදේශාධිපති තුමා ද අවට මීසම් වල මීසම් සේවක පියවරු කීපදෙනෙක්ද, පැවිදි සොයුරියෝද පැමිණ සිටියහ.

මංජු ශ්‍රී රාජපක්ෂ තුන්වන වරට මෙරව ක්‍රිස්තු චරිතය රඟ පෑ අතර අනෙකුත් ප්‍රධාන චරිත අතර වූ පේදුරු ලෙස ඔස්කා ප්‍රනාන්දු, ජුදස් ලෙස ස්ටීවන්, පිලාත් ලෙස ශ්‍රියාන් ද සිල්වා, කයිපාස් ලෙස රංජිත් සෙනවිරත්න, දෙව්මව් ලෙස ශ්‍යාමලි ඩයස් චරිත පණගැන් වූහ. මට්ටක්කුලිය සා. මරියා කලා සංසදයේ සභාපති ඔස්කා ප්‍රනාන්දුගේ මෙහෙයවීම යටතේ එරික් ප්‍රනාන්දු 'කල්වාරි යාගය'පාස්කු දර්ශනයේ අධ්‍යක්ෂ වරයා ලෙස කටයුතු කළහ.



ප්‍රවීනා රවින්ද්‍රන්

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රිස්තු වර්ෂ 2012 මැයි 06 ඉරිදා

# ගිහියා සසුනෙහි නිද්‍රාශීලී යෝධයෙකි ?

ජාතික ගිහි ඉරුදින අදයි. මෙදින මුල්කොට දීප ව්‍යාප්ත වැඩසටහන් ගණනාවක් අන්තර් පදවි හරහා ක්‍රියාත්මක වන බව තතු දත් ආරංචි මාර්ග පවසයි. කතෝලික ගිහියා වෙනුවෙන්ම වෙන්කොට ඇති මෙම දිනය මෙවර සැරසෙන්නේ "දේව වචනය ගිහියාට අභියෝගයක්" යන තේමා පාඨයද මූලික කරගෙන බව එය සංවිධානය කරන ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයට අනුබද්ධ ජාතික කතෝලික ගිහි කොමිසම පවසයි.

සමස්ත සසුන් කෙත තුළ අස්වද්දන දහම් කෙතෙහි එල නෙලන්නෝ ගිහියෝමය. අතලොස්සක් වූ පැවදි පූජක සංඛ්‍යාව හැරුණු විට මුළු මහත් සසුන් කෙතෙහි එලදාව භුක්ති විඳින්නෝ ගිහියෝම වෙති. නමුත් කතෝලික සභාවේ නිදා සිටින යෝධයා කතෝලික ගිහියා යන අන්වර්ථව හඳුන්වමින්ම ගිහියාගේ කාර්ය භාරය ගිහියා විසින්ම අමතක කොට පැහැර හැරීමක් කර ඇති සෙයින් දෝ මෙවර තේමාවන් නම් වී තිබෙන්නේත් "දේව වචනය ගිහියාට අභියෝගයකි" යන්නයි.

සරල ආධ්‍යාත්මික ජීවිත අනුසාරය තුළින් පමණක්ම කතෝලික ගිහියාට සෑහීමකට පත් විය නොහැකිය. නිල පූජකවරය හරහා බෞතිස්ම පොරොන්දු මත එකම පූජක ජනතාවක් බවටත්, ගුරු බලය අත්විඳින පරම්පරාවක් හැටියටත් සිය දූත කාර්යයට මුල පුරන ගිහියා තුළ වර්ධනයේ යහපත් සංකේතාත්මක ජීවිත රටාවක් විනා අන්දෙයක් අපේක්ෂා කළ නොහැකියි. ඒ ජීවිත රටාව වටා විවිධ කථාන්දරයන් ඒකරාශි විය හැකියි. නමුත් දූත සේවාව හා ධර්මදානීය කාර්යයභාරය තුළ පිරිපුන් බවක් හා පෝෂණයක් ලබා ගන්නට ගිහියා එකම නිනව්වකින් සන්නද්ධ විය යුතුයි. එහිදී පැවදි, පූජක පක්ෂයට පා තබන්නට නොහැකි තැන ගිහියා සිය වර්ධනයට එතැන පෝෂිත කළාපයක් බවට පත් කළ යුතුයි. එහිදි මූලිකම සාධකය වන්නේ පවුලය.

නමුත් කතෝලික ගිහියා පෝෂිත කළාපයක් බවට පත් කරගත යුතු "පවුල" වටා ගෙතෙන මෙගා කථාන්දර වටා ඇති අප්‍රිය පුවත් ගැන කන වැටෙන විට ඇති වන ජුගුප්සාජනක සිතිවිලි ගැන නම් කථා නොකරම බැරිය. ගිහි විශ්වාසිකයා ශුද්ධවූ සභාවටද, දයාවේ අභිරහසටද පංගුකාර වූ කෙනෙක් බව අමතක කළ යුතු නොවේ. බෞතිස්ම ආලේපනයෙන් සමස්ත ක්‍රිස්තු දේහයේ අවයවයන් වී රාජකීය. දිවැසිවර හා පූජක ක්‍රියාවලියට බද්ධ වී සභාවේ ක්‍රියාවලිය සමාජය තුළ පණ ගන්වන්නට සිටින කතෝලික ගිහියා තමන් ජීවත් වන පෝෂිත කළාපය අපායක් බවට පත් කරන විට සමස්ත සමාජයට හා සභාවට ගෙන යන්නට ඔහුට හෝ ඇයට යමක් ඉතිරි නොවනු ඇත.

අද සිදු වෙමින් පවතින්නේ එයයි. අතලොස්සක් පමණ වූ පැවිදි පූජක සංඝය වෙතට සියල්ල පවරා දෙමින් තම යුතුකම අමතක කොට ඇති කතෝලික ගිහියා පවුල තුළ ආදරයෙන්, ලෙන්ගතු කමින් හා කැපවීමෙන් පණ ගැන්විය යුතු ජීවිත පැවැත්ම අමතක කොට ඇත. සියලු ගමන් මඟ තම ආත්ම වාසියටයි යන්න දේව වාක්‍යය සේ අත්දකින්නට නොපසුබට වන බවක් වත්මන් ගිහියා තුළින් පෙනෙන්නට ඇති නිසා තමන් අනුගමනය කරන දෙවන පරම්පරාවට හරයාත්මක යමක් දෙවා ලන්නට අසමත් වී ඇති බවක්ද පෙනේ. සභාවේ ධර්මදූත සේවා දැක්මට අත්වැල් සේ ඇති විවිධ සමිති සමාගම් හා සංවිධාන හරහා ආත්මාර්ථය පමණක්ම වපුරන්නට ගිහියා මාන බලන බව පවසන්නේත් අතීතය දෙස ආවර්ජනයක් කරමින්ය.

සමාජයේ නිල බලය, මාන්නය හා තනතුර තුළට එබී බලන ගිහියා අත්වැල අමතක කොට යන ගමනකට අවතීර්ණ වී තිබීමත් ඛේදජනකයි. අද වර්තමාන විවිධ තලයන් වලට තල්ලු වී ගොස් ඇති බොහෝ ගිහි ජීවිත වලින් මෙය හොඳාකාරව පෙනේ. 'දිළින්දන්ගේ සභාවක් උත්පාද කරමු' යන්නට හඬ නඟන ගිහියා පවත්නා බල අධිකාරින්ගේ විතැන් වීම් සමඟ ඒ හඬ ශබ්දයන්ද අඩු වැඩි කොට ඇති බවක් මෑත අතීතය විමර්ශනයෙන් පෙනේ. කොළපාට කණ්නාඩි හැලෙන විට, නිල්පාට කණ්නාඩි වැටෙන විට, රතු පාට කණ්නාඩි විසිවෙන විට එය තම ආත්ම කොට ගත් දේව වචනයක් සේ සලකන්නට පුරුදු වී ඇති සමහර ගිහියන් සභාවේ බැඳීම හා ඇත්වීමටත් එයම නිරූපිත කර ගැනීම හාස්‍යජනක මෙන්ම වේදනාත්මක බවක්ද දිස්කරවයි. එවන් ගිහි ජනතාවගෙන් එල්ලවන ගොඩනංවාලීමේ විවේචන නොව කඩා ඉහිරවීමේ චේතනාව මතම එල්ල කරන විවේචන කර්කශ බවක් ගන්නේත් ඒ නිසාමයි.

'දේව වචනය' ගිහියාට අභියෝගයක් නොව සැබෑ මෙලෙක් තෝතැන්නකට ආ වඩන මෙවලමක්ම විය යුතුයි. ගිහි, පැවිදි, පූජක තුන් ඈඳුතු සංඝ ජීවිත අත්දැකීම බැඳියාව තුළ සවිමත් කරන්නට පැවිදි පූජක අයවළුන්ට වඩා ගිහියා උත්සුක වෙමින් පෙරමුණ ගත යුතුයි. ගිහියා සභාවට ආදරය කළ යුතුයි. සභාව රක්ෂා කළ යුතුයි. සභාව තුළ සාක්ෂි දැරිය යුතුයි. එහිදි බාල, තරුණ, වැඩිහිටි තත්ත්වයන් තුළ පරිණත ක්‍රිස්තු ජීවිතයක වර්ධනයකින් අත්විඳින්නට ලැබෙන ආරාධනාව ගිහියා අමතක නොකළ යුතු බව දැඩිව අවධාරණය කරන්නේ එම නිසාමයි.

භේද භින්නතාවයෙන් කැඩී විසිරී යන සභාවක් නිර්මාණය කරන්නට නොව එකට එකමුතුව ජීව ගුණයක් දසත විහිදුවන දේව වචනයේ සැබෑ පන්නරයෙන් ඔද වැඩුනු සභාවක සැබෑ අවයවයන් වන්නට ගිහි ජනතාව පෙරමුණ ගත යුතු බව මතක් කරන්නේ ඒ දේව සංඝය ශුද්ධාත්ම මාලිගයද වන බවත් පසක් කරමිනි.

අදට යෙදෙන ජාතික ගිහි ඉරුදින නිමිත්තෙන්
ජාතික කතෝලික ගිහි කොමිසමේ සභාපති බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දිසනි හිමි සමග පිළිසඳරක්.

# දේව වචනය ගිහියාට අභියෝගයක් !



**උත්ථාන සමයේ පස්වැනි ඉරුදින ජාතික ගිහි ඉරුදින ලෙස කතෝලික රදගුරු සම්මේලනය මඟින් ප්‍රකාශයට පත්කර තිබේ. මැයි මාසයේ 06 ඉරුදින මේ අනුව ජාතික ගිහි ඉරුදිනයයි. කතෝලික සභාවේ නිදා සිටින යෝධයා යැයි විරුදාවලි ලත් 'කතෝලික ගිහියා' වෙනුවෙන් වෙන්කළ මේ ගිහි ඉරුදින ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයට අනුබද්ධ ජාතික කතෝලික ගිහි කොමිසම මඟින් සංවිධානය කරනු ලබයි. ජාතික ගිහි කොමිසමේ සභාපති බදුල්ල රදගුරු අතිඋතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි හිමිපාණන් සමඟ පැවැත්වූ සාකච්ජාවක් ඇසුරින් මේ ලිපිය සැකසේ.**

*ප්‍රශ්නය - ජාතික ගිහි ඉරුදින යනු කුමක්ද?*
රදගුරු හිමි - ජාතික ගිහි ඉරුදින මෑතකදී ආරම්භ වූයේ ගිහි ජනතාවගේ ඕනෑ එපාකම් සපුරාලන ගිහි උදාසීනත්වය තුරන්කර ගිහියාගේ ලෝකයේ හා සභාවේ බාරදූර කාර්යභාරයන් ඉස්මතු කිරීමටයි. මේ ඔස්සේ කටයුතු කිරීමට ජාතික ගිහි ඉරුදින අවස්ථාවක් කරගන්නට සභාව උත්සුක වී සිටිනවා.

*ප්‍රශ්නය - ගිහි ඉරුදින අරමුණු මොනවාද?*
රදගුරු - මිදිවැල මමය. ඔබ එහි අතුය කියා පැවැසු ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සභාවේ සම්බන්ධතාවය ගැන අපූරුවට පැහැදිලි කරදී තිබෙනවා. මෙය මගින් ගිහියා කවුදැයි යන්නට ඉතා පැහැදිලි පිළිතුරක්ද ලැබී තිබෙනවා. ගිහියාගේ උතුම් භාවය එමගින් පැහැදිලි කරදී තිබෙනවා. ස්වාමින් වහන්සේ හා ගිහියා අතර සම්බන්ධතාවය කාටවත් කඩා දැමිය නොහැකි ගැඹුරු දෙයක්. එය සැබැවින්ම අභිමානයක්. සෑම කතෝලිකයකුම බෞතිස්ම ස්නාපනයෙන් හා අභිවෘද්ධි ආලේපයේ සක්‍රමේන්තු වලින් මේ අභිමානයේ ගරුත්වයට ඔසවනු ලබනවා.

දෙවන වතිකාන කතිකාවෙන් විසි වසරකට පසු ගිහියාගේ කැඳවීම හා ධර්මදූත සේවාව අළලා රදගුරු සංසදයක් අතිඋත්තම දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමන් විසින් කැඳවන ලදී. විවිධ රටවලින් පැමිණි ගිහි පිරිමි හා කාන්තා නියෝජිත අදහස් පදනම් කරගෙන 'ක්‍රිස්තු භක්තික ජනතාව අතර ගිහියෝ' මැයෙන් අනුශාසනා පත්‍රයක් 1988 දෙසැම්බර් 30 දා නිකුත් කළා. එමගින් අද යුගයට ගැලපෙන පරිදි දෙවන වතිකාන මන්ත්‍රණ සභා ඉගැන්වීම් පැහැදිලි කළා. මෙහි දී විශේෂ අවධානයක් යොමු කැරුණේ ගිහියාගේ සුවිශේෂි කැඳවීම රඳා පවතින්නේ මේ ලෝකය තුළ බව ඉස්මතු කරන්නටයි. ඔබත් මාගේ මිදි වත්තට යන්න කියන ආරාධනය ගිහියාට ලබාදෙන පණිවුඩයක්.

ගිහි විශ්වාසිකයා යනු ශුද්ධවූ සභාවටද - දයාවේ අභිරහසටද පංගුකාරවූ කෙනෙක්. ඔහු ප්‍රසාද ස්නාපනයෙන් ක්‍රිස්තු දේහයේ අවයවයක් වී, රාජකීය, දිවැසිවර හා පූජක ක්‍රියාවලියට සහභාගි වෙමින් සභාව තුළ කටයුතු කරමින් කිතුනු බව ලෝකයට රැගෙන යයි. මේ නිසාම මානව සමාජයේ ප්‍රාණ නාලිය ගිහියායි. ඔහු සභාවට අයත්වන අතර සභාව යනු ඔහුම බව සගසැපත් අතිඋත්තම දොළොස්වන පියුස් ශුද්ධෝත්තම පියතුමා ප්‍රකාශ කළා. සැබෑ මිදිවැල වන ස්වාමින් වහන්සේට ඒකාබද්ධවී සඵලත්වය උන්වහන්සේගෙන් ලබාග නී. ගිහියාගේ වටිනාකම ගැන කතාකරන අතිඋත්තම නිවුමන් කාදිනල් හිමිපාණෝ ගිහි ජනතාවට සම්බන්ධ නොවන පූජකවරය විහිළුවක් බැව් අවධාරණය කරයි.

**අතිඋත්තම දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමන් විසින් විවිධ රටවලින් පැමිණි ගිහි පිරිමි හා කාන්තා නියෝජිත අදහස් පදනම් කරගෙන 'ක්‍රිස්තු භක්තික ජනතාව අතර ගිහියෝ' මැයෙන් අනුශාසනා පත්‍රයක් 1988 දෙසැම්බර් 30 දා නිකුත් කළා. එමගින් අද යුගයට ගැලපෙන පරිදි දෙවන වතිකාන මන්ත්‍රණ සභා ඉගැන්වීම් පැහැදිලි කළා. මෙහි දී විශේෂ අවධානයක් යොමු කැරුණේ ගිහියාගේ සුවිශේෂි කැඳවීම රඳා පවතින්නේ මේ ලෝකය තුළ බව ඉස්මතු කරන්නටයි. ඔබත් මාගේ මිදි වත්තට යන්න කියන ආරාධනය ගිහියාට ලබාදෙන පණිවුඩයක්.**

*ප්‍රශ්නය - ගිහියා නිදාසිටින - නිදි කරවා ඇති අකර්මන්‍ය සියල්ලට හිස නැමිය යුතු බලවේගයක්ද?*
රදගුරු හිමි - ජාතික ගිහි ඉරුදින එක් අරමුණක් වන්නේද ගිහි උදාසීනත්වය තුරන් කිරීමයි. සභාවේ බහුතරය ගිහියායි. සංඛ්‍යාත්මකව බැලුවොත් 99% වැඩි පිරිසක් ගිහි ජනතාවයි. ඇත්තෙන්ම පූජකවරය තිබෙන්නේ ගිහි ජනතාව වෙනුවෙනුයි. ගිහියා නැතිනම් පූජකවරයෙන් පලක් නැහැ. ගිහි ජනතාව ශුද්ධවත් කිරීම පූජක වගකීමයි. පූජකවරුන්ගෙන් සභාව බලාපොරොත්තු වන්නේ ඒ වගකීම හා යුතුකමයි. එසේ නැතිව තම තමන්ගේ ආත්ම ගලවා ගැනීමෙන් පමණක් සෑහීමකට පත්වෙන්න පූජකවරුන්ට හැකියාවක් නැහැ. ක්‍රිස්තුන් වහන්සේ වගේ ගිහි ජනතාව දෙවි පියාණන් වහන්සේ වෙතට ළං කරන්නට කටයුතු කිරීම පූජක දූත මෙහෙවරේ වගකීමයි.

*ප්‍රශ්නය - එසේනම් ගිහි කැඳවීම වන්නේ කුමක්ද?*
රදගුරු හිමි - ඇත්තෙන්ම ශුද්ධවන්ත භාවයයි. මෙය

15 පිටුවට »

සාකච්ඡා කළේ : ශිරාන් මෛත්‍රී

## කැමිලස්ගේ — තිත්ත ඇත්ත



## මීසමෙන් මීසමට

# වාද්දුවේ පසන් ගායනා

පසන් ගායනා වාද්දුවේ නූතන පරපුරට දායාද කරනු වස්, වාද්දුව කිතුනු එකමුතුව අත්පොත්වල පසන් මුද්‍රිත පොත් වශයෙන් පිළියෙල කොට තරුණ පරපුර ලවා පසුගිය චතාරික සමයේ ඒවා ගායනා කරවිය.


පසුගිය චතාරික සමයෙහි ශබ්ද වාහිනි යන්ත්‍ර පාවිච්චි කොට ඒවා ග්‍රාමය තුළ ප්‍රචාරය කළ අතර, මෙය කිතුනු ජනතාවගේ මහත් ප්‍රසාදයට ලක්ව ඇත.

පී. බර්නාඩ් විල්ෆ්‍රඩ් ප්‍රනාන්දු



සලාපුර රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්දිස් රදගුරු හිමිපාණෝ නාත්තන්ඩිය ලූර්දු දේවමාතා සිද්ධස්ථානයට අයත් දේවස්ථානවල සැදැහැවතුන් බැහැදැකීමට පැමිණියහ. එහිදී උන්වහන්සේ ඔවුන් සමඟ සුහද කථාබහකට එක්වෙමින් යෝජිත කතිකාව ගැන දැනුවත් කිරීමක්ද මීසමේ සැදැහැවතුන්ගේ දුක් කම්කටොලු මීසමේ අඩුපාඩු සංවර්ධනය ගැන විමසා බැලීමටත්, නාතිවූ බැටළුවන් සොයා ගොස් ඔවුන් පෝෂණය කරන්නේ කෙසේද යන්න විමසීමටත් අමතක නොකළහ. නාත්තන්ඩිය මීසම් සේවක ගරු උපාලි චර්චිල් පියතුමා කථා කළ අයුරු.

ශ්‍රියාංගණී ෆිලීෂියා



නොබෝදා පූජකවරය ලැබූ ගරු දුලිප් කමල් සමරතුංග පියතුමා සිය ප්‍රථම දිව්‍ය පූජා මෙහෙය නායකකන්ද සා. මරියා දෙව්මැඳුරේ දී පැවත් වූ අතර එතුමන් දෙව්මැඳුර වෙත කැඳවාගෙන ගිය අවස්ථාව. නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක නවක පියතුමාගේ පියා ජූලියන් සමරතුංග මහතා සහ මව ශීලා පොන්සේකා මහත්මියද මෙහි වෙති.

නිමල් පෙරේරා

# දේව දයාවේ මංගල්ලය කලමුල්ලේ

අන්තිම රාත්‍රී භෝජනේ දී තම ගෝලයන්ගේ පාද සෝදා සිප ගැනීමෙන් ද තමන් මරණයට පත්කළ ජුදයන්ට කුරුස ගසේ සිට සමාව දෙමින්ද ජේසු සමිඳාණන්, දෙවිඳුන්ගේ දේව දයාව ලොවට ප්‍රකාශ කළ බව කළුතර දහම් සෙවණ දෙව්සත්හලේ උපඅදියුරු ගරු ප්‍රගීත් චාමර පියතුමා කටුකුරුන්ද ශාන්ත පිලිප්නේරි දෙව්මැඳුරේ පැවති දේව දයාවේ මංගල්‍ය මෙහෙයේ දී පැවසීය.

කළමුල්ල මීසම් සේවක ගරු මොරිස් නාමල් පියතුමාගේ අනුශාසකත්වය යටතේ පස්වන වතාවටත් පැවැති මේ යාගයට සහයක ගරු රුවන්ත කුමාර පියතුමා ද සහභාගි විය.

සඳමාලි සිල්වා



දළුපත සා. අන්තෝනි සිද්ධස්ථානයේ සහ දළුපත වේලන්කන්නි ආරෝග්‍ය මාතා දේවස්ථානයේ තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයන් මගින් ප්‍රථමවතාවට ව්‍යාපාරික ප්‍රජාවගේ හා ග්‍රාම වාසින්ගේ සහයෝගය ඇතිව සංවිධානය කළ බක්මහ උලෙළ දළුපත සා. අන්තෝනි සිද්ධස්ථාන පරිශ්‍රයේදී පැවත් වුණි. දළුපත මීසම් සේවක හා දිසා නායක අතිගරු ජූලියස් ක්‍රිස්ටෝපර් සහ සහයක ගරු සජිත් අරුණ පියතුමාගේ මඟපෙන්වීම, උපදෙස් හා සහභාගිත්වයද ලැබී තිබුණි. එහිදී කුමරිය තේරීමේ තරගයෙන් අවුරුදු කුමරිය ලෙස අභිෂේක ලැබූ දිලිණි දේශානි (මැද) දෙවන ස්ථානය දුලාංජී ධනුෂ්කි (දකුණ) තෙවන ස්ථානය සුරම්‍යා (වම)

පමුණුගම පිහිටා ඇති ඥානම් වැඩිහිටි නිවාසයේ සිංහල අලුත් අවුරුදු උත්සවය දයාවේ පැවිදි සොයුරියන් විසින් පවත්වනු ලැබීය. චිරාගත සම්ප්‍රදායක් වන කිරි ඉතිරවීම ගරු නදීෂා පැවිදි සොයුරිය සිදුකළ අයුරු.

එස්. කේ. ජේ. කුරේරා





නවක පූජක පුත් ගරු දිනේෂ් ප්‍රශාන් අප්පුහාමි පියතුමා සිය කුළුදුල් දිව්‍ය යාගය කඳවල වික්ෂෝප මාතාවන්ගේ දෙව්මැඳුරේදී පැවැත්වීම සඳහා පෙරහරින් කැඳවාගෙන පැමිණෙන අයුරු. දකුණු කොළම කලාපීය නාහිමි අතිගරු ඇන්ටනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමා, මීසම් සේවක ගරු සරත් තිරිමාන්න පියතුමා, සහයක ගරු එරික් මදුරාවල පියතුමා, මීසමෙන් බිහිවූ ගරු පියතුමන් පැවිදි සොයුරු සොයුරියන් ඇතුළු විශාල පිරිසක් මෙම අවස්ථාවට එක්වූහ.

සිසිල් ඩැනීසියස්



ජා-ඇල නවක පූජක පුතු ගරු කසුන් ඉෂාර ප්‍රනාන්දු පියතුමන්ගේ කුළුදුල් දේව මෙහෙය ගරු මර්ල් ශාන්ත හා ගරු හියුගෝ පලිහවඩන පියතුමන් සමඟ පැවැත්විය. මීසම් සේවක ගරු ග්‍රෙගරි ජයන්ත ප්‍රනාන්දු පියතුමාගේ මඟපෙන්වීම යටතේ මෙය සංවිධානය කර තිබූ අතර මේ අවස්ථාවට හිටපු මීසම් සේවක ගරු සාගර හෙට්ටිආරච්චි පියතුමන් සමඟින් ගිහි පැවදි විශාල පිරිසක් සහභාගි වූහ.



වැලිගම්පිටිය මීසමේ 09 වන පූජක පුතු ගරු අසිත නිරංජන ප්‍රනාන්දු පියතුමාගේ කුළුදුල් දේව මෙහෙය වැලිගම්පිටිය සා. ආනා දේවස්ථානයේදී ගරු එක්ස්පෙඩිටස් ජයකොඩි පියතුමා ඇතුලු තවත් පියතුමන් සමගින් පැවැත්වුනි. මීසම් සේවක ගරු ශ්‍රිලාල් ෆොන්සේකා පියතුමන්ගේ මඟපෙන්වීම යටතේ මෙය සංවිධානය කර තිබූ අතර මේ අවස්ථාවට ගරු ජයශාන්ත සෝවිස් පියතුමන් ඇතුලු මිසමේ පූජක පුතුන් හා පැවිදි සොහොයුරියන් සමඟින් විශාල පිරිසක් සහභාගිවූහ.

# රුවන්වැල්ල සා. ආනා දෙව්මැඳුර



මේ දෙව් මැඳුර රුවන්වැල්ල නගරයට ආසන්න මොරාවත්ත ග්‍රාමයේ පල්ලි ඕවිට නම් ඉඩමේ පිහිටා ඇත. ඉඩම පරිත්‍යාග කර ඇත්තේ නානායක්කාර වසම් දොන් පෙරේරා මහතා විසිනි. රුවන්වැල්ලේ සිට වේයන්ගොඩ දක්වා මාර්ගය වැටී ඇත්තේ මේ දෙව් මැඳුර ඉදිරිපසිනි. ආරම්භයේදී කිතුනු පවුල් 700 ක් පමණ වාසය කර ඇත.

මුලදී තාවකාලික මඩුවක ආරම්භ කරන ලද දෙව් මැඳුර බෙල්ජියම් ජාතික පරිත්‍යාගශීලින්ගේ ආධාරයෙන් ඉදිකරනු ලැබිණ. පසුව බ්‍රිතාන්‍ය ජාතික වැවිලිකරුවන් වෙළඳුන් හා සාමාන්‍ය ජනතාවගේ ආධාරයෙන් වැඩිදියුණු කෙරිණ. කෑගල්ල මීසම් සේවක ගරු තියඩෝර් නියුම ජේ.නි. පියතුමා මේ දෙව් මැඳුර ඉදිකිරීමට පුරෝගාමී විය.

පුදබිමක අසිරිය

1907 සැප්තැම්බර් 11 දින ගාල්ල රදගුරු අතිඋතුම් ජෝශප් වැන්රිත් හිමිපාණන් අතින් ආසිරිගැන්විය. 1917 වාද්දුවේ සිට පැමිණි මාන්න මරක්කලගේ හෙන්රි කුරේ මහතා මේ දෙව් මැඳුරේ භාරකරු ලෙස කටයුතු කළේය.

ගරු ඩඩ්ලි අත්තනායක පියතුමා යටියන්තොට මීසම් සේවක හැටියට කටයුතු කළ කාලයේ දෙව් මැඳුරේ මොගොප්පුව ඉදිකරවන ලදි. යටියන්තොට මීසමට අයත්ව තිබූ දෙව්මැඳුර 1987 දී දෙහිඕවිට මීසමට පවරා දෙනු ලැබිණ. මීසම් සේවක ගරු ටෙන්සින් පෙරේරා පියතුමා දෙව් මැඳුර වටා තාප්පයක් ඉදිකළේය. කිතුනු පවුල් 70 කින් පමණ මීසම සමන්විය. මෙම දෙව්මැඳුරේ සියලු දිව්‍ය පූජා සිංහල හා දෙමළ බසින් පැවැත්වීම විශේෂත්වයකි.

එඩ්වඩ් කුමාරගම

## වෙන්නප්පුව මංගල්ලය මෙවර මැයි 12, 13

වෙන්නප්පුව ශු. ජුසේ මුනි මංගල්‍යය මැයි 12 සහ 13 පැවැත්වේ.

වෙන්නප්පුව මීසම් සේවක ගරු ප්‍රෑන්ක් තිසේරා පියතුමන්ගේ උපදේශකත්වයෙන් සහයක ගරු සුනිල් ශාන්ත සහ පැතුම් නිර්මාල් පියතුමන්ගේ සහභාගිත්වයෙන් සේවක මණ්ඩලය මංගල කටයුතු සංවිධානය කරති.

ප්‍රියන්ත පීටර්ස්

## වහකෝට්ටේ පුරා වස්තු ප්‍රදර්ශනයට

වහකෝට්ටේ ශුද්ධවූ අන්තෝනි මුනිඳුන්ගේ ජාතික සිද්ධස්ථානයේ වසර 300 කට වඩා පැරණි සුරුවම් ඇතුලු පෞරාණික භාණ්ඩ බැතිමතුනට දැක බලාගැනීම සඳහා විශේෂ කුටියක තැම්පත් කරන ලදි.

වහකෝට්ටේ මීසම් සභාවේ අදහසක් අනුව සිද්ධස්ථාන පාලක ගරු යොවාන් සවරිමුත්තු පියතුමන්ගේ පූර්ණ අනුග්‍රහයෙන් මෙය සිදුකෙරිණ.

පෝල් ඒකනායක

## ලේ දන්දීමක්

කටුගස්තොට ශ්‍රී හෘදයේ දේවස්ථාන තරුණ කැල ලේ දන්දීමේ කඳවුරක් මීසම් ශාලාවේදී පස්වන වරටත් දියත් කළහ.

මේ අවස්ථාවට නාවලපිටිය රෝහලේ වෛද්‍යවරුන් සහ හෙද කාර්ය මණ්ඩලයේ පූර්ණ සහයෝගය ලැබිණි. මෙදින ලේ පයින්ට් 48 ලබාගැනීමට හැකිවිය.

ශාන්ති ජම්බුගේ



කැපුන්ගොඩ මීසමේ නව පූජක පුතු ගරු සමිඳු පැතුම් ජනිත පියතුමා කුළුදුල් දිව්‍ය යාගය පැවැත්වීමට සා. අන්තෝනි දෙව්මැඳුරට පැමිණි අවස්ථාවේ මීසම් සේවක ගරු ක්ලෝඩ් වනසිංහ පියතුමා සමඟ මීසම් ජනතාව පිළිගෙන නව පියතුමාගේ ආදර දෙමව්පියන් සමඟ දෙව්මැඳුරට කැඳවාගෙන පැමිණි අයුරු.

බෙන්ජමින් කිරිහෙට්ටි



බටගම ගරු දිනුෂ් ගයාන් වින්ස්ටන් හා ඇන්ටන් සුධාරක වීරසිංහ පියතුමන්ගේ කුළුදුල් දිව්‍ය යාගය බටගම දේවස්ථානයේදී එකවර පැවැත්විය. මීසම් සේවක ගරු නිශාන් විලත්ගමුව පියතුමා ඇතුලු මීසම් සංඝය පිළිගැනීමෙන් අනතුරුව පෙරහරින් කැඳවාගෙන එන අයුරු.

චින්තක ද මැල්

# දුටිමි සැබෑ බැටළු ගාලක්, එහෙත්...



**පසුගිය දින කීපයකට ඉහත සෞදි කාන්තාරය මැදින් ගමන් කරද්දී, බැටළු ගාලක් අසළ මා නැවතුනි. මගේ සිත එකවරම ඇදී ගියේ ශුද්ධවර ජුවාම් සුවිශේෂයේ 10 වෙනි පරිච්ඡේදය වෙතටයි.**

මෙය මහ පරිමානයේ සිදුවන අරාබිකරයේ සුල්තානවරයකුට අයිති ගොවිපලකි. බැටළුවන්ට අමතරව, එළුවන්ද, ඔටුවන් ද, කොටළුවන් කීප දෙනෙක් ද, සුනඛයන් දෙදෙනෙක් ද එහි සිට මගේ නෙත ගැටුනි. මෙවැනි ගොවිපලවල් කීපයක් මෙම කාන්තාරයේ තැනින් තැන ඇති බවක් දැනගැනීමට ලැබුණි.

මෙම ගොවිපලේ එඬේරුන් වූයේ ඉතියෝපියාන ජාතිකයන් දෙදෙනෙකි. බැටළුවන් දහසකට අධික ප්‍රමාණයක් බලා කියා ගැනීම මෙම ඉතියෝපියාන ජාතිකයන්ගේ වගකීම වේ. ඔවුන් දෙදෙනාගේ නවාතැන වූයේ ගාල අසළ ම නවතා තිබූ අඩි දහයක දිගකට අඩු ටකරමින් නිම වූ කන්ටේනරයකි. එහි එක් කොටසක් ආහාර පිසගැනීමේ කටයුතු සඳහා භාවිත කරන බව පෙනේ. දැනට වසර දහයකට අධික කාලයක් නොකඩවා මෙහි සේවය කරන බව ඔවුන් සමඟ කළ කථාවෙන් හෙළිදරව් විය.

හිමිදිරි උදයේ කොටළුවා පිට නැග ගත් එක් එඬේරෙක් ගාලේ සිටි පිරිමි බැටළුවන් පමණක් ඇත කාන්තාරයට කැඳවාගෙන යාමට ලහි ලහියේ සූදානම්වන බව පෙනේ. එය සතුරු හමුදාවන්ට මුහුණ දීමට සැරසෙන හමුදා භට කංඩායමක් විලසින් දිස්වේ. මෙම චාරිකාව මෙම සතුන්ගේ දෛනික ජීවිතයේ එක් කොටසක් බවට පත්වී හමාරය. උන්ගේ ආරක්ෂාව සඳහා පෙර සඳහන් කළ සුනඛයන් දෙදෙනා පසුපසින් ගමන් අරඹයි. එය මෙම සිද්ධියේ එක් දර්ශනයක් පමණි.

ඉතිරි වූ එඬේරා ගාලේ සිටින ගැහැනු බැටළුවන් සහ කුඩා සතුන්, එළුවන් හා ඔටුවන්ට කෑම සැපයීම සාත්තු සප්පායන් කිරීම අවශ්‍ය බෙහෙත්හේත් ලබා දීම වැනි කටයුතුවල යුහුසුළුව ක්‍රියාත්මක වේ. දෛනිකව සැපයිය යුතු බෙහෙත් වට්ටෝරුවක් මතකයේ තබාගෙන ඉතා සීරුවෙන් කාර්යයේ නියැලී සිටින්නේ නොවැම්බර් සිට අප්‍රියෙල් මස මුල දක්වා මෙම කාන්තාරයට දැනෙන අධික ශීතල ගැන ද කිසිදු තැකීමකට නොගෙනය.

යකඩදැල් සහ තහඩු කැබැලි වලින් තාවකාලිකව ඉදි වී ඇති ගාල තුළ බැටළුවන්ගේ කලබලකාරී හැසිරීමත්, බොහෝ විට ඌරන්ට හිමි පාටත් නිසාම එම කාර්යයේ දී ඔහුගෙන් සිදුවන වැරදි අපමණය. සීමිත ඉඩ ප්‍රමාණයක් තුළ සතුන්ගේ අපද්‍රව්‍යය, දුගඳ, ඉහළට යොමුවන දූවිලි ද විඳ දරා ගැනීමට මෙම එඬේරා පුරුදු වී ඇත. විශාල සතුන්ගේ පාද වලට පෑගි තුවාලවන කුඩා සතුන් ගැන සෙවීමට, කරදරවීමට ඔහු තුළ සැබෑ වූ කැක්කුමක්, අවශ්‍යතාවයක් තිබුණා ද යන්න කරන කාර්යයෙන් නම් මම නොදුටුවෙමි. එක් අතකින් ඔහු කුලීකාරයෙකි.

"මම යහපත් බැටළු එඬේරා වෙමි. යහපත් එඬේරා තම ජීවිතය බැටළුවන් උදෙසා පූජා කරන්නේ ය. එඬේරකු නොවන එසේම බැටළුවන්ගේ අයිතිකරු නොවන කුලීකාරයා වෘකයා එනු දැක බැටළුවන් හැර දමා පලා යන්නේ ය. ඔහු පලා යන්නේ ඔහු කුලීකාරයකු වන නිසාත් බැටළුවන් ගැන සැළකිල්ලක් ඔහුට නැති නිසාත් ය" (ජුවාම් 10:11-13)

ශුද්ධවර ජුවාම් සුවිශේෂකවරයාට අනුව සැබෑ එඬේරා තුළ දකිනා කැපවීම පිළිබඳව සැබෑ ආදරයක් සැබෑ දයාවක් පිළිබඳ ඒත්තු ගැන්වීමට ඉහත කරුණු ප්‍රමාණවත් ය.

"දොරටුපාලයා ඔහුට දොර හරියි. බැටළුවෝ ඔහුගේ කටහඬ අඳුනති. ඔහු තමාගේම බැටළුවන් නම් කියා අඬගසා උන් පිටතට ආ විට උන්ට පෙරටුව යයි. බැටළුවෝද ඔහුගේ කටහඬ අඳුනන බැවින් ඔහු පසු පස යති. (ජුවාම් 10:3-4).

අප බොහෝ විට සැබෑ එඬේරා තවමත් හඳුනාගෙන නැත. සුවිශේෂකවරයා පුන පුනා කීමට උත්සාහ කරන අර්ථය වචනවලට සීමා වී ඇත. එය හරිහැටි වටහා ගැනීමට අපට නොහැකි වී ඇත්තේ අදටත් අප බොහෝ දෙනා මිරිඟුවක් පසුපස ගාල කඩාගෙන දුවන, බැටළුවන් නිසාදෝ යැයි සිතේ. ලෞකිකත්වය තුළ පුහුවන්දනා ගමනක යන වත් පිළිවෙත් පමණක් සිදුකරන වන්දනා ගමනක යන නඩයක් පමණි.

ශීතල එන්න එන්න වැඩි බවක් දැනුණි. බිම් කළුවර වීමට ඇත්තේ තව හෝරා කීපයක් පමණි. එක්විට ඇසුනු විශාල ඝෝෂාකාරී ශබ්දයෙන් මා තැතිගැනුණි. ඒ අන් කිසිවක් නොව හිමිදිරියේ කාන්තාරයේ ඈතට ගිය බැටළුවන් ඉතා වේගයෙන් ගාල වෙත එන හඬය, එය එක්තරා ආකාරයක සුළි සුළඟක ස්වරූපයකි. ඒ ආ බැටළුවන් ආහාර ගැනීමෙන් පසු උන්ව ගාල වෙත යොමු කිරීමට සැරසෙයි. ඉන් අනතුරුව දොරටුව වසා දැමූ එඬේරා එහි ආරක්ෂාව සුනඛයන් වෙත පවරා දැත් සෝදා ගන්නේ එදා පෝන්සියු පිලාත් ජේසු නසරේනු මරණයට තීන්දු කර ඉන්පසු සිදු කළ ක්‍රියාව විලසිනි.

"ඒකාන්තයෙන් මම ඔබට කියමි. බැටළුවන්ගේ දොරටුව මමය. මට පළමුව ආ සියල්ල සොරු ද කොල්ල කන්නෝ ද වෙති. බැටළුවෝ ඔවුන්ට ඇහුම්කන් නුදුන්හ. දොරටුව මම"ය (ජුවාම් 10:74).

> **සැබෑ එඬේරා බැටළුවන්ගේ ආරක්ෂාව කිසිදු අයුරින් පැවරීමක් නොකරයි. දිවා රාත්‍රි දෙකේම තම ජීවිතය පරදුවට තබා ආරක්ෂාව සපයා දෙයි. එහෙත්, එවැනි එඬේරුන් අද ඇද්ද? විශ්වාසය, ආරක්ෂාව, ලෞකිකත්වය තුළ රජකම් කරයි. "මගේ" යන හැඟීමෙන් අප බොහෝ විට කටයුතු කරයි. අපේ නොවන සැම කෙනෙකුගේම ආරක්ෂාව පිළිබඳ අත සෝදා ගැනීමට පුරුදු වී හමාරය.**

සැබෑ එඬේරා බැටළුවන්ගේ ආරක්ෂාව කිසිදු අයුරින් පැවරීමක් නොකරයි. දිවා රාත්‍රි දෙකේම තම ජීවිතය පරදුවට තබා ආරක්ෂාව සපයා දෙයි. එහෙත්, එවැනි එඬේරුන් අද ඇද්ද? විශ්වාසය, ආරක්ෂාව, ලෞකිකත්වය තුළ රජකම් කරයි. "මගේ" යන හැඟීමෙන් අප බොහෝ විට කටයුතු කරයි. අපේ නොවන සැම කෙනෙකුගේම ආරක්ෂාව පිළිබඳ අත සෝදා ගැනීමට පුරුදු වී හමාරය.

අත්සෝදා ගත් එඬේරා තමන් නිසා අතහැරුණු අතරමංවූ බැටළුවන් සොයා යාමට කොටළුවා පිට නැවත නැගී ඈතට යන බව දුටිමි.

"ඔබ අතුරෙන් බැටළුවන් සීයක් ඇති කවර මනුෂ්‍යයෙක් උන්ගෙන් එකෙකු නැතිවුවහොත් අනූනව දෙනා පාළුකරයේ හැර දමා නැති වූ එකා පසු පස්සේ ගොස් ඌ සම්බ වන තුරු සොයන්නේ නැද්ද? ඒ බැටළුවා සම්බ වූ විට ඔහු ප්‍රීතියෙන් ඌ කර තබාගෙන ගෙදර අවුත් මිතුරන් ද අසල්වැසියන් ද කැඳවා ප්‍රීතිවන්න; මාගේ නැති වූ බැටළුවා ආපසු සම්බ වී ඔවුන්ට කියයි..... (ලූක් 15:1-6).

ලූක් සුවිශේෂකවරයා සඳහන් කළ අයුරු අනූනවය අතහැර නැතිවූ බැටළුවා සොයා ප්‍රීතියෙන් ඌ කරේ තියා එන දර්ශනය වෙනුවට මා දුටුවේ හිස් ඇතින් ඉතා සුළු වේලාවකින් බලාපොරොත්තු කඩ වී ගාලවෙත කොටළුවා පිට එන එඬේරා ය. අද විශාල බැටළු සංඛ්‍යාවක් නැති වී ඇත. ඔවුන් සොයා යාමට එඬේරුන් දක්වන ආකල්ප සීමිතය. කීර්තිය, බලය, තත්වය, පුහුමාන්නය. මිලමුදල් මනාපය යන කරුණු කොහේදෝ සිට ඇවිත් හරස් වී ඇත. ඒත් එක් අතකින් නිවැරදිව අත්පුඩි ගැසිය නොහැකිය. බැටළුවන් අතරේ ද සමගිය සමාදානය උපකාරය ලැදියාව, එකමුතුකම කොයිබට හෝ හඹා ගොස් ඇති බව එක හෙළා පිළිගත යුතුය.

සුවිශේෂකවරයා හුවා දක්වන සැබෑ එඬේරා යන සංකල්පය වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම නිවැරදිය. ඔහු තුළ ඇත්තේ අසීමිත ආදරයත් අසීමිත සමාවදීමත් ය.

චතාරික සමය තුළ "කුරුසිය ගමන" සිහිකිරීමේදී සැබෑ එඬේරා පවසන යථාර්ථය සුභ ආරංචියක් ගෙන යන ඔබටත් මටත් මහත් අත්වැලක් වේවි. එනම් "අබ්බා" පියා අපේ පියාණෝ බව අපි. ඔවුන් වහන්සේගේ ආදර දරුවන් බව - අප අවට සිටින සියල්ලන් අපේම සහෝදර සහෝදරියන් බව.

දෙදිනක් කාන්තාරයේ ගතකර ආපසු එන අතරතුර මෙම යථාර්ථය මා තුළ තැන්පත් වීමට අවශ්‍ය ශක්තිය ඉල්ලා කීපවිටක් "අබ්බා" පියා ඇමතුවෙමි.

**එමිල් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු**
කුලියාපිටිය

---



සභා පියවරු 33 කොටස

**මහාචාර්ය ඇන්ටන් මීමන විසිනි**

## සභා පියවරුන්ට අනුව කතෝලික සභාව යනු කුමක්ද? - 2

මිනිස් ජීවිතයේ සෑම අභියෝගයක්ම තේරුම් ගැනීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට කතෝලික සභාව ආරම්භයේ සිටම ප්‍රයත්න දරා ඇත. කිතුනු ඇදහිල්ලට කිසිම දෙයකින් පලා යා නොහැකිය. එමෙන්ම කිතුනු ඇදහිල්ල විසින් ඉදිරිපත් කරන අභියෝග ඉදිරියේ ද කිසිම දෙයකට පලා යා නොහැකිය.

ලොව ඇති කිසිම ප්‍රශ්නයකට ක්ෂණික විසඳුම් ඇදහිල්ල තුළ අඩංගු නොවේ. එහෙත් ලොව ඇති ඕනෑම ප්‍රශ්නයකට විසඳුම් ඇදහිල්ලේ ආධාරය සමඟ ගවේෂණය කළ හැකිය. ඇදහිල්ලට සෑම දෙයක්ම අදාළය. මානව ජීවිතයේ සෑම පැතිකඩක්ම ක්‍රිස්තියානි ඇදහිල්ලේ දෘෂ්ටි කෝණයෙන් තේරුම් ගැනීමට ප්‍රයත්න දැරීම කිතු දහමේ ආරම්භයේ සිටම දකින්නට ඇති දෙයකි. ඇදහිල්ල යනු උදාසීන, ඇල්මැරුණු, අප්‍රාණික දෙයක් නොව එල දැරිය යුතු දෙයකි.

යුද්ධය සාධාරණීය කළ හැකිද? රාජ්‍යයක මූලික වගකීම කුමක් ද? දුප්පත් පොහොසත් පරතරයට හේතුව කුමක් ද? සමාජ සමානාත්මතාවය ඇති කළ හැක්කේ කෙසේ ද? විශ්වයේ අවසානය කුමක් ද? කාලය සහ අවකාශය යනු කුමක් ද? විවාහය, ලිංගිකත්වය, ගබ්සාව යනු කුමක් ද? සංගීතය යනු කුමක් ද? අධ්‍යාපනයේ පරමාර්ථය කුමක් ද? දේශපාලනය සහ දේව රාජ්‍යය අතර ඇති සම්බන්ධතාවය කුමක්ද? මානව සෞඛ්‍යය සහ මානසික සුවය යනු කුමක් ද? යනාදී විවිධාකාරයේ ප්‍රශ්න සභා පියවරුන් විසින් විග්‍රහ කිරීමට පටන් ගන්නා ලදි.

මෙවැනි ප්‍රශ්න වලට විසඳුම් ක්‍රිස්තුන් වහන්සේ විසින් සෘජුවම සපයන නොලද බව සත්‍යයකි. එහෙත් එවැනි වැදගත් ප්‍රශ්න ක්‍රිස්තුන් වහන්සේගේ සුභාරංචියේ දෘෂ්ටි කෝණයෙන් විග්‍රහ කළ නොහැකි බව මින් අදහස් නොකෙරේ. සුභාරංචිය යනු සමස්ත මානව සහ විශ්වයීය යථාර්ථය පිළිබඳව සත්‍යයයි. ඒ අනුව ඇදහිල්ලේ විෂය පථයට සීමාවක් නැත.

සභා පියවරුන් තමන්ගේ අවධානය යොමු නොකළ ක්ෂේත්‍රයක් නොමැති තරම්ය. උදාහරණයක් ගනිමු. ශාන්ත අගුස්තීනු තුමා නීතිය සහ දේව නීතිය අතර ඇති සම්බන්ධය මෙසේ සංසන්දනය කරයි.

"නීතියේ දෙවියනි, නීතිය ඔබ බැවිනුත් නීතිය ඔබෙන් පමණක් බිහිවුනු බැවිනුත් සියල්ලෝම ඔබේ නීතියට යටත් විය යුත්තෝය.

ඔබේ නීතියට වඩා උසස් නීතියක් තවත් නැත. ඔබේ නීතියට විරුද්ධව, නීතිගතව නීතියක් පණවන්නට කිසිවකුට බැරිය. යම් ජන සමාජයක වේවා! ආණ්ඩුවක වේවා, ඔබේ නීතිය නොදැන නීතියක්, සිරිතක්, විරිතක් ඇති වුවහොත් එය ඔබේ නීතියට විරුද්ධ බව ඔවුන් දැනගත් කල්හි ඔබේ නීතිය පිළිගත යුතුයි. ඔවුන් නොදන්නා ඔබේ නීතිය ඔවුන් පිළිනොපැද්දත්, එය දැනගත් විට ඔවුහු එය පිළිගත යුත්තෝය. රටක් ආණ්ඩු කරන රජෙකුට එම රටෙහි, ඔහුට පෙර රජකළ රජෙක්, නොපැන වූ අලුත් නීතියක් ඇති කිරීමට බලය තිබේ. රට වැසියෝ එයට කීකරු විය යුත්තෝය. එය අසාධාරණ නොවේ නම්, නීතියේ කීකරු කම මෙසේ නම් සියලු මැවිල්ලෙහි මැවුම්කාරයා වූ, රජුන්ගේ රජවූ ඔබේ නීතියට විරුද්ධ අසාධාරණ නීතියක් පැනවීමට සාධාරණත්වයෙන් කිසි හැකියාවක් නැත.

එමෙන්ම ඔබේ මැවිලිවලට අසාධාරණය, අයහපත කරන අය ඒවායින් ඔබ නියම කළ නීතියට එකඟව ප්‍රයෝජන නොගෙන, භුක්ති නොවිඳ, ඒවා ඔවුන් විසින්ම මැවුණු ඔවුන්ටම අයිතිවාසිකම් ඇති වූ කෙළි බඩු ලෙස පාවිච්චි කරන්නෝය. මෙබඳු දෙය කිරීමට බලය ඇත්තේ මැවුම්කාර දෙවියනි, ඔබට පමණය.

අපි ඔබගේ මැවිලි බැවින් අපේ කැමැත්ත ලෙස නොව ඔබේ කැමැත්ත ලෙස ස්වර්ගයට යන ලෙසට මැවිල්ලෙන් එල ප්‍රයෝජන ගත යුත්තෙමු. සදා බලැති දෙවියනි, ඔබේ සාධාරණ නීතිය නොපිළිපදින්නන්ට ඔබේ සාධාරණ නීතියෙන් දඬුවම් දීම ඔබේ සාධාරණකම බව මම පිළිගනිමි.

**ලබන සතියට ...**

---

## පණැති දෙවිඳාණන්


වේදනාව කටුකය, මරණය ශෝකාකූලය
උත්ථානය ඓශ්වර්යමත්ය

සමිඳාණන් ජීවමානය - ජීවතුන් අතරය
පණැති දෙවිඳකු , සතුය - අප හට
සදහටම රජකම් කරන

සමිඳාණන් ජීවමානය
ජීවතුන් අතර ආත්මයාණෝය
අන් වෙසක් ගෙන කවුරුන් විලසින්
කුමන මොහොතක පැමිණෙන්නේ ද? අප අතරට

ඇදහිල්ලෙන් සන්නද්ධව, විශ්වාසයෙන් පූර්ණව
ආදරයෙන් මුසපත්ව බලා හිඳිමු
පැමිණෙන තුරා දෑස් විවරව අප තුළට

**වසන්ත පී. ඒ. රත්නායක** - රද්දොළුගම



ජන වන්දනාව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

(පසුගිය සතිය හා සබැඳේ)

## අඟහරුවාදා සැඳෑ යාම යැදුම

## 21 වැනි ගීතය

මෙය 20 වැනි ගීතයේ දෙවැනි කොටස ලෙස විශාරදයෝ හඳුන්වා දෙති. මේ ගීතය ස්තුති ගී කාණ්ඩයට අයත් වූවකි. ජෙරුසලමෙහි රජතුමාගේ සහභාගිත්වයෙන් පැවැත්වුණු දේව වන්දනා පිළිවෙතක් සඳහා භාවිත වූ ගීතයක් වශයෙන් සැළකිය හැකිය. සමහර විද්වතුන් දක්වන අන්දමට මෙය රජතුමාගේ සිංහාසනාරූඪ වීමේ උත්සවයට හෝ වාර්ෂික රාජාසන උත්සවයට අදාළ වූ රාජකීය ගීයක් ද විය හැකිය. දෙවි සමිඳාණන් වහන්සේගේ මැදිහත්වීම තුළින් රජතුමාට මඟ පෙන්වීම හා ජයග්‍රහණය ලැබීම දේව ජනතාවගේ යැදුම් ආකල්පයක් වූ බවට මෙම ගීය හොඳ සාක්ෂියකි.

**ලේඛන සැලැස්ම :**

වගන්ති 1-6 : දෙවි සමිඳාණන් වහන්සේ රජු වෙත දක්වන කරුණාව නිසා උන්වහන්සේට තුති පිදීම.

වගන්ති 7: රජතුමාගේ ඇදහිල්ල පිළිබඳ ප්‍රකාශනය

වගන්ති 8 - 12 : අනාගතයේ දී දෙවි සමිඳාණන් වෙතින් රජු වෙත දැක්වෙන අනුග්‍රහය පිළිබඳ බලාපොරොත්තුව

වගන්ති 13 : තුති ප්‍රශංසාවේ යැදුම් ප්‍රකාශය

### විග්‍රහය සහ අරුත :

(අ) වගන්ති 1-6 :

දෙවියන් වහන්සේගේ නියෝජිතයාසේ ක්‍රියා කරන රජතුමා වෙනුවෙන් කෙරෙන මෙම විශේෂ යැදුම තුළ දී රජු හට ද ජනතාව හට ද මූලික කරුණක් සිහිපත් කරනු ලබයි. එනම් රජු ලබා ගන්නා කීර්තිය සහ සාර්ථකත්වය දෙවියන් වහන්සේගෙන් ලැබෙන දීමනා බවය. එබැවින් දෙවි සමිඳුන් තුළ ප්‍රීති සංතෝෂ වෙමින් උන්වහන්සේට තුති පැසසුම් දීම ඔවුන්ගේ යුතුකම වන්නේ ය.

මනදොළ පුරවා ලූ සේක : ජනතාව ඉදිරියේ දෙවියන් වහන්සේගේ නියෝජිතයා ලෙස රජු ක්‍රියාකාරීවන විට දෙවියන් වහන්සේ ඔහුගේ ඇතුළාන්ත අභිලාසයන් විනිවිද දකින සේක එවැනි යහපත් ප්‍රාර්ථනාවන් දෙවියන් වහන්සේ සපුරාලන බව ගීතාවලිය කතුවරයා පෙන්වා දෙයි (ගීතා 20:5).

දීසායු : පැරණි පෙරදිග ලෝකයේ රජවරුන්ගේ ජීවිත පිළිබඳ රචනයන් තුළ දීසායු පැතීම එක් අංගයක් සේ දිස්විණි. සොලමන් රජතුමා තම රාජ්‍ය පාලනය ආරම්භයේ දී එම පැරණි සම්ප්‍රදායට බැහැරව යමින් දිසායු වෙනුවට ප්‍රඥාව අයැදීය. එහෙත් දෙවියන් වහන්සේ ඔහුගේ යහපත් අරමුණු අගයමින් ප්‍රඥාව සමඟ දීර්ඝායුෂ ද දානය කිරීමට ඔහුට පොරොන්දු වූ අන්දම අපට සිහිපත් කළ හැකිය (1 රාජා. 3:11-14).

යස ඉසුරු : හෙබ්‍රෙව් බසින් මේ සඳහා යෙදී ඇති "කබෝද්" නමැති වදන "මහිමය" හෝ "තේජස" යනුවෙන් පරිවර්තනය වේ. එය දෙවියන් වහන්සේගේ විශේෂ ගුණාංගයක් ලෙස




ශුද්ධ ලියැවිලි වසර

**(12)**

**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

බයිබලීය සම්ප්‍රදා විස්තර කරයි (නික්ම 24:10 , ගීතා 19:1). රජු ද දෙවි සමිඳාණන්ගේ නියෝජිතයා ලෙස උන්වහන්සේගේ මහිමයට පංගුකාරයෙක් වන බව මින් හැඟවේ.

(ආ) වගන්ති 7 :
දේව වන්දනා පිළිවෙත තුළ සැදැහැවත් ජනතාව දක්වන ඇදහිල්ලේ ප්‍රතිචාරයක් ලෙස මේ වගන්තිය සැළකිය හැකිය.

කරුණා මහිමය : මෙය හෙබ්‍රෙව් බසින් එන "හෙසෙද්" යන වදනෙහි පරිවර්තනයක් වේ. දෙවි මිනිස් සබැඳියාව තුළ ඉස්මතු වන දෙවියන් වහන්සේගේ සුවිශේෂීය ගුණාංගයන් ලෙස "කරුණා මහිමය" බයිබලීය සම්ප්‍රදායන්හි දැක්වේ. දාවිත් රජ පරපුරට දුන් සදාතනිකත්වයේ පොරොන්දුව මෙය සනාථ කරවන්නකි (යෙසායා 55:3, ගීතා 89 - 24).

(ඇ) වගන්ති 8 - 12)

යැදුමෙහි දෙවැනි කොටස වූ මෙහි දේවාශිර්වාදය මඟින් රජතුමාට සුබ පැතීමක් පිරිනැමීම දැක්වේ. එම ආශිර්වාදයෙහි අන්තර්ගතය වන්නේ දෙවියන් වහන්සේ සතුරු බලවේග පරදවා ඔහු හට දෙන ජයග්‍රහණය පිළිබඳ පොරොන්දුවයි.

හිමිතුමාණෝ සිය උදහසින් : ශු. බයිබලය තුළ මානවරූපී ලෙස දෙවියන් වහන්සේ ඉදිරිපත් කරන ලේඛන අංග රැසක් ඇත. මෙහිදී උන්වහන්සේ දක්වනු ලබන්නේ යුද සංග්‍රාමයෙහි යෙදී රැකවරණය සලසන කෙනෙක් ලෙසිනි (නික්ම 14:14).

(ඈ) වගන්ති 13:
දෙවියන් වහන්සේ උදා කරන ජයග්‍රහණය ගැන සඳහන් කරමින් ප්‍රශංසාවේ ප්‍රතිචාරය සැදැහැවත් වූ දක්වති.

උසස් වනු මැනව : දෙවි සමිඳාණන්ගේ විජයග්‍රාහී මැදිහත් වීම නාට්‍යමාකාරයෙන් යැදුම් ප්‍රකාශයන්හි දැක්වේ. (ගීතා. 3:7).

### යැදුම :

දෙවි මහෝත්තමයාණන් වහන්ස, ජීවිතයේ විවිධ සිදුවීම් තුළින් අප ජීවිත මෙහෙයවන ඔබවහන්සේට ස්තුති ප්‍රශංසා වේවා. අභියෝග හා පීඩන මැද ඔබ කෙරෙහි ස්ථිර විශ්වාසයෙන් සිටීමට අපට පිහිට වුව මැනව. ඔබ විසින් තෝරා ගනු ලැබ සිටින ජන නායකයන් හට, ඔබවහන්සේගේ මඟ පෙන්වීමට සාක්ෂි දැරීමට වරම් දුන මැනව. ආමෙන්

**ලබන සතියට ...**

# 2012 දේව වචනයේ වසර - උත්ථාන සමයේ පස්වන ඉරුදින

මිදි වැල සහ එහි අතු පැහැදිලිවම කතා කරන්නේ සම්බන්ධතාවයක් ගැනය. එහෙත් බැලූ බැල්මට මෙහි ඉස්මතුවන අදහසට වඩා වැඩි දෙයක් උපමාවේ තිබෙයි. ජේසු සමිඳුන් මිදි වැල සහ එහි අතු ගැන කතා කළද ඔවුන් වහන්සේගේ හිතේ තිබෙන්නේ මිදි එල ගැනය. මේ පුංචි උපමාව තුළ 'එල' යන වචනය සත් වතාවක් අපට හමුවෙයි. ජේසුස් වහන්සේට අනුව එල දැරීම සහ ශුද්ධවන්තකම අතර ලොකු සම්බන්ධයක් තිබෙයි. එය උන්වහන්සේ අපට උපමාව මුලදීම කියයි. 'මා ඔබට වදාළ දහම කරණකොට ගෙන ඔබ දැනටම පිරිසිදුය. මා තුළ සිටින්න. මමද ඔබ තුළ සිටිමි." ජේසු සමිඳුන් උන්වහන්සේ තුළ සිටින්නැයි අපට කියන්නේ මේ පිරිසිදුකම රැක ගැනීමටය. උන්වහන්සේට අනුව මේ මූලික නිර්මලකම නොමැතිව එල දැරීමක් සිදු නොවෙයි. මහන්සිය අපතේ යයි. එබැවින් මේ උපමාව ශුද්ධවන්තකම ගැන කියවෙන උපමාවකි.

එල යනු පෝෂණයකි. එය හුදෙක් ප්‍රතිඵල ලෙස සිතීමෙන් මේ උපමාවේ අර්ථය අපෙන් ගිලිහෙයි. ජේසුස් වහන්සේ කතා කරන්නේ අනෙක් අයට පෝෂණයක් විය හැකි විදියේ ජීවිතයකි. එය මිදිවැලක් ඇසුරු කර ගනිමින් උන්වහන්සේ කතා කරන්නේ මේ නිසාමය. මිදි වැල සහ අතු අතර පවතින බැඳීම් ජාලය ජේසුස් වහන්සේගේ හිතට එන්නේ තාත්තා සහ තමන්වහන්සේ අතර පවතින ගැඹුරු බැඳීම මතක් කරමිනි. උන්වහන්සේ දකින්නේ තම තාත්තා සමඟ පවත්වන සබඳතාවයෙන් ජනතාවට ලැබෙන මහා ප්‍රතිඵලය ය. එය සුවයත් සැනසීමත් පමණක් නොව මහා පෝෂණයක් යැයි උන්වහන්සේ සිතන්නේ ජනතාව තුළ සිදුවන වර්ධනය ජේසු සමිඳුන් දකින නිසාය. ජේසු මේ වර්ධනය බලා බොහෝ සතුටු වූ කෙනෙකි. තාත්තා සමඟ එකට සිටීමෙන් ජේසුගේ අතින් පමණක් නොව මුවින් පිටවන වචනයකින් පවා මහා හාස්කම් සිදුවිය. ඒ හැම හාස්කමක්ම ජේසු දුටුවේ එලබර ජීවිතයක සලකුණු ලෙසය.

ඉන් ජනතාව ලබන ප්‍රතිලාභ තුළින් ඔවුන්ගේ ජීවිත සංවර්ධනය වන බව ජේසු දිටීය. බොහෝවිට ශුද්ධවන්ත ජීවිතයක් ගත කිරීම සහ එලබර ජීවිතයක් ගත කිරීම යන මේ දෙකෙහි ඇති සම්බන්ධය ගැන අපට නොසිතෙයි. අපේ ජීවිත එලබර වීම යනු අනෙක් අයට අපේ ජීවිතය




පෝෂණයක් වීමක් බවත් බොහෝවිට අපට නොසිතෙන්නේද මේ නිසා විය හැකිය. එබැවින් අද අපට ඇති ලොකුම හිඟය ශුද්ධවන්ත දෙමව්පියන් සහ වැඩිහිටියන්ය. අපේ දූ දරුවන් තුළ අප දකින පරිහානිය පිටුපස ඇත්තේ මහා මන්ද පෝෂණයකි. එනම් දෙමව්පියන් නිර්මල අඹු සැමි ජීවිත ගත නොකරන නිවසක ඇති දැඩිවන දරුවකුට අත්වන ඉරණමය. ඔහු හෝ ඇයගේ ශරීරය ඔවුන්ගේ දෙමාපියන් පිසින ආහාරවලින් වැඩෙයි. එහෙත් ඔවුනොවුන් අතර නැති අධ්‍යාත්මික නිර්මලකම නිසා දරු පැටවුන්ගේ ආත්ම පෝෂණය මඟ හැරෙයි. මෙම තත්ත්වය නිසා ඇතිවන ආනිශංස අපි දැනටමත් දැක ඇත්තෙමු. මේ තත්ත්වය වෙන කිසිම විදියකින් සමතයකට පත් කළ නොහැකිය. එසේ කළ හැකි එකම විදිය එකට සිටීමය. දෙමව්පියන් දෙදෙනා එකට සිටිය යුතු අයුරු ජේසු සමිඳුන් තම තාත්තා සමඟ එකට සිටීමෙන් අපට පෙන්වීය. උන්වහන්සේ අද අපට කියන්නේ මිදිවැල සහ මිදි අතු මෙන් අම්මාද තාත්තාද දරු පැටවුන්ද එකට යාවී සිටිය යුතු බවය. මේ යාවී ගෙවන දිවිය ගැන ජේසු මේ මිදිවැලේ උපමාවෙන් දෙන පින්තූරය සිතට ඉතා කාවදින සුළුය. ඇත්තටම මෙය අපේ සිතට තදින් කාවැදිය යුතු දෙයකි. අපේ අසමගිකම් නිසා අප පමණක් නොව අපට පසු එන පරපුරත් නාස්ති වෙයි. ජේසු සමිඳුන් මේ නාස්තිය දකින්නේ වියළී ගිය මිදි අත්තක් ලෙසය. එය ගින්නේ හෙලන බව මතක් කිරීමෙන් අප තුළ ඇති කරන්නේ බයක් නොව මහා වේදනාවකි. සැබවින්ම ලොකුම වේදනා අපට ඇතිවන්නේ අපේ බිඳුණු සම්බන්ධතා නිසා බව ඔබ දනියි. එවැනි වේදනා විඳිමින් ගෙවෙන දිවිය කර්කෂ එකකි. එය වර්ධනයක් පමණක් නොව කිසි ජීවයක් හෝ තෙතමනයක්ද නැත.

ජේසු සමිඳුන් ජීවිතය ගැන ගැඹුරුම මෙනෙහිකිරීම කළ කෙනාය. උන්වහන්සේ ජීවිතයත් සතුටත් වර්ධනයත් අතර ඇති ඇතුලාන්ත සම්බන්ධය උපරිමයෙන්ම විඳි කෙනාය. උන්වහන්සේ කියන්නේ මෙහිලා උන්වහන්සේ සොයාගත් රහස්වලින් එකකි. එය ශුද්ධවන්තකමය. මූලික නිර්මලකමක් හිතේ නැති මනුෂ්‍යයකුගේ දෑතට ඇත්තේ කරගැට පමණකි. ඔහුට ප්‍රතිඵල නැත. ඔහුගේ ජීවිතයෙන් අනෙක් අයට නොව ඔහුටවත් වැඩක් නැත.

**ගරු හෙන්රි සිල්වා පියතුමා** 32

# නික්මයාම පොත




**පසුගිය සතිය හා සබැඳේ**

දෙවෙනුව පාරාවෝ හා ගනුදෙනු කරන විට මෝසෙස් "සමිඳාණන් වහන්සේ මෙසේ වදාරණ සේක හෝ සමිඳාණන් වහන්සේගේ පණිවුඩය මේය යන ව්‍යවහාරයන් භාවිතා කරයි. එය දිවැසිවරු පමණක් භාවිතා කළ ව්‍යවහාරයන්ය. ඉශ්රායෙලය තුළ දිවැසිවරු හැර වෙන කිසිවෙකුට මෙම ව්‍යවහාරයන් භාවිත කළ නොහැකි විය. ( 7:17; 8:1; 8:20) මෝසෙස්ගේ කැඳවීම දිවැසිවර කැඳවීමක් ලෙස ඉදිරිපත් කරන්නේ මන්ද යන්න දැන් අපට පැහැදිලිය. දිවැසිවර කැඳවීමක් ආශ්‍රිතව විශේෂයෙන් යෙසායා, ජෙරමියා සහ එසකියෙල් යන ප්‍රධාන දිවැසිවරුන්ගේ කැඳවීම්වල පහත සඳහන් ලක්ෂණ දැකිය හැකි වෙයි. එනම්

1. **දෙවියන් වහන්සේගේ දර්ශනයක්** (යෙසායා 6:1-5; ජෙරමියා 1:5; එසකියෙල් 1) දෙවියන් වහන්සේගේ දර්ශනය විම ඉදිරිපත් කෙරෙනුයේ දිවැසිවර කැඳවීම හුදෙක් දෙවියන් වහන්සේ වෙතින්ම පැමිණෙන බව දැක්වීමටය. එය දෙවියන් වහන්සේ විසින්ම දෙනු ලබන ත්‍යාගයකි. බොහෝවිට නිර්මාණශීලි මෙන්ම ක්‍රියාකාරීද වන දිවැසිවර වචනයට ආවේණික අධිකාරි බලයද එමගින් දිවැසිවරයාට දානය කරනු ලැබේ. මෙයට ප්‍රධාන හේතුව දිවැසිවර වචනය දේව වචනයම වීමය. මෙම දර්ශනය තුළ මෝසෙස්, ඇවිලෙන නමුත් නොදැවෙන පඳුරක් දකියි. (නික්මයා 3, 1-6 ) මෙහිදි දෙවියන් වහන්සේ ඔහුට කථා කරන සේක.

2. **දූත මෙහෙවර භාරදීම.** යෙසායා යවනු ලබන්නේ දැඩි සිතැති ඉශ්රායෙල් ජනතාව වෙතටය. (යෙසායා 6: 9-10 ) ජෙරමියා ජාතීන්ගේ දිවැසිවරයා ලෙසද (ජෙරෙ 1: 5), එසකියෙල් බැබිලෝනියේ විප්‍රවාසීව සිටින ජනතාව වෙතද යවනු ලැබේ. (එසෙ. 3: 11). මෝසෙස් කැඳවනු ලබන්නේ ඉශ්රායෙල්වරුන් වෙනුවෙන් පාරාවෝ ඉදිරියේ පෙනී සිටීම සඳහාය.

3. **කැඳවීම භාර ගැනීමට දිවැසිවරයා මැළිවීම.** - මෙයට ප්‍රධාන හේතුව වනුයේ ජනතාව අසන්නට අකමැති දේ පැවසීමට දිවැසිවරයාට සිදු විමය. ඒ අනුව දිවැසිවර කැඳවීමක් බොහෝ දුක් ගැහැට සහිත බව දක්නට ලැබේ. මෝසෙස් කැඳවනු ලැබීමේදී ඔහු පස් වතාවක් කැඳවීම භාර ගැනීමට මැළිවෙයි. තම අකමැත්ත ප්‍රකාශ කරයි.

අ.) නික්මයාම 3/11 - පාරාවෝ වෙත ගොස්, ඉශ්රායෙල් ජනයා මිසරයෙන් පිටතට ගෙන යනු පිණිස මම කවරෙක්ද ?

ආ.) නික්මයාම 3/13 - " මා ඉශ්රායෙල් සෙනඟ වෙත ගොස්, උන්වහන්සේගේ නම කුමක්දැයි මාගෙන් අසන කල මම ඔවුන්ට කුමක් කියම්ද ?

ඇ.) නික්මයාම 4/1 - " ඔව්හු මා විශ්වාස නොකොට මාගේ හඬට සවන් නොදි සමිඳාණන් වහන්සේ ඔබට දර්ශනය නොවු සේකැයි කීවොත් කුමක් කරන්නද ?

ඈ.) නික්මයාම 4/10 - "මම ව්‍යක්ත කථිකයෙක් නොවීමි. කීමෙහි බිණීමෙහි දුබලය. දිව ගොත ගහන සුලුය."

ඉ.) නික්මයාම 4/13 - " .... අනේ මාගේ ස්වාමිනි, කරුණාකර, ඔබ කැමති අන් කෙනෙකු යැව්ව මැනව."

ජෙරමියා 20, 7-11 හි ජෙරමියා මුහුණ දෙන අරගලය මේ පිළිබඳ පැහැදිලි උදාහරණයකි.

4. **දෙවියන් වහන්සේ විසින් දිරිමත් කරනු ලැබීම.** නික්ම. 3/12. " ..... මම නුඹ සමඟ සිටිමි...., නික්ම 3/14, "මම වනාහි ස්වයම්භූ නම් තැනැන් වහන්සේ වෙමි. ස්වයම්භූ තැනැන් වහන්සේ ඔබ වෙත මා එවු සේකැයි නුඹ ඊශ්රායෙල් ජනයාට කිව යුතුය...." නික්ම 4/2-9. සමිඳාණන් වහන්සේ දර්ශනය වූ බව පෙන්වීම සඳහා සලකුණු දෙකක් ඉදිරිපත් කිරීම. නික්ම. 4:11-16 - මිනිසාගේ මුඛය නිර්මාණය කළේ කවරෙක්ද ? "ඔහු (ආරොන්) නුඹ වෙනුවෙන් කථා කරනු ඇත." නික්ම. 4:14 හි සඳහන් පරිදි "එවිට සමිඳාණන් වහන්සේ මෝසෙස් සමඟ උදහසින් ඇවිළි" යන්නෙන් අදහස් කෙරෙන්නේ කැමැත්තෙන් හා අකමැත්තෙන් හෝ කැඳවීම භාර ගැනීමට මෝසෙස්ට සිදුවෙන බවයි. මෙපරිද්දෙන් දිවැසිවර කාර්යය පිළිගැනීමට අභ්‍යන්තර පෙළඹවීමක් දිවැසිවරු අත්දුටු බව පෙනේ.

5. **දිවැසිවරයා යවනු ලැබීම.** මෝසෙස් පාරාවෝ වෙත යවනු ලැබේ. (නික්ම 4: 17). මෝසෙස් කැඳවනු ලැබීම නැවත 6:2 -7:7 දක්වා කොටසේ දක්නට ලැබේ. මෙම පූජක සම්ප්‍රදායේ ඉදිරිපත් කිරීමකි. නික්. 3:1-17 හි විස්තරය යාවේ හා එලොහිම් සම්ප්‍රදායන්ගේ සංස්කරණයකි. තවද පූජක සම්ප්‍රදායේ ඉදිරිපත් කිරීම, 3:1- 4:17 විස්තරයේ ආභාෂය ලබා ඇති බවද කිව යුතුය.

(තවත් කොටසක් ලබන සතියේ...)

ජනතා හඬ

# ඥානාර්ථ ප්‍රදීපය පාස්කු කලාපය ජීවිත කුරුසවලට අත්වැලක්

**කතුතුමනි,**

"කුරුසියෙන් ජීවනයට" මැයින් ඉතා අගනා පාස්කු කලාපයක් මෙවරද ඥානාර්ථ ප්‍රදීපය පාඨකයන් අතට ලැබුණි. එහි එක් ලිපියකින් චතාරිකය කිතුනු අපගේ ජීවිත තුළ අඩුපාඩුකම් සකසා ගැනීම පිණිස ලැබෙන අනර්ඝ අවස්ථාවක් විනා එය තවත් එක් වාර්ෂික සිදුවීමක් නොවන බව පෙන්වා දී තිබූ අතර, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී මරණයේ හා උත්ථානයේ අරුත්ගැන්වූ සැබෑ යථාර්ථමය අභිරහස වන්නේ කේන්ද්‍රගතවූ අප විශ්වාසයේ ජීව හරය බවත්, එමෙන්ම මිනිස් වර්ගයාගේ අපරාජිත අනාගතය හා වර්තමානය එකට ගොනුකොට අර්ථවත්ව විහිදෙන මොහොත බවට උන්වහන්සේගේ උත්ථානය පත්කොට ඇති බවත් තවත් ප්‍රධාන ලිපි දෙකකින් පෙන්වාදී ඇත. එමෙන්ම ඇතැම් කොමියුනිස්ට් රාජ්‍යවලින් පවා පළවන නම්‍යශීලි භාවයත්, බහුතර ජනතාවක් දහම හා සභාව වෙත මෙන්ම සසුන් පියා වෙත දක්වන ගෞරවාදරයත් නව උත්ථානයකට අප රැගෙන යන බවත් පවසා ඇත.

මේ හැර අනෙක් ලිපි අතර කිතු සමිඳුන් හට මරණ තීන්දුව දුන්නාසේම උදව් කළ අයගේ චරිතය මරා දමන සමාජයක අද අපි ජීවත්වන බවත්, සීමොන් සිරනේවුස්ලා වැනි තරුණයන්ද, වෙරෝනිකාලා වැනි දිරිය සම්පන්න ළඳුන්ද අද සමාජයේ සිටින්නේ කීයෙන් කීදෙනාද යන්න විමසා ඇති අතර, පාදනමස්කාර යාම, පසන් ගී ගායනා කිරීම හා ශුද්ධවූ පැය පොත කියවීම ඉතා ලේසි බවත්, එමෙන්ම ශුද්ධවූ දේශයට, හිනිදුම, මග්ගොන වැනි ස්ථානයන්හි සිදුකරන පාදනමස්කාරයට වඩා අපේ වරප්‍රසාද අහිමි සහෝදරයා දුක් විඳින්නේ කොහේද කියා සොයා බලා ඔහුට උදව් උපකාර කිරීමද, එදා සමිඳුන්ගේ අනුගාමිකයෝ තමන් සතු සියල්ල නැති බැරි අහිසංක දිළිඳු අය අතර බෙදාගත්තාක් මෙන්, තමන් සතු දෙයක් නැති බැරි ජනතාව සමඟ බෙදාගැනීමද එදා කල්වාරියේ ප්‍රාණය පූජා කර උත්ථාන වූ සමිඳුන්ට උපහාරයක් වන බවද පෙන්වා දී ඇත.

තවද සුපුවතට අනුව කිතු සමිඳාණන්ට එරෙහිව නඟා ඇති චෝදනා ඔප්පුවී නොමැති බවත් උන්වහන්සේ මරණ දඬුවමට තීන්දු කිරීම කැලෑ නීතිය රජ කිරීමක් බවත් කුරුස ගසේ ඇණ ගසා දිවි තොර කිරීමද උන්වහන්සේගේ ජීවත්වීමට ඇති අයිතිය උල්ලංඝණය කිරීමක් බවත් එමෙන්ම උන්වහන්සේගේ උත්ථානයෙන් පසු සුවිශේෂක ජුවාම් තුමා හැර අනෙක් සුවිශේෂකවරු තිදෙනාත් අපෝස්තුළුවරුන් ඇතුළු බොහෝ අය කිතු දහම දේශනා කිරීම නිසා ප්‍රාණපරිත්‍යාගිවරු වී ඇති බවත්. ජුවාම් තුමා තෙල් කටාරමක බහාලුවත් විශ්මයජනක ලෙසින් එයින් බේරීම නිසා එතුමා නිදහස්වී පසුව බිෂොප් වරයකු ලෙස සේවය කර ස්වභාවික මරණයට පත්වී ඇති බවත් සඳහන් වී ඇත. උන්වහන්සේගේ උත්ථානයට සාක්ෂි වශයෙන් මෙවලම් දෙකක් ලොවට දායාද කරදී ඇති බවත් එදා මහසිකුරාදා දිනදී ජේසුගේ සිරුර ඔතනු ලැබූ ශ්‍රී සළුව හා උන්වහන්සේගේ සිරුර තැන්පත් කළ හිස්ව තිබෙන සොහොන එම දේවල් බවත් සඳහන්ය.

මේ ආකාරයට ඉතා අගනා ලිපි රාශියක් මෙවර පාස්කු කලාපයේ පළකර සැබෑ සිත් හැරීමකටත්, සිත් සෝදිසියකටත් පාඨකයන්ට අත්වැලක් සැපයීම ගැන ඥානාර්ථ ප්‍රදීපය ප්‍රධාන කර්තෘ පියතුමාටත්, එතුමාගේ සහායක සංස්කාරකවරුන් ඇතුළු සැමටත් හදපිරි තුති සමඟින් දේවාශිර්වාද පතමි.

**කේ. නිහාල් ප්‍රනාන්දු**
බෝලවත්ත

# අතිඋතුම් ප්‍රැන්ක් මාකස් හිමි පිළිරුවක් ඉදිකරමු

**කතුතුමනි,**

හලාපුරයට පිවිසෙන විට නෙත ගැටෙන ස්වර්ගස්ථ රදගුරු අතිඋතුම් එඩ්මන් පීරිස් හිමිපාණන්ගේ අභිමානවත් පිළිරුව දකින විට හිතට දැනෙන්නේ අසීමිත වූ භක්ත්‍යාදරයකි.



එමෙන්ම ස්වර්ගස්ථ හලාවත රදගුරු අතිඋතුම් ප්‍රැන්ක් මාකස් හිමිපාණන්ද කිතුනු ජනතාවට කිතු සමිඳුන්ගේ වදන් තුළ ජීවත් වන්නටත්, ශුද්ධාත්ම වරමින් ශක්තිමත් වී දේව රාජ්‍යය වෙත යන ගමනට අපට ලබාදුන්නේ ප්‍රබල ශක්තියකි. කිතුනු සභාවට හා කිතුනු ජනතාවට බලපාන ගැටලු වලදී ඇති වූ ජනතා අරගල වලට එතුමා ලබා දුන්නේ ප්‍රබල නායකත්වයකි. එවන් උතුමකුගේ පිළිරුවක් හලාවත නගරයේ ස්ථාපිත වීම කාලෝචිත ක්‍රියාවකි. මේ සභා බලධාරීන්ගේ අවධානය පිණිසයි.

**පීටර් කැමිලස් සුබසිංහ**
විල්පත

# සයිබර් රකුසා රට බිලිගෙන ඉවරයි වගකීම දෙමාපියන් බාරගත යුතුයි

**කතුතුමනි,**

ප්‍රදීපය පුවත් පතින් කළුතර බෙනඩික් සිල්වා මහතාගේ නමින් සයිබර් රකුසා භයානකයි මැයෙන් පළවූ වැදගත් ලිපිය කියවා බලා මෙය ලිවීමට සිත්විය. මා මේ ලියන සිද්ධියට සම්බන්ධ අය ආගමට දහමට ඉතා ලැදි වැදගත් පවුලකට අයත් අයය. පියා විදේශ රටක උසස් රැකියාවක් කරයි. මව ගෘහනියකි. ඔවුනට සිටින්නේ අක්කා මල්ලී වශයෙන් දරු දෙදෙනකු පමණි.



අක්කයි මල්ලියි වැඩිදුර දැනුම ලබා ගැනීම සඳහා නගරයේ ටියුෂන් පන්ති වලට ඉතා උනන්දුවෙන් යති. දෙමාපියෝ ආදරයට දරුවන්ට අත දිග හැර වියදම් කරති. නමුත් තම දරුවන් ගෙදරින් පිටවී ගොස් කරන්නේ මොනවාදැයි දෙමාපියන් සොයා බැලුවේ නැත. දරුවන්ගේ බලවත් ඉල්ලීම නිසා පියා විසින් ලොකු මුදලක් වියදම් කර සියලු පහසුකම් සහිත පරිගණක පද්ධතියක් එතෙර සිට එවන ලදී. අක්කයි මල්ලියි ඒ අයගේ ලෝකයේ ගත කළහ. ටික කලක් යන විට සිදුවූ විනාශය මේ පුවත් පතින් ලිවිය නොහැකිය. දෙමාපියන්ගේ සිහින සුනු විසුණු වී ගොසිනි. දෙමාපියන්ගේ පවුල් ජීවිතයද කැඩීබිඳී විසිරී ඇත. ඒ සයිබර් රකුසා කළ එක් වින්නැහියක් පමණි.

මේවාට දෙමාපියන් වගකිව යුතුය. දරුවන්ට ආදරය තිබු පලියට, මුදල් තිබූ පලියට අනවශ්‍ය දේ රැගෙන දිය යුතු නැත. දරුවන් යන්නේ එන්නේ කොහේද? කරන්නේ මොනවාදැයි දෙමාපියන් නිතර සොයා බැලිය යුතුයි. සයිබර් රකුසා මෙසේ බොහෝ දරුවන් ගිලගෙන ඇත. පාසල් වියේ දරුවෝ අත්හදා බැලීම්වලට නිතර යොමු වෙති. දෙමාපියන් දරුවන් කෙරෙහි සෝදිසියෙන් සිටින්නේ නම් මේවාවලින් තම දරුවන් බොහෝදුරට වලක්වාගත හැකිය. ජේසු සමිඳුන් ජෙරුසලමේ ස්ත්‍රීන්ට කී පරිදි අද බොහෝ දෙමාපියෝ තම දරුවන් වෙනුවෙන් හඬා වැලපෙති. සමහරු එළිපිට හඬා වැටෙති. තවත් අය හිත ඇතුලෙන් හඬා වැලපෙති. මේ සියලුදේට දෙමාපියන් වගකිව යුතුය.

**රෝයල් ප්‍රනාන්දු**
රද්දොලුගම

# අසරණයන්ට නිහඬව සරණවූ සග සැපත් ගරු ප්‍රැන්සිස් ප්‍රනාන්දු පියතුමා

**කතුතුමනි,**

අප කතෝලික සසුන තුළ විවිධ අපොදුජන සේවාවන් සඳහා නම් දැරූ ගරු පියවරු වෙති. ඒ ගෞරවණීය නම් අතර දිදුළන නාමයකි ගරු ප්‍රැන්සිස් ප්‍රනාන්දු පියතුමා. එතුමා බොහෝ කටයුතු වෙත සිය අවධානය යොමුකර සේවාවන් රැසක් ඉටුකළත් 'අසරණ සරණ' සේවාවට දුන් තැන ප්‍රමුඛය.

කොටි ත්‍රස්තවාදීන් නිසා අසරණවුන ධීවර ජනතාව වෙනුවෙන් කළ සේවාව අමතක කළ හැකිද? කතෝලික සභාවෙ පූර්ණ සහයෝගය මත එතුමා මැදහත්වී අසරණ ධීවර ජනතාව සඳහා කළ හැකි උපරිම සේවාවන් රැසක් ඉටුකළා. ඒ සේවාවන් අතර නිවාස නැති අයට නිවාස ලබාදීමේ පුන්‍යක්‍රියාව තරම් මහඟු දෙයක් තිබේද?

ධීවරයන් සඳහා පමණක් නොව එතුමා සිටි සෑම මීසමකට 'සෙවණක් නැති හිසකට' නිවසක් තනාදී ඇත. එම සේවාව එතුමා ඉටුකළේ ඉතා නිහඬවය. අද නිවාස හදනවාට වඩා සද්බව කීමට කෑ මොර ගැසීම අධිකය. උත්සව වෙනුවෙන් කරන වියදමින් තවත් නිවසක් හෝ කීපයක් හෝ තනාදීමට නොහැකිද? එහෙත් ගරු ප්‍රැන්සිස් ප්‍රනාන්දු පියතුමා නිවාස ඉදිකිරීමේ පින්බර දර්ශනය කෑමොර ගැසීමෙන් තොරව කළේ බෙහෝ අයට දැනෙන ආදර්ශයෙන්ය.

එපමණක් නොව අධ්‍යාපනය, කලාව, සාහිත්‍යය වෙනුවෙන්ද කළ මෙහෙය ප්‍රශස්ථය. එතුමාද කලාව ගීතය ප්‍රගුණ කළ නිර්මාණශීලි පියනමකි. ඒ සැමට වඩා නැති බැරි අය ඇති හැකි අය කිරීමට දැරූ උත්සාහය ප්‍රගතිශීලිය. අද වැනි යුගයක අපට එතුමා නිතර මතකයට නැගේ. හේතුව එතුමා සිටියානම් මොනතරම් සේවාවක් කිරීමට අවශ්‍ය කැපවීම දායකත්වය නායකත්වය දේද? එහෙත් දෙවිපියාණන්ගේ කැමැත්තසේ නම් ගරු ප්‍රැන්සිස් ප්‍රනාන්දු පියතුමා සදා සගසුව දිනා මේ මසට වසර අටකි. අපි එතුමාට එතුමාගේ සේවයට දෙවි සමිඳු අයැද තුති පුදමු.



**මා. ජයවීර**
පිටිපන


# තැතිගත් සුනාමියෙන් පාඩම් උගනිව් !

**කතුතුමනි,**

සුනාමි බියකින් නැවත සුජන හදවත් දෙදරුවේය. මුහුදුබඩ ජනතාව මහත් බියකින්, වේදනාවකින් ආරක්ෂිත ස්ථාන කරා කඩිමුඩියේ ඇදුනේ ජීවිත බිය නිසාය. රට ඇතුළත ජනතාව රූපවාහිනිය, ගුවන් විදුලිය ඔස්සේ මොනවයින් මොනවා වේදැයි දෙගිඩියාවෙන් යුතුව නෙත් සවන් යොමා සිටිය අතර, කිසි කෙනෙකුටවත් අනතුරක් නොවේවායි සිතින්, මුවින් පැතුවෝය. ඒ අතීත මහා ඛේදවාචකය තම සිහියේ තිබූ බැවිනි.

ජනමාධ්‍යයෙන් දැනුම් දුන් විගස ජනතාව ගේදොර හැරදමා අතට ගතහැකි උපරිමය අනුව මුදල් රත්තරන්බඩු, ඇඳුම් ටිකක් බෑගයකට දමාගෙන ආරක්ෂිත ස්ථාන කරා දිවගියහ. ධනවතා, දුප්පතා, දුබලයා බලවතා එකට තැතිගත්, දෙවිඳුන් සිහිකරගත් මොහොතක් විය. මහ මන්දිර, ගෙවල්, ව්‍යාපාර ස්ථාන, වතුපිටි, T.V අල්මාරි, පුටු මේස සහ අනිකුත් දේ ගැන නොසිතු සේය. මෙය අප ජීවිත වෙත මහා ගැඹුරු පණිවුඩයකි. වත නොව සිත ඉරාගෙන දෙවිඳු වෙත මනස්ථාපනයෙන් දැන්වත් හැරිය යුතු මොහොතකි. තන්හා, ආශා පොදි බැඳගත් මිනිසුන් සමඟ උරණවී අවුරුදු ගනන් නඩු කියමින් අවලාද නගිමින් චරිතය ඝාතනය කරමින්, කේලම් කියමින් දිවි ගෙවන අපට පාඩමකි. අපට අපගේ කියා කිසිදෙයක් නැති බවද, අඩු තරමින් අපගේ ජීවිතය පවා අපට අයිති නැති වගද, සුළු මොහොතෙන්, එක් සැනින්. තප්පරයෙන් දෙවිඳුන්ගෙ මහා බල පරාක්‍රමයෙන් නිසල කිරීමටත් අවදි කිරීමටත් හැකිබව තේරුම් ගත යුතුය. අපි සුනාමි බියටපත්ව ඇඳුම්, මුදල්, රත්‍රං ස්වල්ප දෙයක් අරන් දිවගියෙමු. නමුත්, ජීවිත ගමනේ අප අනන්තය කරා යන මේ ගමනේදී මේ ටිකවත් අපට නැත. ගෙනයන්නට දෙයක් නැත. ගෙනයා යුත්තේ හොඳ හිතය, පිං කුසල්ය. දෙවිඳුන්ට උවමනා ඒ ටිකය. දැන්වත් සිතන්න, විඳවන්නට නොව, දෙවිඳුන්ගේ මහා කරුණාව අත්විඳින්නට මෙම සුනාමි බියෙන්වත් තේරුම්ගෙන දෙවිඳුන් වෙත හැරෙන්නට අප පාඩම් ඉගෙන ගත යුතු වන්නේමය.

**ක්‍රිස්ටි ඔස්මන් පෙරේරා**
පුල්ලුහේන



# දියඹට දියත් කරමු !

## (අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සමග කරන ලද සාකච්ඡාවක් ඇසුරිනි)



2009 ජුලි මස 11 වන දිනය, කුරුණෑගල පදවියට තවත් සුවිශේෂී ඓතිහාසික දිනයක් ලෙස සනිටුහන් විය. "සියල්ල සියල්ලන් සඳහාය" යන ආදර්ශ පාඨය පෙරදැරි කරගෙන සිය එඬේරික ක්‍රියාවලිය සාර්ථක ලෙස සියල්ලන් සඳහාම දියත් කළ අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන්, නව රදගුරු හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන් වෙත පදවිය පවරා දීමේ දිනයයි ඒ.

බයිබලයේ සඳහන් පරිදි "දෙවියන් වහන්සේ කලින් කලට සුදුසු පුද්ගලයන් සේවය සඳහා එවන බව සනාථ කරමින් කුරුණෑගල පදවි සිහසුන වෙත සම්ප්‍රාප්ත වූ නව රදගුරු හිමිපාණන් "සාමයේ ප්‍රබලතම බැම්ම ප්‍රේමයයි" යන ආදර්ශ පාඨය පෙරටු කරගෙන සිය එඬේරික ක්‍රියාවලිය ඇරැඹූහ. භෞතික වශයෙන් පදවිය සම්පූර්ණය. ජනතාවගේ ආධ්‍යාත්මිකත්වය "ගැඹුරට" ගෙන යාම උන්වහන්සේගේ දැක්ම විය. පදවි දෙකක රදගුරු පදවි දරා අත්දැකීම් සහිත උන්වහන්සේ, සිය දැක්ම තුළ ක්‍රිස්තුන් වහන්සේගේ ධර්මදූත ක්‍රියාවලිය ඉතා කෙටි එකක් වූවත්, එය ඉතා පුළුල් ලෙස අරුත් ගැන්වී ඇති අයුරු දකිති.

කුරුණෑගල පදවියේ වසර 22 ක් පුරා නිමැවී තිබුණ දහම් නෞකාව "ගැඹුරට දියත් කිරීමේ "ක්‍රියාවලියට උන්වහන්සේ අවතීර්ණ වනුයේ, "ගැඹුරට දියත් කරන්න" යන ස්වාමින් වහන්සේගේ වචන වලින් දිරිමත් වූ සීමොන් පේදුරු තුමා මෙන් බහුල අස්වැන්නක් ලබා ගැනීමේ අපේක්ෂාවෙනි. "පදවියේ සියලුම අපෝස්තලික සේවාවන් තුළින් ජනතාව ආධ්‍යාත්මිකව ගැඹුරට ගෙනයාම කළයුතුයි. එම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ දූත මෙහෙවර ක්‍රියාවට නැංවීම තුළින් ගිහි, පැවිදි, පූජක යන සියලුම කොටස් ආධ්‍යාත්මිකත්වයේ ගැඹුරට ගෙ ාස් දෙවියන් වහන්සේට ප්‍රසන්නව ජීවත්වීම මූලිකව සිදුවිය යුතුයි. අපගේ ජීවිත වන්දනා ගමනේ ප්‍රධාන ඉලක්කය එයයි. මෙම ඉලක්කය පෙරදැරි කරගත් උන්වහන්සේ ගිහි, පැවිදි, පූජක යන සියලු කොටස් සමග සුවිශාල කතිකාවතකින් මත විමසුම් ලබාගෙන පදවියේ ඉදිරි සැලැස්ම සකසනු ලැබිණි. ඒ සැලැස්ම ඉදිරි වසර 25 තුළ, කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ඝකාලීන වශයෙන් අවසාන ඉලක්කය සාර්ථක කරගැනීම දක්වා ක්‍රියාත්මක කිරීම නව රදගුරු හිමිපාණන් ඉදිරියේ තිබෙන අපේක්ෂාවය. පදවිය තුළ අප පා නැගූ ගමන් මඟෙහි සාර්ථක තැන්, අසාර්ථක තැන් හා සාර්ථක වීමට ගත යුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳව සමාලෝචනයක යෙදීමෙන් අනතුරුව උන්වහන්සේ විසින් 2010, අප්‍රේල් මාසයේ දී කට්ටිමහන සා. ආනා සිද්ධස්ථානය කේන්ද්‍රකොටගෙන "ධර්ම සේවා සමුළුව" 16, 17, 18 සහ 19 යන දින තුළ දී පවත්වන්නට යෙදිනි. එය පදවියේ දෙවන දහම් සේවා සමුළුවයි. (පළමු දහම් සේවා සමුළුව පැවැත්වූයේ 1995 වසරේදීය). දූත සේවාව නව මාවතකට යොමුකරලීමේ යෝජනා රැගත්, එම සමුළුවේ නිගමනයන් තුළින් නිර්මාණය වූ වැඩ සැළසුම්, දැනටමත් ක්‍රියාත්මක වනු දැකිය හැකිය.

කුරුණෑගල පදවිය තුළ දේව රාජ්‍යය උදා කරලන්නට, විවිධ අපෝස්තලික සේවා විධිමත්ව සංවිධානය කරගනිමින් සුදුසු ප්‍රායෝගික ව්‍යුහයන් සකසා ගැනීම ප්‍රධාන තේමාවන් 12 ක් ඔස්සේ සිදුකරනු ලැබිණි. අප පදවියේ ඉදිරි ගමන් මඟ සඳහා පදනම රැඳී ඇත්තේ මෙම අංශ 12 මත බැවින් ඒ පිළිබඳව හැඳින්වීමක් කිරීම උචිත යයි හැඟේ.

★ ජනවන්දනාව : දේව වන්දනාවට ඇතුළත් දිව්‍ය පූජා යාගය, ප්‍රසාද නිධාන, නිලහෝරා යැදුම් සහ අනෙකුත් වත් පිළිවෙත් ක්‍රමානුකූලව ද පිළිගත් න්‍යායන්ට අනුකූලව ද, සැදැහැවතුන්ගේ පූර්ණ දායකත්වය මත මනා පිළිවෙලකින් සිදුකිරීම තුළින් දේව වරප්‍රසාදයන් වඩ වඩාත් පූර්ණ කිරීම.

★ සහභාගිශීලි සභාවේ පරිපාලන ව්‍යුහය : කිතුනු පවුලේ වත්මන් ස්වභාවය හා එය ගොඩනැගීම කිතුනු ඒකක හා දේවස්ථාන සංඝය, ආශිර්වාදකාර බන්ධනය තුළ අර්ථවත් ජීවිතයක් ගොඩනැගීම.

★ ජනසන්නිවේදනය : සභා කාර්යය තුළ මෙම අංශය යොදාගන්නා අයුරු.

★ පදවි දූත සේවාවන් : පදවි ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වන ආකාරය, සභාව නඩත්තු කිරීම.

★ යුක්තිය, සාමය හා මානව සංවර්ධනය

★ බයිබල් අපෝස්තලික සේවාව, ධර්මදානය

★ ළමා පරපුර / අධ්‍යාපනය / ධර්මෝපදේශය

★ පූජක පැවිදි දූත සේවාව : ජනතාවට දහම් පෝෂණය ලබා දෙන පූජක - පැවිදි පිරිස් වෙත ද මනා ආධ්‍යාත්මික පරිපූර්ණත්වයක් ලබා දීමේ අවශ්‍යතාවය අවධාරණය කරන රදගුරුතුමා, දැනට ඉදිකරනු ලබන දෙමහල් ගොඩනැගිල්ලේ ඉහළ මාලය ඒ සඳහා වෙන් කිරීමට නියමිතය.

★ ගිහියාගේ ආධ්‍යාත්මිකත්වය හා යැදුම් දිවිය

★ ආගමික සුහදතාවය : දැනට ඇති සුහදතාවය අගයමින් වර්ධනය කිරීම, බහුතල අන්‍යාගමික ජනතාවක් ඉදිරියේ ලවණක් වන්නට මඟ පෑදීම.

★ තරුණ පරපුර : ක්‍රිස්තුන් වහන්සේගේ පරමාදර්ශය මත පිහිටා උන්වහන්සේගේ වටිනාකම්වලින් තරුණ ජීවිතය හැඩගස්වා සාරධර්මවලින් පිරිපුන් අනාගත සභාව ගොඩනැංවීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා නව සිතුම් පැතුම් ඔස්සේ ඔවුන්ගේ ජවය ප්‍රයෝජනයට ගත යුතුව ඇත.

වත්මන් රදගුරු හිමිපාණන්, සිය දහම් යාත්‍රාව "දියඹට දියත් කිරීමට " සැලසුම් කළේ යථෝක්ත සියලු අංශයන් වෙත සියුම්ව කිඳා බැස වෙන වෙනම ගැඹුරට ගෙන යාම සඳහාය. උන්වහන්සේගේ නිල කාර්යයෙහි ප්‍රතිඵල පියෙවි නෙතට අද දක්නට නැතත්, ඉදිරි වසර විසි පහ තුළ දී පදවියේ ජන ජීවිතය තුළින් සමාජය තුළින් දැක ගත හැකිවන බව උන්වහන්සේගේ ඒකායන විශ්වාසයයි. දැනට අප පදවිය තුළ ඒ සඳහා ගිහි පැවිදි සබැඳියාව, කිතුනු සංඝ තුළ එකමුතුව, අන්තර් ආගමික සහජීවනය යනාදිය තුළින් නිර්මාණය වුන පසුතලයක් තිබීම එහි හොඳ පෙර නිමිත්තකි. මේ වන විට රදගුරුතුමා ඒ සියලු අංශයන් කෙරෙහි පෞද්ගලිකවම අවධානය යොමු කරවමින් අවශ්‍ය භෞතික සම්පත් ලබාදීමට කටයුතු යොදා ඇත.

මෙ ක්‍රියාවලිය එක්තරා අභියෝගාත්මක ගමනක් බව ද උන්වහන්සේගේ අදහසයි. ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රබල ඉගැන්වීම් අපගේ මිනිස් දුබලතාවයන් තුළ ක්‍රියාත්මක කිරීමේ දී විශාල අරගලයක යෙදිය යුතුව ඇත. නවීන ලෝකයේ බාහිර දේ කෙරෙහි කාර්ය බහුල වන අප, ඕනෑම අභියෝගයක් - පොරබැදීමක් දෙවියන් වහන්සේ තුළ ජයගත හැකිය. විශ්වාසයේ දහමක් වන අපේ දහම ඉදිරියට ගෙන යන විට පරම්පරාවෙන් පරම්පරාවට අප ඇතුළු වන්නේ විශ්වාසයෙන් ශක්තිමත් වීමටයි.

දහසය වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පාප් වහන්සේ විසින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි, අපගේ ජුබිලි වසරෙන් පසුව පා තබන්නේ "විශ්වාසයේ වසරටය" පදවියේ සියලුම සංවර්ධනයන්හි අවසාන ඉලක්කය වනුයේ ස්වර්ගීය ජීවිතය බැවින්, ඒ සඳහා ආත්මික පරිපූර්ණත්වය ලබා ගැනීමට මෙය හොඳම අවස්ථාවක් බව රදගුරුතුමාණන්ගේ අදහසයි.

*කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන් සමග කළ සාකච්ඡාවක් ඇසුරින්..*

**සකස් කළේ :**

කුරුණෑගල පදවි ජනසන්නිවේදන අධ්‍යක්ෂ

**ගරු ජේරල්ඩ් ප්‍රනාන්දු පියතුමා**

## කුරුණෑගල පදවියේ රජත ජයන්තිය වෙනු

# කුරුණෑගල

# රජත ජයන්ති









"ජුබිලිය" ප්‍රීතිදායක මොහොතකි. ජුබිලි වසර යනු දෙවියන්සේට විශේෂ අයුරින් කැප කරන ලද කාල පරිච්ඡේදයකි. අපගේ දැහැමි ක්‍රියාවන් බලා දෙවියන් වහන්සේ අප ගැන ප්‍රසන්න වන කාල පරිච්ඡේදයකි..." (ලෙවී ව්‍යවස්ථාව 26:3-6). කුරුණෑගල පදවිය දෙවිඳුන් ඉදිරියේ, අභිමානවත් ලෙස, පදවියක් වශයෙන් කැපවී, ධර්ම පෝෂණයෙන් සුපෝෂිතව විසිපස්වන වසරට පා තබද්දී, එනම් 2011 වසරේ මැයි මස 01 වන දින වර්තමාන පදවි එඬේරාණන් වන අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා රාජගුරුප්‍රසාදින් වහන්සේ විසින් කුරුණෑගල ආසන දෙව්මැඳුරේ දී "ජුබිලි වසර" ප්‍රකාශයට පත් කළහ.

ඉන් පසුව ජුබිලි වසර තුළ දියත් කළ යුතු වැඩසටහන් පිළිබඳව ජුබිලි කමිටුවක් පත් කොට සාකච්ඡාවට බඳුන් විය. එහිදී ගත් තීරණ අනුව අදාළ වැඩපිළිවෙල අංශ 3කින් සමන්විත විය.

★ අධ්‍යාත්මික පෝෂණ ක්‍රියාවලිය

★ ධර්මදානීය ක්‍රියාවලිය

★ සිහිවටන ව්‍යාපෘතිය

### ★ ආධ්‍යාත්මික පෝෂණ ක්‍රියාවලිය

මෙම තේමාව යටතේ විශේෂ අවධානයක් යොමු කරන ලද්දේ මීසම් කේන්ද්‍ර කරගෙන කිතුනු ඒකක වඩාත් ශක්තිමත්ව ගෙ ාඩනැංවීමයි. අනෙකුත් අපොස්තලික කමිටු, ඒ හා බද්ධ වී තිබෙන බැවින් ඒවා සාර්ථකව ක්‍රියාත්මක කරගැනීමට කිතුනු ඒකක ශක්තිමත් විය යුතුයි. ඒ බැව් මීසම් තුළ අවධාරණය කිරීම සිදුවිය යුතුයි. ඒ හැර පවුල් බැහැදැකීම, විශේෂයෙන් පසුබට වී සිටින පවුල් ගැන විශේෂ අවධානය යොමු කිරීම, දිව්‍ය හෘදයට පවුල් කැප කිරීම, මීසම් මට්ටමින් දිව්‍ය සත්ප්‍රසාද උළෙල පැවැත්වීම, යනාදිය යෝජනා විය. විවිධ පෝස්ටර්, බැනර් පදවිය පුරා ප්‍රදර්ශනය කරමින් ජනතාව අව සිදුවිය.

### ★ ධර්මදානීය ක්‍රියාවලි

වාර්ෂික නුවාන අවස්ථාවන්හිද විවිධ ක්‍රියාත්මක කිරීම (අ සේවාවන් මඟින් මෙ හැකිය) සමිති සමාග විවිධ අපෝස්තලික සාමුහිකව කටයුතු කි ඇබ්බැහිවීම් වලට ල උපදේශන සේවා ල ක්ෂේත්‍රවල නියුතු ප්‍ර (ව්‍යාපාරික, වෛද්‍ය, නීතිඥ, පරිපාලන, ක වශයෙන්) හා. ජුසේ ජීවිතාදර්ශය නව පර දීම මේ යටතට ගැ

### ★ සිහිවටන ව්‍යාපෘති

මීසම් මට්ටමින් සිහිවටන නිවාස ඉදි රැකියා සහායට අර් උදව්දීම, වාරියපොළ

# මේ පුංචි භූමි භාගය තුළ දේ

1987 වර්ෂයේ මැයි මාසයේ උපත ලැබූ, කුරුණෑගල අප රදගුරු වසම වසර 25 ක සැතපුම් කණුව පසුකරන සුවිශේෂී මොහොතට අපි ළඟා වී සිටිමු. ජුබිලි මහෝත්සවය කරා ළඟා වීමට අප වසරක් පුරා දැවැන්ත ක්‍රියාදාමයක යෙදුනෙමු. 2011 මැයි මස පළමු දින සිට ජුබිලි වසර ආරම්භ කිරීමත් සමග ජුබිලි වසර සඳහා විවිධ වැඩසටහන් හඳුන්වා දුන්නෙමු. ඒ අතර ප්‍රධාන වශයෙන් ධර්මදානීය ව්‍යාපෘති, ආධ්‍යාත්මික ප්‍රවර්ධන ව්‍යාපෘති සහ සිහිවටන ව්‍යාපෘති වශයෙන් මීසම්වල දියත් කිරීම සඳහා විශේෂ වැඩසටහන් හඳුන්වා දුන්නෙමු.

බොහෝ මීසම්වල ඒ ව්‍යාපෘති පදනම් කොටගෙන විවිධ මට්ටමේ වැඩසටහන් දියත් කළ වග ගරු මීසම් සේවක පූජාප්‍රසාදින් වහන්සේ මඟින් අපි දැනගත්තෙමු. තවද 2012 වසර උදාවත්ම පවුලේ අම්මා, තාත්තා, දරුවන්, තරුණ තරුණියන් සඳහා දියත් කළ වැඩසටහන් ඉතා සාර්ථක මට්ටමින් මීසම්වල ක්‍රියාත්මක වී ඇත. ඒ සංවිධාන කටයුතුවල යෙදුනු ගරු පූජාප්‍රසාදින් වහන්සේලා, පැවදි සොයුරියන් සහ ගිහි නායකයින් සැමදෙනාට මාගේ කෘතඥතාව පලකරනු කැමැත්තෙමි.

එසේ කරමින් අප පවුල් වශයෙන් කට්ටිමහන පුදබිමට එක්රොක් වීමට සූදානම් වූයෙමු. පදවි පවුලක්, සංඝයක් ලෙස අපි 2012 මැයි මස 12 කට්ටිමහන සා. ආනා පුදබිමට එක්රොක් වන්නේ ඉමහත් බලාපොරොත්තුවකින් දේව ස්තෝත්‍ර ගායනා කරන්නටයි. ක්‍රිස්තියානි ජීවිතය බලාපොරොත්තුවේ ජීවිතයක් බව දේව වචනය අපට හැමවිටම මතක් කරදෙයි. අප මෙලොව ජීවත් වුවද , අප අරමුණ විය යුත්තේ මතු ජීවිතයයි. දෙවිඳුන් තුළ ගෙවන ඒ සදාකාලික ජීවිතය සඳහා අපව සූදානම් කරමින් වන්දනා ගමනක

කුරුණෑගල ජීවත්වන අපට ද ගමනේ සුවිශේෂී 25 වන සැතපුම් වී ඇත. මෙම ජු මහෝත්සවයකින් අපගේ පරමාර්ථ පසක් කර ගත යු

එහෙත් ඉදිරි ජවය සොයා ගැ සහ දේව අනුග්‍රහ මෙය මහෝපකාරි ලෙස සකසා ගැ ඒ මන්දයත්, ශුද්ධ පෙන්වා දෙන්නෙ යනු දේව වරප්‍රසා කාල පරිච්ඡේදය වරප්‍රසාදයෙන් අ පුරවාලන්නට ශුද් වහන්සේට ඉඩහ පළාතේ සුළුතරය ජනගහනයට සැ

...වෙන් පිදෙන තිළිණයක්

# ...පදවියේ ...මහෝත්සවය





පදවි පරිපාලන නාහිමි අතිගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා

...දි කිරීමක් ද

### ...ලිය

- මංගල්‍ය ... වැඩසටහන් ...පෝස්තලික ...ය සිදුකළ ...ම් පිහිටුවීම, ...සේවාවන් ...රීම, විවිධ ...ක්වූවන්ට ...බා දීම, විවිධ ...ජාව හමුවීම. ... ඉංජිනේරු, ...ලා යනාදි ...වාස් පිය ...පුරට හඳුන්වා ...ීන.

### ...ය

...ජුබිලි ...කිරීම, ස්වයං ...ක මට්ටමින් ... එළිමහන්

සිරකඳවුරට යාච්ඤා කුටියක් ලබාදීම, දක්ෂ දිළිඳු ළමුන්ට ශිෂ්‍යත්ව ලබා දීම, ළමා නිවාස වලට ආධාර ලබා දීම. අපෝස්තලික සේවාවන්හි යෙදෙන ගිහි - පැවදි පිරිස් ඇගයීමට ලක් කිරීම, වැනි කටයුතු මේ මඟින් සූදානම් කරන ලදි. ඒ හැර ජනසන්නිවේදන අධ්‍යක්ෂ ගරු ජෙරල්ඩ් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් විශේෂ ජීවිතාලෝක වැඩසටහන් මාලාවක් පදවිය පුරා පැවැත්වීමට කණ්ඩායමක් සූදානම් කරන ලදි. එදිනෙදා ජීවිතයේ දී දේව ධාර්මික මෙන්ම ආධ්‍යාත්මිකත්වයක් ඇතිව කටයුතු කිරීමට, පන්නල දේව ධර්ම නිකේතනයේ සිසු - සිසුවියන් යොදාගෙන කණ්ඩායම් සූදානම් කෙරිණි.

මෙම කටයුතු සිදුවෙද්දී 2012 වසර උදාවත්ම. ජුබිලිය සඳහා පවුල් සූදානම් කිරීම කඩිනම් විය. ජනවාරි, පෙබරවාරි, මාර්තු සහ අප්‍රියෙල් යන මාස හතර මව්වරුන්ට, පියවරුන්ට දරුවන්ට සහ තරුණ තරුණියන්ට වශයෙන් වෙන්කර මීසම් මට්ටමින් ඒ ඒ මාසය තුළ දී ජනවන්දනාව තුළ සහ ඉන් බැහැරව දියත් විය. ඒ පිළිබඳ විස්තරාත්මක අත් පත්‍රිකාවක් ද බෙදා හැරිණ.

### ★ ජුබිලි උළෙල

2012 මැයි මස 12 දා කට්ටිමහන ශා. ආනා පුදබිම මෙම ඓතිහාසික උලෙළ සඳහා සූදානම් වෙමින් පවතී. පසුගිය වසර 25 තුළ දී දෙවියන් වහන්සේ විසින් අප පදවි ජනතාව වෙත දානය කළ ආසිරි වරම් වෙනුවෙන් තුති ප්‍රශංසා කිරීමේ අරමුණෙන් පදවියක් වශයෙන් එක්වන්නට. පවුල් පිටින් "වන්දනා ගමනක්" ලෙස යන්නට ඉතාම උද්යෝග යෙන් සැදී පැහැදී සිටින බව කිව හැකිය.

මෙම ජුබිලි සැමරුම් උලෙළ ඉතා හරසරින් පැවැත්වීමට පූර්ව සංවිධාන කටයුතු සිදුවෙමින් පවතී. එදින ආරාධිතයන් වන අපගේ පෙර පදවිය වූ හලාවත පදවි රදගුරු අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් ද, විශ්‍රාමික රදගුරු අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන් සහ කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන් ද පිළිගෙන පෙරහරෙන් දෙව්මැඳුරු භූමිය කරා පැමිණීමට නියමිතයි. මෙම පෙරහැර, වසර 25 ක් තුළ පදවියේ ධර්මදූත සේවාවේ යෙදුනාවූ සැදැහැවතුන්ගෙන් සමන්විත වන අතර අනාගත සභාව වන තරුණ තරුණියන් හටද එහි සුවිශේෂී ස්ථානයක් හිමිවේ.

අනතුරුව තුති පිදීමේ දිව්‍ය යාගය කුරුණෑගල අප රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන අතර, එය දේශීය සංස්කෘතික ලක්ෂණ වලින් සමන්විතව දමිළ සහ සිංහල සියලු සැදැහැවතුන් හට ඒකාත්මික විය හැකි ආකාරයෙන් සිදුකෙරේ. ඉන්පසු කෙටි උත්සවයක් හා උපහාර පිදීමක් පැවැත්වේ. පසුගිය කාල සීමාව තුළ පදවියේ පෙරග මන වෙනුවෙන් අපෝස්තලික සේවාවන් තුළ පෙරමුණ ගෙන විශාල ශක්තියක් ලබා දුන් ගිහි ජනතාවට හා පූජක - පැවදි සැමටත් මෙහිදී උපහාර පිදේ. වසර 25ක ආශිර්වාදලත් සංවර්ධනාත්මක ගමන් මග පිළිබඳව ආවර්ජනයක් කිරීමට ද නියමිතය.

පදවිය ගොඩනැංවීමේ දැවැන්ත ක්‍රියාවලිය මෙහෙයවීමට, කාර්යක්ෂම ලෙස එඩේරික නායකත්වය දුන්, විශ්‍රාමික රදගුරු අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන් වෙත විශේෂ උපහාරයක් පිදීමට ද කටයුතු යොදා ඇත.


පැමිණ සිටින සියලුම බැතිමතුන් වෙනුවෙන් තේ පැන් සංග්‍රහයක් ද සූදානම් කර ඇත.

මරිය මාතාවන්ට කැප කර ඇති ලස්සන මැයි මාසයේ දී, එතුමියගේ මෑණියන්ගේ පා සෙවන වූ කට්ටිමහන පුදබිමේ දී මීසම් 31 ක් නියෝජනය කරමින් සමස්ත පදවි ජනතාව, පූජක, පැවදි සැවොම හා එක්ව එකම පවුලක් සේ තුති පැසසුම් පුදන මෙම දිනය සමිඳුන්ට ප්‍රසන්න දිනයක් වනවා නොඅනුමානය. තවදුරටත් ඉදිරියේ දී පදවියක් වශයෙන් අඛණ්ඩව දේව විශ්වාසයේ ගමනක් නොනිමි ගමනක් යන්නට පදවි ආරක්ෂිකාව වූ සාන්ත ආනා මවුන්ගේ මධ්‍යස්ථකමත්, දෙවි සමිඳුන්ගේ ආශිර්වාදලත් ශක්තියත් නොඅඩුව ලැබේවායි මෙම මහෝත්සවයේ දී එකාවන්ව ප්‍රාර්ථනා කරමු.

*(තොරතුරු ලබා දුන් පදවි පරිපාලන නාහිමි අතිගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමාට ස්තුතිය හිමිවේ)*

සැකසුම
**ජසින්තා සපරමාදු**
කුරුණෑගල පදවි
ජනසන්නිවේදන පර්ෂදය

# ...ේව රාජ්‍යය ගොඩනගන්නට අපගේ දෑත් එක්කරමු.



... යෙදෙයි. ...රදගුරු වසමේ ... මේ වන්දනා ... මංසංධිය තුළ ...කනුව සම්මුඛ ...බිලිය හුදෙක් ... නිමාවට පත් කිරීම ...ය නොවන වග ...තුයි. ... වසර ගණනාවකට ...හීමටත්, ශක්තිය ...ය අත්දැකීමටත්, ...රී වන අවස්ථාවක් ...හීමට අවශ්‍යය. ... බයිබලය අපට ...ත් ජුබිලි වසර ...දයෙන් පිරි ...ක් ලෙසය. දේව ...ප පදවිය තව තවත් ...ධාත්මයාණන් ...රිමු. වයඹ ...ක් වූ කතෝලික ...බෑ ලවණක් වන්නට සහ ආලෝකයක් වන්නට තැබූ පියවර ශක්තිමත් කර ගැනීමට උත්සාහ කරමු. මේ පුංචි භූමි භාගය තුළ දේව රාජ්‍යය ගොඩනඟන්නට අපගේ දෑත් එක්කරමු.

ඒ දේව රාජ්‍යයේ වටිනාකම් ගොඩනගන්නට උත්සාහ කරන අපට "ගැඹුරට දියත් කරමු" යන අප පදවි වැඩ සැලැස්ම මහඟු තෝතැන්නක් සේ මම දකිමි. අප ආධ්‍යාත්මික ජීවිතයේ ගැඹුර කරා ගමන් කිරීමට අපි එක් එක්කෙනා අධිෂ්ඨානය කර, සංඝ වශයෙන් එකට අත්වැල් බැඳගනිමු.

ගතවූ වසර 22 පමණ කාලයක්, විශ්‍රාමික අප ආදර අති උතුම් රේමන්ඩ් පීරිස් රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ නායකත්වය තුළ ළඟා කරගත් ධර්මදානීය අරමුණු සහ ලබාගත් ජයග්‍රහණයන් පිළිබඳව මම කෘතවේදීව මෙනෙහි කරමි. කුරුණෑගල රදගුරු වසම තුළ ධර්මදාන මෙහෙවර දියත් කරන්නට එක සිතින් සම්මාදම් වූ සියලුම පූජාප්‍රසාදින් වහන්සේලාව සිහිපත් කරමි. එසේම ගරු පැවදි සෙහොයුරු සොහොයුරියෝ සහ ගිහි සැදැහැවත් සියලු දෙනාව ද සිහිපත් කරමින්, වර්තමානයේ ද ඒ ධර්මදූත මෙහෙවර අඛණ්ඩව සිදුවනු දැක්ම සන්තෝෂයට කාරණයක් බව සඳහන් කරමි.

දෙවන වතිකාන කතිකාව නිමවී වසර (50) පනහක් ගෙවීම ද, කතෝලික සභාවේ ධර්මෝපදේශය බිහිවී වසර (20) විස්සක් පිරීම ද, නිමිති කොටගනිමින් 16 වන බෙනඩික් අප ශුද්ධෝත්තම පියතුමන් 2012 ඔක්තෝබර් මාසයෙන් එළැඹෙන ඉදිරි වසර විශ්වාසයේ වසර ලෙස නම් කිරීමට නියමිතය. ශුද්ධෝත්තම පියාණන්ගේ අධිෂ්ඨානය සාක්ෂාත් වීමට පිටිබලයක් ලබාදීමට අප රදගුරු වසමේ ක්‍රියාදාමයන් යෝග්‍ය වනු ඇත. ඒ මන්ද අප ආධ්‍යාත්මික ගැඹුර සොයා පසුගිය වසරේ ඇරඹි ගමන විඩාබර ගමනක් නොවීමට විශ්වාසයේ වසරේ සුදොතුම් පිය මාර්ගෝපදේශකත්වය ඉමහත් වරප්‍රසාදයකි.

ශුද්ධවූ ආනා මෑණියනි, අප පදවි ආරක්ෂිකාවෙනි, ඔබතුමියගේ දයාබර දියණිය වන දේවමාතාවන්ගේ මැදිහත්කමින් විශ්වාසයේ ජීවිතයේ දියඹ කරා ගමන් කිරීමට අපට පිහිට වුව මැනව.

*මෙයට,*
*කිතු සමිඳුන් තුළ*
**අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා**
වයඹ පළාත් - කුරුණෑගල කතෝලික රාජගුරුප්‍රසාදින් වහන්සේ

කලා සංග්‍රහය

# මුතු පුරයේ 'පහන් තරුව'

ශ්‍රී හිඳුකුලසූරිය මනුවෙල් දියෝගු පීරිස් ක්ලාරා පීරිස් යුවළගේ කුළුදුල් දරුවා උපත ලදුයේ 1897 දෙසැ. 27 හලාවතදීය. මේ ළදරුවා එඩ්මන්ඩ් නමින් බෞතිස්ම ස්නාපනය ලැබීය. එතුමාට වයස අවුරුදු 6 වන විට 1903 දී එතුමාගේ මෑණියෝ ස්වර්ග ස්ථ වූහ.

1918-1924 දක්වා බොරැල්ල ශාන්ත බර්නාඩ් දෙව්සත්හලේ පූජක තුමකු වීමේ අදිටනින් අධ්‍යාපනය හැදෑරීය. එහිදි තම අධ්‍යාපනය නිසි ලෙස සම්පූර්ණ කර ආචාර්ය මඬුල්ලේ, විශ්වාසය හා බලාපොරොත්තු සපල කරමින් 1924 ජනවාරි මස පූජක වරම් ලැබුයේය. 1926-1927 දක්වා බොරැල්ල පූජක සිසුහලේ අදියුරු වූ එතුමා 1933-1937 ලන්ඩන් විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදි උපාධිය හැදෑරිය. 1937-1946 බොරැල්ල දෙව්සත්හලේ අදියුරු වූ අතර පසුව අභිෂේකය ලබන තුරු කොළඹ සා. ජෝශප් විද්‍යාලයේ ආචාර්යවරයකු ලෙස සේවය කළේය. ග්‍රීක, ලතින්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා 5 ක් ඉතා හොඳින් දැන සිටි විශාරදයෙකි.

1939 වයඹ පළාත කොළඹ පදවියෙන් වෙන්කොට හලාවත කේන්ද්‍රකොටගත් වෙනම පදවියක් වශයෙන් පත්කරනු ලැබීය. 1939 ජනවාරි 5 වැනි දිනැති අඩ් කතෝලිතුම් නෝමෙන් නමැති ශුද්ධාසන නිවේදනයෙන් මෙම හලාවත පදවිය ස්ථාපනය කිරීමට තුඩුදුන් හේතුන් මෙලෙස සඳහන් වී තිබේ.

'ශ්‍රී ලංකීය කිතුනු සභාවේ වැඩි දියුණුවද, විශේෂයෙන් සුවිසාල කොළඹ අගරදගුරු පදවිය, මේ මෑත යුගයේදී ලබා ඇති දියුණුව දුටු අපි කොළඹ පදවිය බෙදා වෙන්කොට හලාවත නව පදවිය ස්ථාපනය කිරීමට තීරණය කළෙමු. ඒ අනුව අපට අපවෙත පැවරි ඇති නිලබලය පිට මුළු වයඹ පළාත ලෙස ගැනෙන භූමි ප්‍රදේශය කොළඹින් වෙන්කොට නව රදගුරු වසමක් ලෙස නිළ කරන අතර එහි ප්‍රධාන නගරය වන හලාවත නමින් මේ පදවිය නම් කරන ලෙසට නියෝග කරමු' තවද මේ නව පදවිය ශ්‍රී ලංකාවේ සිටින පදවි පූජක වරුන්ගේ භාරයට පමුණුවන්නෙමු. තවදුරටත් මෙම හලාවත නගරයේ දැනට තිබෙන කාර්මෙල් මාතාවනට කැපකර තිබෙන දෙව්මැඳුර මේ නව පදවියේ ආසන දෙව්මැඳුර ලෙස නිල කරමු.

සාමාන්‍ය සිරිතට අනුව නව පදවියක් ආරම්භ කිරීමත් එහි ප්‍රධාන ඥාණගෙ ්පාලයා පත් කිරීමත් එකවර සිදුවිය යුතුයි. එනමුත් මෙහි පළමු රදගුරු නිලයට නම් කරනු ලැබූ මරිය නිකායික මොන්: ඇලෝසියුස් ගරු පියනම ස්වර්ගස්ථ වූයෙන් හලාවත කොළඹ අගරදගුරු හිමිපාණන්ගේ පාලනයට තාවකාලිකව ස්ථාපනය කිරිමට ශුද්ධාසනය තීරණය කළේය. 1939 අප්‍රේල් 29 වැනි දින නව ආසන දෙව්මැඳුරේ මහත් උත්සවශ්‍රීයෙන්, මෙම නව පදවිය ප්‍රකාශයට පත්කර මරිය නිකායික අතිගරු ජේ. ඇම්. මසොන් අගරදගුරු හිමිපාණන්ට එහි භාරකාරත්වය පිළිගැණින.

1940 ජනවාරි 12 වන දින හලාවත පළමු පූජක තුමාවූ මරිය නිකායික ගරු එඩ්මන්ඩ් පීරිස් පියතුමන් හලාවත රදගුරු තනතුරට නම් කරනු ලැබුවේය. 1940 අප්‍රේල් 25 දින ප්‍රථම සිංහල රදගුරු තුමා ලෙස පත්විය. 1972 දෙසැම්බර් මස 27 දනි රදගුරු පදවියෙන් විශ්‍රාම ලැබීය.



රදගුරු හිමිපාණන්ගේ ශාස්ත්‍රිය සේවාවන්
- ✦ ශු. මැතිව් තුමගේ සුවිශේෂය ග්‍රික් භාෂාවෙන් සිංහලට පෙරළීම.
- ✦ පූජා පොත ලතින් බසින් සිංහලට පෙරළීම
- ✦ දෙව්මව් පුවත
- ✦ මහෝත්තම චරිතය (ක්‍රිස්තු චරිතය)
- ✦ ශ්‍රී ලංකාවේ මුල්ක්‍රිස්තියානි යුගය (පෘතුගිසි බසින් සිංහලට)
- ✦ මග සලකුණ අප්‍රකට එකම මුල් පිටපතින් සංස්කරණය කළ සිංහල සංදේශ කාව්‍යයකි. මෙය සොයා ගැනීමේ ගෞරවයද එතුමන්ට හිමිවිය.
- ✦ සිංහල ක්‍රිස්තියානි සාහිත්‍යවංශය (ඉංග්‍රිසි බසින්)
- ✦ මරිය බැතිය (ඉංග්‍රිසියෙන්)
- ✦ සාන්ත ආනා දේවස්ථානයේ ඉතිහාසය (ඉංග්‍රිසියෙන්)
- ✦ සාන්ත ආනා දේවස්ථානයේ ඉතිහාසය (සිංහලෙන්)
- ✦ සාන්ත ආනා දේවස්ථානයේ ඉතිහාසය (දෙමලෙන්)
- ✦ බෝලවත්තේ ඉතිහාසය (භාෂා තුනෙන්ම)
- ✦ ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමන්ගේ කෘතින් 6 ක් පමණ සංස්කරණය කිරීම (ඉංග්‍රිසි පරිවර්තන)
- ✦ මහනුවර ගිවිසුම 1815

අධ්‍යාපනික සේවා
- ✦ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලීය පෙරදිග භාෂා කමිටුවේ සාමාජික
- ✦ අධ්‍යාපන ප්‍රකාශණ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස
- ✦ විශ්ව විද්‍යාල මන්ත්‍රණ සභා සාමාජිකයකු ලෙස
- ✦ සාහිත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු ලෙස
- ✦ සිංහල ශබ්ද කෝෂයේ උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු ලෙස
- ✦ රජයේ ලේඛනාගාරයේ උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු ලෙස
- ✦ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සංගමයේ සභාපති ලෙස දෙවරක්ම පත්වීම
- ✦ භක්ති ප්‍රබෝධන සඟරාවේ කර්තෘ
- ✦ සමාජ සාමයේ සඟරාවේ කර්තෘ

කිතුනු ගී සේවාව
- ✦ සිය පෙළපතින් උරුම කරගත්, පෙරදිග ගායනා ක්‍රමය නාඩගම් ගී, බටහිර සංගීතය යනාදිය පිළිබඳව නිපුණතාවය
- ✦ 1941 රචනා කළ 'ගී කළඹට' ගී 16 ක් උන්වහන්සේ රචනා කළසේක.
- ✦ වඩිනු දෙව්මැසියා, සන්තානම් මෑණියනි, මෙන්ම සැම ගොබ් ඉරිදාවකම සැම දෙව්මැඳුරකම ගැයෙන ජයවේ ජේසුනි.
- ✦ 1966 සත්ප්‍රසාද සමුළුවට ගැයීමට සූදානම් කළ 'නමා සිරස බැතියෙන්' සහ 'තාන්තුම් එර්ගෝ සිංහල ගීතිකාව ආ උතුම් මේ අභිරහස

පරිවර්තන ගීතිකා
- ✦ Music Le mintier Adagio (ලෝපාප දොස් නිසා තුවාල වු හදෙනි) ප්‍රංශ භාෂාවෙන් සිංහලට පරිවර්තනය
- ✦ Melody Gloria Dieu (ජයවේ ජේසුනි) පරිවර්තන වචන පීරිස් රදගුරු තුමා Rev. Fr. Edmand Peiris O.M.I (අප පව් බැමි මිදු මනුදෙව් කුමරිඳු තම ශ්‍රී පණ පිදු කුරුසිය නිතිවඳු) වචන S. D. Marcilino F. B Music by Rev. Fr. Edmand Pieris O.M.I (නමෝ බව සිඳු තරුනමා නිති කන්‍ය නමා නමො සග සිරි දෙරනමා නමෝ ගුණ දෙවු මවුනමා) Words by Very Rev. Fr. Jacome Gonzalves Plain Chant Melody (ශුද්ධිකාග 'නි තැන්හි බොහෝ වේදනා විඳින්නාවූ අනාථයින් ගැන සිත් දයාවෙන් මවුනි වේ කරුණා) Words translated by Rv. Fr. Edmand Piris O.M.I

මේ සා මහත් විශාල සේවාවන් කරමින් තම බැටළු රැළ පෝෂණය කර විශ්‍රාම යන විට තවත් එවැනිම යහපත් එඬේරකුවූ අති උතුම් ප්‍රැන්ක් මාකස් හිමිපාණන්ට තම බැටලු රැල භාරකරමින් ගම්පහ සිරි කුරුස දෙව් මැඳුරේ විශ්‍රාම ශාලාවේ විවේක සුවයෙන් ගත කළ අප මුතුපුරයේ පහන්තරුව 1989 සැප්. මස 17 වන දින මෙලොවේදී වැඩකර එලොව රැස්කළ ධනය සොයා දෙවිඳුන්ගේ රාජ්‍යයට ඇතුලු වූ සේක.

**ක්ලොටිල්ඩා දොන්දීනු ජෑන්ස්**
තල්විල - මාරවිල

# කිතු යාත්‍රා

**සංස්කාරකවරු - ඇන්ටන් ජයසූරිය කුමර නයනජිත්**



වර්ෂ 2007 අප්‍රේල් මස ආරම්භවූ කිතු යාත්‍රා නොමිලේ බෙදාහරින පාස්කු වාර්ෂිකයේ හයවන කලාපය මෙවර පාස්කුවේදී නිකුත් විය. මරණයේ අඳුර බිඳ ජීවිතයට එතෙරවී තේමා කරගත් කිතු යාත්‍රා පාස්කු කලාපයට සුපැතුම් පණිවුඩයක් එක්කරන කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ ජන ජීවිත එතෙර කරන්නට ගන්නා වෙහෙස උත්ථානවූ කිතු සමිඳුන්ගේ ප්‍රසාදයට හේතුවනු ඇතැයි ප්‍රකාශ කරති.


මෙවර කිතු යාත්‍රා පාස්කු වාර්ෂිකයට හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමි, ඥානාර්ථ ප්‍රදීපය කර්තෘ ගරු ශාන්තසාගර හෙට්ටිආරච්චි, තේවත්ත සිද්ධස්ථාන පාලක අතිගරු ප්‍රිය ජයමාන්න, මරියහමුදා ජාතික අධ්‍යක්ෂ ගරු රොනී පොන්සියුස් පෙරේරා පියතුමන් සමඟ ගිහි ලේඛක ලේඛිකාවන් නිර්මාණ සපයා ඇත.

මේ අතර හිනිදුම පූජ්‍ය කලගේ ඤාණාවාස ස්වාමින් වහන්සේ බොදු ඇසින් දුටු පාස්කුව මැයෙන් කෙටි කවි පංතියක් සමඟින් කිතු යාත්‍රා සඟරාවට සම්බන්ධ වෙති.

මෙවර කිතු යාත්‍රා පිටකවරය කටුනේරිය මීසමේ මරිනි තිළිණි පෙරේරා නිර්මාණය කර ඇත. නවක ප්‍රතිභාපූර්ණ ශිල්පිනියකට අවස්ථාව ලබාදීම අගය කටයුතුය. විවිධ බාධක, අවහිර හා කම්කටොළු මැද කිතු යාත්‍රා එළිදක්වන්නට වෙහෙසුණු සංස්කාරකවරුනට අපෙන් සුපැතුම්!

# පාස්කුව

**සංස්කාරක - බැසිල් පොන්සේකා**
**ප්‍රකාශනය - ජනතරණ ප්‍රකාශකයෝ**



'පාස්කුව' නොමිලේ බෙදා හරින වාර්ෂික සාර සංග්‍රහයේ 13 වැනි කලාපය මෙවර පාස්කුවට නිකුත් විය. වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම සාර සංග්‍රහයක් ලෙස අගය කළ හැකි පාස්කුව සඟරාවේ සංවාදශීලි ලිපි කීපයක් හමුවේ.

ගරු රීඩ් ෂෙල්ටන් ප්‍රනාන්දු පියතුමා පාස්කුව හා සමාජ ප්‍රතිපදාව අනුව මානව හිමිකම් හා සම්බන්ධය මැයෙන් ලියා ඇති ලිපිය මෙරට නූතන සමාජ යථාර්ථය කදිමට නිරූපණය කරන්නකි. මේ ලිපියේ ඇති ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් තත්ත්වය ලිපිය වඩාත් සංවාදශීලි නව මානයන් කරා රැගෙන යන්නට මඟ පාදයි.

ජිනීවා දෝංකාරය මැද එළැඹි චතාරිකය මැයෙන් තියබෝල්ඩ් සමරතුංගගේ ලිපියද ජිනීවා සිද්ධිය හා බැඳි සමාජ පසුබිම මතු කැර ගැන්මට ජිනීවා සිද්ධිය හා බැඳි සමාජ පසුබිම මතු කැර ගැන්මට ජනතාව අවදි කරවන සුළු ලිපියකි. මේ හැරුණු කොට පුරා පිටු 93 ක් ඔස්සේ දිගහැරෙන 'පාස්කුව' පාස්කුවේ විවිධ පැතිකඩ හසුකර ගැනීමට දරන වෑයම ප්‍රශංසනීයය. මෙවන් සාර සංග්‍රහයක් නොමිලේ බෙදා දීමට සමත් වීම ගැන නිර්මාතෘ හා සංස්කාරක බැසිල් පොන්සේකා ඇතුලු ජනතරණ ප්‍රකාශකයන්ට තුති මල් පොකුරක් පිදිය යුතුමය. පාස්කුවට අපේ උණුසුම් සුපැතුම්! **මෛත්‍රී**

ෆිලීෂන් අබයකෝන්ගේ

## සුබස 202

### ඒකාන්ත නයනරෝග

ඒක+අන්ත=ඒකාන්ත වුණත් අර්ථය නම් නිශ්චිත හෝ නියතයි. ඒක+ආබද්ධ=ඒකාබද්ධ (එකට බැඳුණු) ඒක+අග්‍ර=ඒකාග්‍ර, ඒක+අංග=ඒකාංග, ඒක+අධිපති=ඒකාධිපති, ඒක+ආලෝක=ඒකාලෝක, ඒක+ආකාර=ඒකාකාර සන්ධි අනුව සම්පාදිත වචනයි. ඒකත්ව, ඒකජාත, ඒකපුත්‍ර, ඒකරාශි ඒකවචන, ඒකපුද්ගල, ඒකච්ඡත්‍ර (එක්සත්) ඒකමතික ඒකච්ඡන්ද (එක කැමැත්ත) ආදිය සන්ධි නොවීම නිසා ඒක ලෙසම දිගටම සිටියි. දෙතුන් දෙනකු මේවාටත් ඒකා කියා කියනු ඇසේ.

එකින්+එක=එකිනෙක, එක්+උන්=එකුන් (එකක් අඩු) එක්+අලු=එකලු (ඒකාලෝක) එක්+ඇස්=එකැස් ලෙස ශුද්ධ සිංහලෙහි දැකිය හැකිය. එක්තරා, එක්සත්, එක්රැස්, එක්රොක්, එක්වන් (එක වගේ) එක්ටැම් ආදිය සන්ධියෙන් තොරය.

නයනා, සුනේත්‍රා, සුලෝචනා ජනප්‍රිය ගැහැනු නම් වුණත් හරි වචන අප්‍රාණවාචී නයන, නේත්‍ර හා ලෝචනයි. නයන+ආරෝග්‍යශාලා = නයනාරෝග්‍ය ශාලාව වේ. ආරෝග+ය=ආරෝග්‍යය නම් ලෙඩ නැතිකමයි. ඇස් රෝහල කීවාට රෝ+හල=රෝහල වෙන තේරුමකි. රෝ නම් රෝෂය (තරහව), රෝගය හෝ රෝගියා ය. රෝහල රෝගීන්ගේ ශාලාව නැත්නම් රෝගීන්ට වෙන්වූ ශාලාවයි.

නයන+අංජන=නයනාංජන, නයන+අභිරාම=නයනාභිරාම (ඇස් පිණවන) නයන+ආනන්ද=නයනානන්ද නයන+ආබාධ= නයනාබාධ වුණේ සන්ධි හේතුවෙනි. නයනජිත්, නයනකාන්ත, නයනරෝග, නයන සායන, නයන සැත්කම, නයන විශේෂඥ ලෙස ව්‍යංජන සමඟ නයන ප්‍රකෘතියෙන්ම තැබිය යුතුය. බොහෝවිට මාධ්‍යවල දකින්නේත් ඇසෙන්නේත් නයන ආ යුතු තැනට නයනාය.

දස පණත මතක තබාගැනීම පහසුය. භාෂාවේ සන්ධි දහය තේරුම් කිරීමත්, තේරුම් ගැනීමත්, නම් දහය සිහි තබාගැනීමත් සිසුනට නම් පීඩාවකි. අ+පරා+ජිත=අපරාජිත, හවුරුදු+ඉ=හැවිරිදි ලෙස වචන කැඩී බිඳී වෙන්වී තේරුම පැදී මතුවී එන ලෙස සරල ක්‍රමයක් හඳුන්වා දිය යුතුය.

162



ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි සොයුරු

ජරා ගොඩක් වැඟුව දාට කුණු ගඳ නවතන්න — බැරිලූ
බීරන්ටත් ඇහෙන්න නම් හෙණ හඬ තරමට — ඕනලූ
උනහපුළුවගෙත් පැටියා උෟට ලස්සනක් — තියේලූ
කුහුඹුවාගෙ සුළු දිය උෟ ගංඟාවක් සේ — දකිලූ

නටන්න බැරි නම් පොලොවත් හුඟක් ඇද — වෙති
උඩින් මිතුරු යටින් කතුරු උගුල් — අටවති
පැණි ඇති තැන ඇඹලයෝ කූඩාරම් — ගසති
පැණි වරකා ගසටත් හෙණ හත — වදිති

ගායනය : (බණ්ඩි) රිප්පුවේ සුවඳ රත්න

බැසිල් ෆොන්සේකා විසිනි

# ඇමෙරිකාවේ ජාතික යාච්ඤා දිනයේදී දේශය දෙවිඳුන් වෙත හැරෙයි

මැයි මස 03 වැනි බ්‍රහස්පතින්දා ඇමෙරිකාවේ ජාතික යාච්ඤා දිනයයි. එදින සියලු ඇමෙරිකානු කිතුනුවෝ එකට එක්ව සිය දේශය හා ජනතාව වෙනුවෙන් විශේෂාකාරයෙන් දෙවිඳුන් වෙත හැරෙති; එතුමන් යදිති. "අපේ දේශය විවිධ අභියෝගයන්ට මුහුණ දෙමින් සිටි.

ජාත්‍යන්තර හා දේශීය ප්‍රශ්න හමුවේ පීඩනයට පාත්‍රව පවතී. එම අභියෝගයන් හමුවේ අප දේශය අධ්‍යාත්මික පුනරෝදයක් කරා යා යුතු කාලය දැන් උග්‍ර වී ඇත." එලෙස අවධාරණය කරනු ලැබුවේ, ඇමෙරිකානු ජාතික යාච්ඤා දිනයේ මහජන සම්බන්ධීකාරක දියොන් එල්මෝර්ය. මැයි මස 03 වැනිදා, ඇමෙරිකාවේ ඒ ඒ නගරවල විශේෂ යාච්ඤා හා සම්මන්ත්‍රණ පවත්වනු ලබයි. මෙලෙස වසරේ එක් දිනකදී, දේශය වෙනුවෙන් යාච්ඤාවේ නිරතවීම කාලයක් පුරා ඇමෙරිකා දේශය තුළ කිඳා බැස ඇති අධ්‍යාත්මික අත්දැකීමකි. ප්‍රථම ජාතික යාච්ඤා දිනය පිළිබඳ අදහස් බිහිවූයේ 1775 දීය. වාර්තා වී ඇති පරිදි වර්ෂ 1952 දී වසරේ මැයි මාසයේ ප්‍රථම බ්‍රහස්පතින්දා දින ඇමෙරිකානු ජාතික යාච්ඤා දිනය වශයෙන් නීතිගත කොට ඇත. "දේශයේ ජාතික නායකයන් විසින් ජාතික යාච්ඤා දිනයක් ස්ථාපිත කොට ඇත්තේ, දෙවිඳුන් විසින් සිය රට නිරන්තරයෙන් ආසිරි ගන්වනු ලබන බැව් ඇමෙරිකානු ජනතාව විශ්වාස කරන නිසා යයි වාර්තා වේ. මේ අනුව පාලකයන් විසින් ද දේවාශිර්වාදය කෙරෙහි රැකී සිටිනා බැව් ජනතාව විසින් ද පිළිගැනේ. වර්ෂයක් වර්ෂයක් පාසා කැරෙන ජාතික යාච්ඤා දිනයේදී දේශයේ නායකයා විසින් ද විශේෂ ප්‍රකාශයක් නිකුත් කරනු ලැබේ. මේ අනුව ඔබාමා ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබ ඇති මේ වසරේ ජාතික යාච්ඤා දිනයේ තේමාව වනුයේ 'දෙවිඳුන් යටතේ එක් රාජ්‍යයයි' වේ.

## රුසියාව ධනවාදයට එරෙහි බැව් ආගමික නායකයෙක් දකී

ලෝකයේ පවත්නා ධනවාදී ආර්ථික රටාවට විකල්පයක් වශයෙන් රුසියාව ගිණිය හැකි බැව් රුසියානු ඔතොඩොක්ස් සභාවේ මහජන කටයුතු පිළිබඳ ප්‍රධානී වෙසෙවෝල් චැප්ලින් නම් ශ්‍රේෂ්ඨ පූජක උතුමාණන් විසින් පසුගියදා දක්වන ලදී.

රුසියාව, සෝවියට් යුගයේදී යම් ආර්ථික පැවැත්මක් අත්දුටුවත්, දැරූ අදේව දෘෂ්ටිය නිසා දේශය ඉදිරියට ගියේ නැතැයි ද එතුමා විසින් පෙන්වා දෙනු ලැබීය. "මුදල් හා ආර්ථික පදනම් මත පිහිටා ඇති පාලන රටාවන් මුළුමණින්ම සාර්ථක නොවේ. ඒ අනුව නූතන රුසියානු රජය ආර්ථික රටාවන් තුළින් පමණක් මෙහෙයවනු නොලැබීම වැදගත්ය. නූතන රුසියාව ආර්ථික න්‍යායන් තුළ පමණක් ගොඩනැගුණු සමාජ ක්‍රමයක් ලෙසින් ලෝ තුළ ප්‍රකාශ වී තිබීම වැදගත්ය." එතුමා විසින් එලෙසින් ද ප්‍රකාශ කෙරුණි. ලොවපුරා නූතන ආර්ථික අර්බුදයක් පවතින මෙම යුගයේදී රුසියාවේ ආර්ථික රටාව තුළ ජනතාවගේ විශ්වාසය තහවුරු කිරිමේ අරමුණින් මෙම ප්‍රකාශය කරති බැව් ඇතැම් ආර්ථික විශේෂඥයෝ පවසති. එමෙන්ම වර්තමාන පුටින් රජය හා කිතුනු ඇදහිල්ල අතර පවත්නා සංහිඳියා තත්ත්වය ද දේශයේ ආර්ථික ස්ථිර භාවයට රුකුලක් යැයි එබඳු ප්‍රකාශයන් මඟින් තහවුරු කැරෙනා බැව් ද කිතුනු පුවත් වාර්තා කරයි.

## බ්‍රිතාන්‍යයේ රාජකාරී තැන්හි කුරුස පැළැඳීම තහනම්

බ්‍රිතාන්‍යයේ ජාතික ධජයේ කුරුස සළකුණු තුනක් ඇත. එම කුරුස සළකුණු මඟින් බ්‍රිතාන්‍ය ජාතික ධජය විසින් පෙන්නුම් කැරෙන්නේ එංගලන්තය ද ස්කොට්ලන්තය ද වේල්ස් ද අතර ඇත්තා වූ ඒකාග්‍රතාවයයි. එහෙත් යමෙකු රාජකාරියේ නියුක්තව සිටියදී කුරුස සළකුණ පැළඳගෙන සිටියොත් ඔහු හෝ ඇ රැකියාවෙන් නෙරපනු ලැබීමට එම කාරණය හේතු විය හැක.

බ්‍රිතාන්‍යයේ සමාජ තත්ත්වය එසේ වූවත්, දේශයෙ 'රජ හෝ රැජිනිය අනිවාර්යයෙන්ම එංගලන්ත සභාවේ නායක ධූරය දරණු ඇත. දේශයේ කිතුනු පිළිබිඹුව එසේ වූවත් රජය හා පෞද්ගලික අංශයන් විසින් රැකියාවන්ට බඳවා ගැනීමේදී කිතුනුවන් කෙරෙහි කුඩම්මාගේ සැළැකිලි දක්වනු ලබන බැව් කැන්ටබරි හි විශ්‍රාමික අගරදගුරු ජෝර්ජ් කේරි හිමිපාණෝ 'වැටිකන් ඉන්සයිඩර්' පුවත් වලට වාර්තා කළහ.

තම තමන්ගේ කිතුනු ඇදැහිල්ල ප්‍රකාර කුරුස සළකුණු පැළැඳගත් තැනැත්තන් නිරත සේවාවන්ගෙන් ඉවත් කිරීම ඉඳහිට සිදුවන්නක් නොවන බැව් ද වාර්තා වේ. ඒ අය නීතියේ සරණ පතා ගිය ද නීතියෙන් වුවද සිය ආගමික නිදහස තහවුරු කැරෙනා පරිදි තීරණයන් දී නැතැයි ජෝර්ජ් කේරි හිමිපාණන් විසින් පෙන්වා දෙනු ලබයි. එතුමන්ගේ අදහස් හා අනුගත වෙමින් කාර්දිනල් කීක් ඕ බ්‍රයන් හිමිපාණන් විසින් ද පවසනු ලැබ ඇත්තේ, බ්‍රිතාන්‍යයෙහි කුරුස යුද්ධයක් පවත්නා බවයි. කිතු තුමන් වෙනුවෙන් සාක්ෂි දරමින් සැම තැනකදීමැ කුරුසය පැළඳ ගන්නා ලෙසට එතුමා බ්‍රිතාන්‍ය කිතුනුවන්ගෙන් ඉල්ලීමක් කරති.

## දිළිඳු රටවල සේවයට ආධාර පතා මැරතන් තරගයක්

පසුගිය අප්‍රේල් මස 24 වෙනි ඉරිදා සැතපුම් 27 ක මැරතන් දිවුමක් ලන්ඩනයේ පැවැත්විණි. "වර්ජින් ලන්ඩන් මැරතනය" වර්ෂයක් පාසා පවත්වනු ලබන්නේ, දිළිඳු රටවල අසරණ දරුවන් හා ජනතාවන්ගේ ඕනෑ එපාකම් සපුරාලීමට මූල්‍ය හා අනෙක් සම්පත් ඒකරාශි කරනු සඳහාය.

මෙම මැරතනයට සහභාගි වූ සංඛ්‍යාව 27 කි. සහභාගි වුවන් අතර මැදි වයසේ ජෝඩුවක් ද සිම්බාබ්වේ ජාතික විදුහල්පති වරයෙක් ද ජේසු නිකායේ පාසල් වල සිසු දරුවෝ කීපදෙනෙක් ද 67 ක් වයසැති පූජකවරයෙක් ද වූහ. පසුගිය වසරේදී මෙම මැරතන් දිවුමෙන් පවුම් 50,000 කට වැඩි මුදලක් ද වෙනත් සම්පත් ද ලැබී ඇත. මේ වසරේදී ඊට වැඩි ආයකත්වයක් ලැබී ඇති බැව් ද වාර්තා වේ. එම සියළු ආධාර උපකාරයන් මේ වසරේදී ගයනාව, කෙන්යාව, දකුණු අප්‍රිකාව, සිම්බාබ්වේ ආදී රටවලැ දිළිඳු සේවාවන් වෙනුවෙන් යොදනා බැව් මැරතන් ව්‍යාපෘතියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ රිචඩ් ග්‍රීන්වුඩ් විසින් ප්‍රකාශ කරන ලදී. තවද මැරතනයට පසුවද සහභාගි වූ අයගේ නායකත්වය යටතේ වසර පුරා ආධාර උපකාර ලබාගැනීමේ කාර්යයන් හී බොහෝ අය නිරත වන බැව්ද ඔහු විසින් හෙළි දක්වනු ලැබීය. මෙම සත්ක්‍රියාව පිළිබඳ වැඩි විස්තර ලබා ගැනීම සඳහා www.Jesuitmissions.org යන අන්තර් ජාලයට පිවිසෙන්නයි ආරාධනයක් ද වෙයි.

## පකිස්තානයේ ආසියා බිබී නිදහස් කරන්නැයි වීථි ගී හඬ



මේ වසරේ ජූනි මස 14 වැනිදාට ආසියා බිබී මරණීය දඬුවම ලබා තුන් වසරක් සම්පූර්ණ කරයි. එදින රාත්‍රී 12 ට බ්‍රිතාන්‍යයේ පකිස්තාන තානාපති කාර්යාලය ඉදිරිපිටදී සාමකාමී විරෝධතාවයක් හා වීථි ගී ගායනයක් පවත්වනු ලබයි.

සිය කැමැත්තෙන් කතෝලික දහම වැළඳගත් ඇ යළි ඉස්ලාම් දහම වැළඳගත යුතු යයි බලපෑම් කැරුණත් ඇ එසේ නොකළ හෙයින් ඇ අද මරණ දඬුවම හමුවේ සිරබත් වළදයි. එදින පවත්වනු ලබන සාමකාමි විරෝධතා රැළියේදී පකිස්තාන ජාතික ගී රචකයකු මෙන්ම ගායකයකු වන ගමා ද බේලි. ඔබර්පියුස් කණ්ඩායමට එක්ව ආසියා බිබී නිදහස් කරන මෙන් ඉල්ලමින් වීථි ගී ගායනයෙහි යෙදුනහ. ආසියා බිබී ගේ වදන් ඇතුළත් 'ආසියා නිදහස් කරන්න' යනුවෙන් ගීමාලාවක් ඉදිරිපත් කරයි. ආසියා බිබී නිදහස් කරන තුරු "මෙවැනි විරෝධතා දේශයන් හී ව්‍යාප්ත කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. දේශපාලනික හා ආගමික සංවිධාන දැනුවත් කරමින් ආසියා බිබී නිදහස් කිරීමේ කාර්ය මෙතැන් සිට වේගවත් කරනවා. 'ලෙස ප්‍රකාශ කළේ බ්‍රිතාන්‍ය හා පකිස්තාන කිතුනු සංවිධානයේ විල්සන් චවුද්‍රි නම් සම්බන්ධීකාරක වරයාය. තවද 'ආසියා බිබී නිදහස් කරන්න යන වීථි ගී හඬ' දෙස් විදෙස් කරා ගෙන යාමට තීරණය කරති බැව් ඔබර් පියුස් නම් ගායක කණ්ඩායම විසින් ද ප්‍රකාශ කරති.

## ජනාධිපතිගේ ජාතිවාදී ප්‍රකාශන හේතුවෙන් සුඩානය ගිනි ගනී



සුඩානයේ ජනාධිපති ඕමාර් අල බෂීර් විසින් දකුණු සුඩානය ඉලක්ක කොට ජනතාව ප්‍රකෝප කරවන ප්‍රකාශන නිකුත් කිරීම හේතුවෙන් දෙරටේ මායිම් ප්‍රදේශයන් හි ත්‍රස්ත ක්‍රියා උග්‍ර වී ඇත. මේ හේතුව නිසාම සුඩානයේ අගනුවර වන කාර්තූන් හි දේවස්ථානයක් ඉස්ලාම් ත්‍රස්තයන් විසින් පසුගිය සතියේ ගිනි බත් කැරිණි.

එම දෙව් මැඳුර වටා ආරක්ෂාව සළසා තිබුණත් පොලිස් නිළධාරින් බලා සිටියදීම මෙම ගිනි තැබීම සිදුවී දේවස්ථානය සමඟ පූජකයන් පුහුණු කරවන මධ්‍යස්ථානයක් ද ගිනිබත් කොට තිබිණි. ශුද්ධ වූ බයිබල් ග්‍රන්ථ විශාල සංඛ්‍යාවක් ද ගින්නට හසුවී ඇත. තවද අවට පිහිටි වාසස්ථාන හා කඩ සාප්පු ද විනාශයට ලක්විය. එහි ජීවත් වූ කිතුනු ජන කොටස් අන්‍යයන්ගේ රැකවරණය යටතේ පසුවෙති.

සුඩාන ජනතා ආරක්ෂක සංවිධානයේ මහා ලේකම් නබීර් අර්මාන් විසින් කිතුනු මාධ්‍යයට ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ, සුඩාන ජනාධිපති ඕමාර් අල් බෂීර්ගේ ප්‍රකෝපකාරි ප්‍රකාශයන් හේතු කොට ගෙන ත්‍රස්තවාදී ඉස්ලාම් ජනකොටස් විසින් නීතිය අතට ගෙන උතුරු හා දකුණු සූඩානයේ වෙසෙන කිතුනුවන් ඉලක්ක කොට ත්‍රස්ත ක්‍රියාකාරකම් වර්ධනය කරති බවය. පසුගිය වසරේ ජූලි මාසයේදී දකුණු සුඩානය උතුරු සුඩානයෙන් වෙන්වී ස්වාධින රාජ්‍යයක් බවට පත්වූයේ මහජන මතය ප්‍රකාරයි. එහෙත් උතුරු සුඩානය තුළ දකුණු වැසියෝ 500000 ක් පමණ ජීවත් වෙති. ඔවුන්ගේ පුරවැසිභාවය උතුරු සුඩානය විසින් තහනම් කරති අතර ඔවුන් ඝාතනය කිරීමේ ව්‍යාපාරයක් ද ආරම්භ කර ඇති බැව් වාර්තා වේ.

## වැඩිමහල් දරුවන් සතරකගේ කනවැන්දුම් පියා පූජකවරයට



30 වසරක් විවාහ ජීවිතය ගතකළ වැඩිමහල් දරුවන් හතර දෙනකුගේ පියාණන් වන ආජන්ටිනියාවේ අන්තෝනියෝ සල්වදෝර් ද ලකෝවෝ පසුගිය සතියේ පූජකවරයට ඔසවනු ලැබීය. එතුමාගේ බිරිඳ මිය ගියේ වර්ෂ 2007 දීය. ඉන් වර්ෂ දෙකකට පසුව වැඩෙන වයසේදී පූජකවරය සඳහා කලක් උගෙනීමේ යෙදී සිටී ඔහු, යළි එම කැඳවීම අනුව පා නඟන්නට තීරණයක් ගත්තේය. දරු සතරදෙනා ද වැඩිවියට පත්ව ස්වාධීන ජීවිත මං ඔස්සේ ගමන් ගන්නා බැවින් කතෝලික සභාවෙන් ද ඔහුගේ තීරණයට බාධාවක් නොවීය.

එතුමා පූජකවරයට ඔසවනු ලැබුවේ, ඇන්ඩ්‍රූස් ස්ටැනෝවික් රදගුරු හිමිපාණන් විසිනි. ඇත්තෙන්ම අන්තෝනියෝ සල්වදෝර් වර්ෂ 1968 සිට 1972 දක්වා පූජක පුහුණුව සමකාලීනව ලබාගත් ඇන්ඩ්‍රූස් ස්ටැනොවික් අගරදගුරු තුමන් අතින්මැ පූජකවරයට ඔසවනු ලැබීම ඓතිහාසගත සිද්ධියක් විය. "කාලයාගේ අනපේක්ෂිත ක්‍රියාකාරකම් තුළින් වුවද මා පූජකවරය සඳහා එසවීම දෙවිඳුන්ගේ මෙහෙයුමේ ප්‍රාතිහාර්ය ජනක අනාවරණයක් වශයෙන් මා පිළි ගන්නවා." නව පූජක තුමා එලෙසින් ප්‍රකාශ කළේය.

ඇන්ඩ්‍රූස් ස්ටැනොවික් අගරදගුරු හිමිපාණන් විසින් ප්‍රකාශ කරනු ලැබුවේ, ජනතාවන් දෙවිඳුන් කරා ගෙනයාමේ මෙහෙවරට නව පූජකවරයා කැඳවා තිබීම කාලපරාසය අභිබවා යන අද්විතීය සංසිද්ධියක් බවයි.

## මොළේ දුර්වල යයි නූපන් දරුවන් ගබ්සා කිරීමේ තීන්දුවට විරෝධය

මොළේ දුර්වලතාවය නිසා ජීවිත පැවැත්ම අස්ථිර හෙයින් එවැනි නූපන් දරුවන් ගබ්සා කිරීම පසුගියදා බ්‍රසීලයේ මහා අධිකරණය විසින් නීති ගත කොට ඇත. අට දෙනෙකුගෙන් යුත් විනිසුරු මඬුල්ලේ දෙදෙනෙක් පමණක් තීරණයට විරුද්ධ වූහ. තවද මහාධිකරණයේ අගවිනිසුරුවරයා ද එම තීන්දුවට විරුද්ධ වී ඇත.

මෙම තීන්දුව ප්‍රකාශ කිරීමට පෙරාතුව කරන ලද මහජන විමර්ශනයක දී ජනතාවගෙන් 80% ක් එබඳු ගබ්සා කිරීම් වලට විරුද්ධත්වය පානා බැව්ද ප්‍රකාශ වී ඇත. "මොළේ බාධා සහිත නූපන් දරුවන්ගේ පරම දේව අයිතිය ප්‍රතික්ෂේප කරමින් ගබ්සාවෙන් ඔවුන් මරා දැමීම සාපරාධී ක්‍රියාවක් යයි බ්‍රසීලයේ රදගුරු මණ්ඩලය විසින් දැනටමත් ප්‍රකාශයක් නිකුත් කරනු ලැබ ඇත.

"මොළේ බාධාවන් සහිත නූපන් දරුවන්ගේ ජීවිත වුවද රැකදීමේ වගකීම අධිකරණයේ ද වගකීම වෙනවා." මෙලෙස ද පවසා සිටියේ මහාධිකරණ ප්‍රධාන විනිසුරු සෙසාර් පෙට්සෝර් ය. රජයේ තීරණ වලට විරුද්ධවීමට සභා නායකයන්ට අයිතියක් ඇතැයි පහලවී ඇති මතයට විරෝධය පාමින් රදගුරු මණ්ඩලය විසින් පවසනු ලැබ ඇත්තේ, උපන් හා නූපන් ජනතාවගේ අයිතීන් වෙනුවෙන් හඬක් නැඟීමේ අයිතිය සභා ආනයකයන්ගෙන් උදුරා ගත නොහැකි බවයි.

සංවාද මණ්ඩපය

# අරගලයේදී සභා මඟ පෙන්වීම

**"ප්‍රදීපය පුවත්පතේහි ක්‍රි.ව. 2012 මාර්තු මස 04 වන දින "කතෝලික සමාජ සංග්‍රහය" මඟින් මෙහෙය වන තීරුවට ලියන පමුණුගම එන්. එම්. පෙරේරා මහතා පාඨකයාගෙන් මෙන්න මෙහෙම ප්‍රශ්නයක් අසනවා, "ධීවර අරගලයේ දී සභා මඟ පෙන්වීම පල දැරුවාද? යන්න, කී එවැනි ප්‍රශ්නයකට නිසි පිළිතුරු සපයන්නේ නැතිව අහක බලා සිටිය යුතු නැත. ඒ නිසා ශු. සුවිශේෂය ස්ප්‍රීතුව තුළ තම වගකීම විශ්වාසවන්තව සම්පූර්ණ කරන ලෙස දෙවන වතිකාන කතිකාව කිතුනුවන් ගෙන් ඉල්ලා සිටියි." ඒ බව මට සිහිපත් විය. (කතෝලිකයා සහ දේශපාලනය යන පොතේ, 15 වන පිටුව) එය මා පැහැර හරින්නේ නැතිව "ප්‍රදපයේ" සංවාද මණ්ඩපය" භූමිකාවට සැකෙවින් පිළිතුරු ගෙන ඒමට දරණ තැතට සහයෝගය ද ලදහොත්, එය සම්පූර්ණ වූ අයුරු මා දකිනවා.**

## අරගලයට එරෙහි වීම

මෙහිදී ලියුම්කරු මෙසේ කියයි. "එහෙත් තෙල් පාදක කොටගෙන ජන අරගල හට ගත්තේ ශ්‍රී ලංකවේ මුහුදු වෙරළේය... ලංකාවේ රජයට එරෙහිවය" එය සත්‍යයකි. එසේ නොකරන්නේ නම් ඇමරිකාවේ හෝ ඉරානයේ හෝ මුහුදු වෙරළේ ජන අරගල කරන්නට ශ්‍රී ලංකා පුරවැසියන් වූ කිතුනු ධීවරයන්ට ඇති අයිතිය කුමක් ද? යන්න ගැටලුවකි. එවැනි අයිතියක් වූවා නම් එයට "හරියට (පහළ තැනින් නොව) ඉහළ තැනින් යයි ගලා ජලේ යි කීවා වගේය" කියා ලියුම්කරු විසින් අපට පිළිතුරු දී ඇත.

## පාරිභෝගිකයා

තවද ලංකාවේ "පතෝල මිළ ද ගලපා ගැනීමෙන් යථා තත්ත්වයට මුහුණ දීම ඔහුට (පතෝල වෙළෙන්දාට) කජ්ජක් නොවෙයි" කියයි පතෝල වැවෙනුයේ ලංකාවේය. පතෝල වෙළෙන්දා ලංකාවේ වෙළෙන්දෙක් බව, දැන ගැනීම ලියුම්කරුට විශේෂත්වයකි. නමුත් ඉන්ධන නිෂ්පාදනය විදේශීය රටවල සිදුවන්නකි. අපේ රජය ඉන්ධන මිළට ගන්නේ ලෝක වෙළෙඳපොල හරහා ය. ඒ අනුව ලංකාවේ ධීවරයා ද රජයෙන් ඉන්ධන මිළයට ගනියි. එවිට ද්‍රව්‍ය වර්ග දෙකම එනම්, පතෝල හා ඉන්ධන අතර මිළ ගණන් ඉතාමත් සරල ලෙස ගලපා ගැනීමට ලියුම්කරුට හිමි අයිතිය වෙත; උසුළු විසුළු කරමින් පාරිභෝගිකයෝ සිනාසෙති.

## මානුෂික අයිතිවාසිකම්

එතැනින් නොනැවතී "ළඟ එන මානුෂික අයිතිවාසිකම් චෝදනා සම්මේලනයට දර දිය සැපයීමේ චේතනාවෙන් ද?" යනුවෙන් පැනයක් කිතුනු ධීවර පාඨකයන් වෙත ඉදිරිපත් කරමින් ද "චෝදනා සම්මේලන" යනුවෙන් නව අරුතක් සහිත සම්මේලනයක් ගැන ද කියයි. ඇත්තෙන්ම එවැන්නකට අවශ්‍ය වන්නේ ඔහු විසින්ම හඳුන්වනු ලබන "දර දිය" වැනි ද්‍රව්‍ය හැරුනු විට ඉන්ධන වලට නොගැලපෙන ආකාරයේ ඉන්ධන මිල වැඩි කිරීමක් හෝ සිදුවීම ධීවර අරගල වලට අවශ්‍ය නැති බව එයින් තහවුරු කරයි. සහතික කරයි. එමෙන්ම "චෝදනා සම්මේලන" පවතින අවස්ථාවක දී ඉන්ධන මිල වුවද වැඩිකර අරගල ඇති කිරීමෙන් පල දරන්නෝ කවුරුන් දැයි රසවත් අත්දැකීම් ඇති අය නුදුරු අනාගතයේ දී ලියනු ඇතැයි සිතිය හැකිය.

## ධීවර නොදැනුවත්කම

කවුරුන් මෙසේ කීවත් "කෙසේ වෙතත් තෙල් අර්බුදය ගැන හරිහැටි නොදැන තමන් භාරයේ සිටින මේ කිතුනු බැටළුවන් ගැන සභා එඬේරුන් "නිකම්" සිටියේ නැත" යනුවෙන් ලියුම්කරු ලියයි. සභා එඬේරුන් විසින් රැක බලා ගන්නා කිතුනු බැටළුවන් තෙල් අර්බුදය ගැන හරිහැටි නොදන්නා වුවද, ඔවුන්ව අරගලයකට සූදානම් කළා ද? යන්න හඟවන පරිද්දෙන් ලියන්නේ ධීවර කිතුනුවන්ව හා එම සභා එඬේරුන්ව සමච්චලයකට පත් කිරීමට දෝයි සැකයකි.

## අදිසි හස්තයන්

මෙහෙම වෙද්දී, "මේ අදිසි හස්තයන් විසින් සමථයකට පත් කිරීමට කතෝලික සභා ශ්‍රේෂ්ඨයන් විසින් දරන ලද සියලු උත්සාහයන් නිෂ්ප්‍රභ කරමින් එම උද්යෝගය තමන්ට අවශ්‍ය වූ තැනට ගෙන ගියහ." ඒ කවුරුන්ද? ඔතැනදී අපට කතා කරන්න හැකි වන්නේ ලෝකෝත්තර හා ලෞකික යන දෙපැත්ත ගැන කතෝලික සභා ශ්‍රේෂ්ඨයන්ගේ උත්සාහයන් නිෂ්ප්‍රභ කරන්න තරම් අදිසි බලවේග කෙසේ හෝ හඳුනා ගැනීමට පවතින සාධක නිර්භයව පෙන්වා නොදීමෙන් ලියුම්කරුට ඇති අයිතිය මඟහැරයාම පිළිබඳවය.

## ජීවිත අහිමිවීම හා ආරක්ෂාව

මේ ප්‍රවිෂ්ඨය ගන්න කොට "මේ වත්ම කිතුනු ජන අඩවියක ...... අරගලයක් පැන නැගුණි. එහිදී සභා ශ්‍රේෂ්ඨයන්ගේ මැදහත්වීම කල්වේලා ඇතිව සිදුවිය. "කුමක්ද මේ අවාසනාව?" එය පහදා නොදී "සභාවට තවත් දරුවකු අහිමි විය" එසේ කියයි. එසේ නම් කල් වේලා ඇතිව හෝ නැතිව හෝ මැදහත් වූ අවස්ථා දෙකම කිතුනු දරුවන් අහිමි කිරීමේ යථාර්ථය ප්‍රදීප පාඨකයන් වෙත පහදා දී නැත.

නමුදු එයට, පිළිතුරු සපයන ලියුම්කරු මෙසේ පවසයි. "සභා ශ්‍රේෂ්ඨයන්ට එහා සිටියකු විසින් යහපත් එඬේරාගේ සැරයටිය පැහැර ගැනීමය" නැත. එය "එසේ නොව සිදුවූයේ මෙසේ ය. "සත්‍යයෙන් තොරව නිදහස නොපවතින බව සාන්ත සභාව උගන්වන්නීය" "එක්කෝ සත්‍ය සහ නිදහස එකට අත්වැල් බැඳ ගමන් කරයි. නැතිනම් එය දුඃඛිත ලෙස විනාශ වී යයි." සත්‍යය පිළිබඳව සඳහන් නොකරන හෝ සත්‍යනය සොයා නොයන හෝ සමාජයක් තුළ දුරාචාරී සහ ස්වාර්තථවාද විකෘතීන්ට මඟ එළිකරමින් ද, මිනිස් පුද්ගලයාගේ සහ මුළු මහත් සමාජයේම යහපත "ආරක්ෂා" කිරීම අනතුරට පත් කරමින් ද, සැම ආකාරයේම "නිදහස" ක්‍රියාත්මක වීම දුර්වල වී යයි." ඇත්තෙන්ම සිදුව ඇත්තේ බැටළුවන්ගේ නිදහස පැහැර ගැනීම මිස එඬේරාගේ සැරයටිය පැහැර ගැනීමක් නොවේ.

මෙසේ කරනු ලබන ඇතැම් විග්‍රහයන් ගැන ලියුම්කරුගේ වැදගත් යැයි සිතන රචනයේ බොහෝ සටහන් මෙහි මා සටහන් කරන්නේ නැතිව මා හට ලියන්න සිතුනේ; ඇත්තටම ලියුම්කරු නොදන්නා අරගල ඇතුළත් කිරීම යෙහෙකි නිසාය. එනම් අරගලයකට "අදාළව, පොදු මතය තුළ, නිවැරදිව තේරුම් නොගන්නා හෝ ක්‍රමවත්ව නොදක්වන හෝ සත්‍යයක් ඉදිරිපත් කිරීම උපකාරී වෙතැයි සිතමු: එනම්, දෙවන වතිකාන කතිකාවේ "ඩිග්නිටාටිස් හුමානේ" නමැති ප්‍රකාශනය මඟින් උගන්වනු ලබන, හෘදය සාක්ෂියේ නිදහසට ඇති අයිතිය පදනම්ව ඇත්තේ, ආගම් අතර හෝ මිනිසා විසින් නිර්මාණය කරන ලද සංස්කෘතික ක්‍රම අතර හෝ නොපවතින සමාන බව මත නොව, මිනිස් පුද්ගලයා කෙරෙහි වන සරාර්ථ විද්‍යාත්මක ගරුත්වය මත යන්නයි....."

එමෙන්ම "එය සත්‍යාගම සොයා යාමේ සහ එයට විශ්වාසවන්තව ජීවත් වීමේ ව්‍යායාමයේ දී, හෘදය සාක්ෂියේ වෙහෙසීමට උත්සාහ දරන්නා වූ, බාහිර සීමාවන්ට ගොදුරු නොවී සිටීම, මිනිස් පුද්ගලයා කෙරෙහි වන ගරුත්වය ඉල්ලා සිටී. එහෙයින් හෘදය සාක්ෂිය නිදහස හා ආගමික නිදහස පිළිබඳව ඉගැන්වීම කතෝලික ධර්මය විසින් උදාසීනතාවාදය සහ ආගමික සාපේක්ෂතාවාදය සදොස් බව ප්‍රකාශ කිරීම ප්‍රතිෂේද නොකරයි. එහෙත් එය ඒ සමඟ එකඟ වෙයි" (කතෝලිකයා සහ දේශපාලනය පොතේ පිටු අංක 14 වේ.) මෙයින් සභා මඟ පෙන්වීම නිවැරදි වේ.

එහෙයින් මහත් ගැඹුරින් නොව සරලව විමසා බලා පිළියම් යෙදීම තුළින්, කිතුනු පාඨකයන් දැනුවත් කිරීම හැර වෙනත් බහුබූත හැලි ලිවීමෙන් තොරව; ඕනෑම අරගලයක දී වුවද සභා මඟ පෙන්වීම පල දරන්නේ ය.

✍ බැසිල් දෙහිපිටිආරච්චි - මොරටුව

ප්‍රදීපය
කිතුනු චරිත

# කිතුදන පුබුදුවේ පෙරමඟ සැදූ
# චන්ද්‍රකීර්ති කුලරත්න


"රහසක් පවසමි පුතුනෙ අසනු මැන
හදවත සවන යොමා....
දහසක් එක්කර පවසනු
මැන එය
තව තව නොවී පමා..."

(පුබුදු ගීතාංජලී 120 ගීතිකාව)
- පබැදුම - චන්ද්‍රකීර්ති කුලරත්න

තම ජීවිතයේ නිරන්තර දේව කැමැත්ත ඉටු කරමින් සමාජ යුක්තිය හා සාධාරණත්වය උදෙසා ද කැපවූ ඔහු කිතු දන පුබුදුවේ චන්ද්‍රකීර්ති කුලරත්න ය. අප ආදරයෙන් ඔහු අමතන්නේ කීර්ති අයියා යනුවෙනි. කීර්ති අයියා ලේඛන කලාවේ දක්ෂයෙකි, ගී පද රචකයෙකි, නාට්‍ය පිටපත් රචකයෙකි ආදි වශයෙන් පැවසීම හෝ කලාකරුවෙකි යන්න කීම ද අප ඔහුට කරන අගෞරවයකි. ඔහුට තිබූ මහා දැනුම් සම්භාරය නිසා වරෙක ඔහුව මහාචාර්ය චන්ද්‍රකීර්ති කුලරත්න යනුවෙන් හඳුන්වනු ලැබුවේ ද විහිලුවට මෙනි. ඔහු සැබැවින්ම ආධ්‍යාත්මික විප්ලවීය මිනිසෙක් සහ සදාතනික සමාජ ප්‍රගමනයේ පෙර ගමන් කරුවකු විය. චන්ද්‍රකීර්ති කුලරත්න පසුගිය 16 වැනි දා අප අතරින් සදහටම සමුගනු ලැබීය. මෙම ලිපිය ඒ වෙනුවෙන් ඔහුගේ මතකය අවදි කිරීමකි.

## සේවක අයිතීන් උදෙසා

කොළඹ ආමර්වීදියේ පෞද්ගලික ආයතනයක සේවය කරමින් සිටියදී (සෙන්ට් ඇන්තනිස් සමූහ ව්‍යාපාරයේ) සේවක අයිතීන් උදෙසා 1967 වර්ෂයේ දී ගෙන ගිය සේවක අරගලයට නායකත්වය දුන්නේ චන්ද්‍රකීර්ති කුලරත්නයන් ය. එවකට ඔහු බාලා තම්පෝ මහතාට අයත් ලංකා කාර්මික සහ පොදු කම්කරු සේවක සංගමයේ වෘත්තීය සමිති නායකයෙකි. සේවකයන්ගේ අයිතීන් උදෙසා ඔහු සේවකයන් හා සමඟ පාලක මණ්ඩලයට එරෙහිව ගෙන ගිය අරගලය වඩාත් තීව්‍ර වීමත් සමඟම සේවක පක්ෂය ලෙසට තම අයිතීන් දිනා ගැනීම උදෙසා ඇනුමෙන් හා නීතියෙන් වඩාත් ශක්ති සම්පන්න විය. මේ සම්බන්ධයෙන් චන්ද්‍රකීර්ති කුලරත්නයන් තම සේවක සහෝදරයන්ව සන්නද්ධ කරවීමට වගකීම තම කරපිට ගත්තේ ය. පුරා මාස හයක සටනක් නිර්භයව ඉදිරියට ගිය ප්‍රතිඵලයක් ලෙස චන්ද්‍රකීර්ති කුලරත්න ඇතුළු සේවක පිරිස අවසානයේ දී තම සේවක සටන ජය ගත්තේ ය. ඒ නිසාම ඔහුට සේවක සහෝදරයන් අතරට නැවත ඒමට සිදුවූයේ තම පියවි දෙපා වලින් නොව සේවක සහෝදරයන්ගේ කරමතිනි.



## කිතු දන පුබුදුවේ ආරම්භය

70 දශකය ආරම්භයත් සමඟම චන්ද්‍රකීර්ති කුලරත්න එවකට කොළඹ අගරදගුරු පදවි තරුණ කටයුතු පිළිබඳ උපාධ්‍ය වත්මනයේ කිතු දන පුබුදුවේ ජාතික අධ්‍යක්ෂ ගරු සිරි ඔස්කා අභයරත්න පියතුමාගේ තරුණ ව්‍යාපාරයට සම්බන්ධ වී තමාගේත් අනෙකාගේත් ජීවිතවල සදාතනික සමාජ ප්‍රගමනය සොයා යන ගමන ඇරැඹීය. ඒ සඳහා වන ආධ්‍යාත්මික ව්‍යාපාරයකට මුල් පියවර තබමින් ගරු සිරි ඔස්කා අබයරත්න පියතුමා සමඟ එක් වී කිතු දන පුබුදුව ආරම්භ කළේ 1971 වසරේ දී ය. අද කිතු දන පුබුදුවේ මුදුන්මල්කඩ බඳු පුබුදු පිවිසීම් කතා මාලාව සම්පාදනය කිරීමට ඔස්කා අබයරත්න පියතුමා හා සමඟ එක්වන්නේ චන්ද්‍රකීර්ති කුලරත්නයන් ය.

එම පිවිසීමේ කතා තුළ දෙවියන් වහන්සේගේ ආදරය, දෙවියන් වහන්සේගේ වැඩසිටීම හා යාච්ඤා ජීවිතය ප්‍රමුඛ කොටගත් සරළ ආධ්‍යාත්මික විග්‍රහයක් අන්තර්ගතය.

ශ්‍රී ලාංකීය සමාජය විවෘත ආර්ථිකය යටතේ සියලුම දේ වාණිජකරණයට ලක්වූයේ 78 වසරේදී ය. අප තවමත් හොඳට හෝ නරකට භුක්ති විඳිමින් සිටින්නේ විවෘත ආර්ථිකයේ ප්‍රතිවිපාකය.

මෙම කාල පරිච්ඡේදය වනවිට එකිනෙකා පරයා යන සමාජයක පෙර නිමිති පහළ වෙමින් තිබුණි. ඊට කදිම ලෙසට මුහුණ දීම සඳහා රැල්ලට හසු වී උඩුගං බලා යාම වෙනුවට ඊට අභියෝග කොට සරළ චාම් දිවි පෙවෙතක් සමාජයට හඳුන්වා දීමට චන්ද්‍රකීර්ති කුලරත්න කටයුතු කළේ මනා ආධ්‍යාත්මික හික්මීමක් ඇතිවය.

එම සරළ චාම් දිවි පෙවෙතේ මූලාරම්භකයා ලෙසට චන්ද්‍රකීර්ති කුලරත්න 1988 වසරේ තම විවාහ මංගල්‍යයේ දී පළඳින රන්මුදුව වෙනුවට රිදී මුදුවක් පළඳිමින් කිතු දන පුබුදුවේ තරුණ සමාජයට නව මානයක් පෙන්වීමට නොපැකිළවම ඉදිරිපත් වූයේ ආධ්‍යාත්මික ශක්තියක් ද ඇතිවය. ඔහු කළ ගිහි ධර්මදූත කාර්යයන් අතරට ලේඛන කටයුතු ද විය.

ප්‍රථම දේව ධර්ම ශාස්ත්‍රිය සඟරාව වූ "ශ්‍රී වචනය", "දැක්ම" මාසික කිතුනු විකල්ප පුවත්පත, "නව මිනිසා" හා "සුදතුම් ගමන" ආදිය චන්ද්‍රකීර්ති කුලරත්නයන්ගේ ය. නිර්මාණ කාර්යයන්ය.

## කිතු දන පුබුදුවේ කලා සේවාව

කිතු දන පුබුදුවේ කලා සේවාවක් ආරම්භ කළ චන්ද්‍රකීර්ති කුලරත්න එවකට රට තුළ ඇති වූ විවිධ ගැටළු අරබයා දේව ජනතාව දැනුවත් කිරීමට නාට්‍යය ගණනාවක්ම නිර්මාණය කරනු ලැබීය.

ඒ අතරට "සිංහ කොඩිය රාජසිංහ", "හදකින් හදකට", හා "මා දෙස බලන්න" යන නාට්‍යයන් විය.

ඔහු විසින්ම නිර්මාණය කළ "හදින් හදකට නාට්‍යය නත්තල් නාට්‍යයකි. ඒ තුළින් අපේ සමාජයේ නොයෙක් ආකාර දුකට පත්ව පීඩා විඳින්නන්ගේ හදවත් තුළ මෙන්ම නිවෙස් තුළ සහ පවුල් අතර ක්‍රිස්තුන් වහන්සේගේ උපත සිදුවිය යුතු බවත් මිනිස්කමෙහි තිබූ සහෝදරත්වයේ හදවත් අගයන් නැති වි තෙතමනයක් නැති මමත්වයේ මිනිසා පූර්ණ ලෙස අන්ධ භාවයට පත්වී තිබෙන බව ද හඟවමින් මෙම නාට්‍යයෙන් අපගේ හදවත් අවදි කරවයි.

## දේව යුක්තිය හා දේව සාධාරණත්වය උදෙසා

චන්ද්‍රකීර්ති කුලරත්න සමාජ යුක්තිය හා සාධාරණත්වය උදෙසා නිර්භය ලෙස ඉදිරියට පැමිණ ඒ වෙනුවෙන් කටයුතු කර පෙනී සිටි අයෙකි. හුදු යුක්තිය හා සාධාරණත්වය උදෙසා කටයුතු කළ අයෙක් පමණක්ම නොව ඔහු ක්‍රියා කළේ දේව යුක්තිය දේව සාධාරණත්වය වෙනුවෙනි. ජීවිත කැපවීමෙන් හා මහත් වූ පරිශ්‍රමයෙන් යුතුව මේ සඳහා නිර්භීත ලෙස හෘද සාක්ෂියට එකඟව ඔහු ක්‍රියා කළේය. ඔහු දේව යුක්තිය, දේව සාධාරණත්වය සෙව්වේ පාලු ගෙවල්වල, ඉහළ සදළුතලයේ හෝ නොව මිනිසුන් අතර සිට දුක් විඳින, පීඩාවට පත් වූ සහ සමාජයෙන් එපා කරනු ලැබ කොන් වූවන් අතරට සමාජගත වීමෙනි.

එපමණක් ද නොව "රේරුම් නොවැරුම්" හෙවත් "වෙහෙසෙන මිනිසුන්" විශ්ව ලේඛනයේ ශත සංවත්සරය වෙනුවෙන් එහි අර්ථය දේව ජනතාව අතරට ගෙන යන්නටත් ඒ වෙනුවෙන් කතෝලික සභාවක් ලෙසට දේව ජනතාව ගෙන් සිදුවිය යුතු කාර්ය භාරය පිළිබඳව අවදි කරවන්නටත් 1995 වසරේදී චන්ද්‍රකීර්ති කුලරත්න කටයුතු කළේ අප කතෝලික සභාවේ ජ්‍යෝෂ්ඨ පියතුමන්ලා සහ ජ්‍යෝෂ්ඨ මාධ්‍යවේදීන් සමඟ පෙරමුණ ගනිමිනි.

## ආධ්‍යාත්මිකත්වය පුබුදාලන ගී පද

ඔහු අතින් ලියැවුණු ගී පද සංකල්පනාවන් පන්සිය ඉක්මවා තිබේ. දේව ජනතාවගේ ආධ්‍යාත්මික ජීවිතය නංවාලන සහ ආධ්‍යාත්මික ජීවිතයට නව පණක් දෙන ගීතිකා මෙන්ම රට සමාජය කෙරෙහි ඇල්මක් ඇතිව රට කෙරෙහි දැහිතකාමී ආධ්‍යාත්මයක් ඇතිකරලනු සඳහා ද ඔහු අතින් ලියැවුනු ගීත අපමණය.

අවසන් වශයෙන් චන්ද්‍රකීර්ති කුලරත්නයන් කිතු දන පුබුදුවේ මෙතෙක් ආ ගමන තුළ ඔහු කළ නිර්මාණ කාර්යයන් ඉදිරියට ගෙනයන්නේ කවරෙක් ද? ඔහු නිර්මාණය කළ නාට්‍යයන් තවදුරටත් සමාජගත කිරීමට හෝ ඒ තුළින් සභාවක් ලෙස අපට තව තවත් ජීවිතයට යමක් උකහා ගත හැකි ආකාරයේ වැඩ පිළිවෙලක් සැකසිය හැකි ද? කිතු දන පුබුදුව මෙම කාර්යයට උරදෙයිද?

✍ රුක්මාල් සිල්වා

# "සභා මාතාව තුළ ආදරය වෙමි මම"

## මහා මෙරක් වූ කුඩා මල සහ මහා මෙහෙවර - 6

ශුද්ධාත්මයාණන් වහන්සේව අප දෛනික ජීවිතය තුළ ප්‍රධාන වශයෙන් අත්දකින අවස්ථාවක් නම් අප යමක් කීමට පෙර අපගේ වචන තවමත් පාවෙමින් පවතිමින් තීරණයක් සඳහා නැවතී බලා සිටින මොහොතයි. එහිදී ශුද්ධාත්මයාණන් වහන්සේ අපව මූලික අවස්ථාවන් දෙකක් දෙසට පොළඹවයි. පළමුව නම් අපට පාලනය කර ගත නොහැකි ආවේගයක් සහ තීරණයක් ගැනීම අතරවේ.

එනම් ශුද්ධාත්මයාණන් වහන්සේ අප භාවිත කරන වෛරයේ වචන. ද්වේෂයේ වචන, ආත්මාර්ථ කාමිත්වයේ වචන, තරහාවේ වචන, ඊර්ෂ්‍යාවේ වචන ප්‍රකාශ කිරීමට ඇති ඇතුලාන්ත තල්ලුවට, අභ්‍යන්තර ආවේගයට එරෙහිව ක්‍රියා කිරීමට අවශ්‍ය ශක්තිය ලබාදෙන සේක. එවිට එවැනි වචන මුවින් පිටවීමට පෙර නිහඬතාවය තුළ ගිලී නොපෙනී යති. එයින් කිසිම පුද්ගලයකුට හානියක් සිදු නොවේ.

දෙවන කාරණය නම් යම් කිසි දෙයක් ගැන උද්‍යෝගිමත් වීම සහ තීරණයක් ගැනීමයි. එනම් ශුද්ධාත්මයාණන් වහන්සේ ඇතුළාන්ත භාෂාව අභ්‍යන්තර හැඟීම් ශබ්ද නඟා පිටකිරීමට අපව පොළඹවන මොහොතයි. එවිට දයාවේ, කරුණාවේ, ආදරයේ, සමාවදීමේ, තේරුම් ගැනීමේ, සංවේදිත්වයේ, ධෛර්යයේ, සාමයේ වචනවලට උපත ලැබේ.

ඉහත කී තත්ත්වයන් දෙකෙදීම ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් අපගේ ප්‍රතිචාරයන් මෙහෙයවනු ලබයි. එක් අවස්ථාවකදී අපගේ වචන පිට නොකිරීම තුළිනුත්, තවත් අවස්ථාවකදී අපගේ වචන පිට කිරීම තුළිනුත් ආත්මයාණන් වහන්සේ අප තුළ ජීවමානව ක්‍රියා කරන සේක.

සා. තෙරීස් තුමිය ශුද්ධාත්මයාණන් වහන්සේගේ දෛනික පෙළඹවීමට, මඟ පෙන්වීමට, මෙහෙයවීමට නිරන්තරයෙන්ම අවධානය යොමු කර සිටියාය. ඒ ගැන එතුමිය වරක් මෙසේ ප්‍රකාශ කර තිබුණි, "උන්වහන්සේ වචනවල ඝෝෂාව නොමැතිව උගන්වන සේක. උන්වහන්සේ ශබ්ද නඟා කතා කරනවා මා කිසි දිනෙක අසා නැත. නමුත් උන්වහන්සේ සෑම මොහොතකම මා තුළ වැඩ වාසය කරන බව මට හැඟේ. උන්වහන්සේ මා විසින් කළ යුත්තේ සහ කිව යුත්තේ කුමක්ද කියා මාව මෙහෙයවමින් ආලෝකමත් කරයි.

දෙවියන් වහන්සේගේ මඟ පෙන්වීම. මෙහෙයවීම එතුමියට ඉවක් මෙන් දැනුණේය. එම දිව්‍යමය පෙළඹවීම එතුමියගේ හදවතට හැඟුණාය. අප අවදියෙන් සිටියහොත් අපගේ ජීවිත තුළත් සත්‍යය මෙය නොවේද? අපගේ අත්දැකීම මීට සමාන නොවේද?

යමෙකුට යම්කිසි දෙයක් කීමට පෙර, ඊට සූදානම් වන විට, ඒ සඳහා කට ඇරීමට පෙර, ඇතුලාන්ත හඬක්, අභ්‍යන්තර ඉවක් එය නොකියා සිටින ලෙසට පෙළඹූ වූ අවස්ථාවන් ඔබට මතකද? එම ඇතුලාන්ත හඬ, එම හදවතේ ග ැඹුරෙන්ම මතු වෙන ඉව, එම අනතුරු හැඟවීම දෙවියන් වහන්සේගෙන් පැමිණෙන බව ඔබ සලකා ඇත්ද?

තෙරීස් තුමිය එය එසේ බව මනාව හඳුනාගෙන තිබුණේය. දෙවියන් වහන්සේ එතුමියට කතා කිරීමට පොළඹවන අවස්ථාවනුත්, කතා නොකිරීමට මෙහෙයවන අවස්ථාවනුත් එතුමිය හොඳ හැටි හඳුනා ගෙන තිබුණි.

අවශ්‍ය වූ විට කතා කිරීම සහ අවශ්‍ය වූ විට නිහඬවීම දෙවියන් වහන්සේගේ මෙහෙය වීමට ප්‍රතිචාර දැක්වීම සඳහා එතුමිය විසින් භාවිත කරන ලද ප්‍රධාන මාර්ග දෙකකි. එතුමිය සමහර අවස්ථාවලදී නිහඬ වූයේ යමක් කීමට ඇති බිය නිසා නොවේ. එතුමියගේ ජීවිතය සම්බන්ධයෙන් මෙම කාරණය අප හරියාකාරව හඳුනා ගත යුතුවේ. අවශ්‍ය වූ විට නිහඬව සිටීම එතුමියට මානසික සුවය, අධ්‍යාත්මික සැනසීම හා සතුට ළඟා කර දුනි (It was silence, above all else, that kept her sane). නිහඬතාවය තුළ ඉතා ගැඹුරු ආනන්දයක් ගැබ් වී ඇත. නමුත් සැබෑ නිහඬතාවය බියගුළුකමේ ප්‍රතිඵලයක් නොවේ.

ශාන්ත තෙරීස් තුමිය ඉතා සුවච කීකරු. අනෙකුත් පුද්ගලයන් ඉදිරියේ ඉතා යටහත් පහත් ලෙස ඕලුව පහත් කරගෙන වැඩකරන, ඉතා නෝංජල්, අනෙකුත් පුද්ගලයන්ට තමාව භාවිත කිරීමට ඉඩදුන්, දාසියක් මෙන් කටයුතු කරන ලද පුද්ගලයෙක් යයි එතුමිය ගැන ප්‍රචලිත වී ඇති චිත්‍රය සම්පූර්ණයෙන් වැරදිය. කොන්ද පණ නැති නිවටයකුට කිසිම දිනෙක ශාන්තුවරයෙක් හෝ ශාන්තුවරියක් වීමට නොහැකිය. ශාන්තුවරයන් සෑම විටකම කොන්ද කෙළින් තියාගෙන කටයුතු කරන ලද පුද්ගලයන්ය.

සත්‍යය ප්‍රකාශ කිරීමට අවශ්‍ය වූ විට එය නොබියව, නොපැකිළව ප්‍රකාශ කිරීම එතුමියගේ කැපී පෙනෙන ගුණාංගයක් වූවාය. වෙනත් පුද්ගලයන් විසින් මගහරින ලද ප්‍රශ්න වලට. මුහුණ නොදෙන ප්‍රශ්න වලට, පලා යන තත්ත්වයන් වලට එතුමිය ඉතා නිර්භීතව මුහුණ දුන්නාය.



ඒ සඳහා උදාහරණයක් ගනිමු. ගරු මාර්තා කන්‍යා සොයුරිය, ගරු ගොන්සාගා කන්‍යා මාතාවට අනවශ්‍ය ඇල්මක්, බැඳීමක් ඇතිකර ගෙන තිබෙන බව තෙරීස් තුමිය නිරීක්ෂණය කළාය. එවිට ඒ ගැන යමක් කිව යුතු බව එතුමියට ඇතුලාන්තයෙන්ම හැඟුණි. ඒ ගැන යාච්ඤාමය ලෙස මෙනෙහි කිරීමෙන් පසුව, මාර්තා කන්‍යා සොයුරිය සමඟ ඒ සම්බන්ධයෙන් කතා කිරීමට දෙවියන් වහන්සේ එතුමියව පොළඹවන බව එතුමියට හැඟුණි. එම සැලැස්ම තේරීස් තුමිය ගරු පෝලීන් කන්‍යා සොයුරියට අනාවරණය කළ විට, පෝලීන් කන්‍යා තුමියගේ ප්‍රතිචාරය වූයේ, "ඔබ එසේ කළහොත් ඔබගේ වචන නිරපරාදේ නාස්ති කර ගැනීමක් වන අතර, ප්‍රධාන කන්‍යා මව්තුමිය ඔබ මෙහි සිටිනවාටත් අකමැති වන අතර, ඔබව වෙනත් කන්‍යාරාමයකටද මාරු කර යැවිය හැකිය" යන්නය.


ගරු ගොන්සාගා කන්‍යා මව් තුමියගේ නිතරම වෙනස් වන සුළු මානසිකත්වය සලකා බලන විට. පෝලීන් තුමියගේ වචන වල විශාල සත්‍යතාවයක් අඩංගු වී තිබුණි. නමුත් තෙරීස් තුමියගේ ඊට පිළිතුර වූයේ. "ඔව් මා ඒ ගැන හොඳට දන්නවා. නමුත් ඒ ගැන කතා කිරීම මාගේ වගකීම බව මට දැන් ඒකාන්තයෙන්ම ස්ථිර නිසා, එයින් ලැබෙන ආනිසංස ගැන හිත හිතා ඒ ගැන මට කතා නොකර සිටීමට නොපුළුවන" යන්නයි.

තමන්ගේ අනාගතය ගැන තීරණයක් ගත හැකි පුද්ගලයා තුළ තමන් කෙරෙහි අප්‍රසන්න හැඟීමක් ඇති කරගැනීමේ අන්තරාදායක තත්ත්වයද නොසලකා, තෙරීස් තුමිය, ගරු මාර්තා කන්‍ය සොයුරියට ඒ ගැන කතා කළාය. ඊට හේතුව වූයේ දෙවියන් වහන්සේ විසින් එසේ කිරීමට එතුමියව මෙහෙයවනු ලැබූ බව එතුමියට හැඟුණු නිසයි.

මාර්තා කන්‍යා සොයුරිය වෙතට ගොස් තේරීස් තුමිය මෙසේ ඍජුවම පැවසුවාය; "ප්‍රධාන කන්‍යා මව් තුමිය ඔබ අඬමින් සිටිනවා දැක, ඊට වගකිව යුතු පුද්ගලයා කවුද යන්න විමසුවහොත්, ඔබ කමැති නම්, මම ඔබට කියන ලද සියල්ලම එතුමියට පවසන්න." තේරීස් තුමිය තම තීරණය සඳහා සම්පූර්ණ වගකීම බාර ගන්නා ලදි. එතුමිය තමන්ගේ වචන රහසක් මෙන් තබා ගන්නා ලෙසට මාර්තා තුමියගෙන් ඉල්ලා සිටියේ නැත. එතුමිය එවැනි ඉල්ලීමක් කළේ නම්, මාර්තා කන්‍යා සොයුරිය ඉතා අපහසුතාවයකට පත්වන්නට ඉඩ තිබුණි.

තේරීස් තුමිය තමන්ගේ තීරණයෙන් ලැබෙන යහපත් හෝ අයහපත් ප්‍රතිඵල වලට මුහුණ දීමට සූදානම්ව සිටියාය. ඒ ගැන මැසිවිලි නැඟු වේ නැත, අනවශ්‍ය ලෙස කලබලයටද පත් වූයේ නැත. එතුමිය විසින් කරන ලද දෙය වැනි දෙයක් කිරීමට අප තුළත් ධෛර්යයක් තිබේද? එවැනි හැකියාවක් ඇත්තේ අපගෙන් කීයෙන් කී දෙනාටද?

දෙවියන් වහන්සේ මේ ලෝකය තුළ ක්‍රියාත්මක වන්නේ අප ගන්නා තීරණ මඟින්ය., ඒවා තුළින්ය. ඒවාට එරෙහිව යැමෙන් නොවේ (God does not bypass human decisions). අපි ගන්නා තීරණවලට අප සදාකාලිකවම වගකිව යුතු වෙමු. මිනිස් ජීවිතයේ ගුණාත්මක භාවය අප ගන්නා තීරණ වල ගුණාත්මක භාවයට සමානුපාතික වේ.



මහාචාර්ය **ඇන්ටන් මීමන**

---

**20**

## දර්ශනය යනු කුමක්ද ?

### ප්‍රඥාව, සත්‍යය සහ බුද්ධිමය නිහතමානීත්වය

අප පෙරද සඳහන් කළ පරිදි ආදීතම සමාජ වල මානවයා තුළ පැවැතියේ විශ්වීය දැක්මකි (Cosmological Breakthrough). එනම් මිනිසා සමස්ත ස්වභාව ධර්මයේ කොටසක් බවත්, ස්වභාව ධර්මය මිනිසාගේ කොටසක් බවත්ය. මානවය ස්වභාව ධර්මය මිනිසාගෙන් වියුක්ත වූ කොටසක් වශයෙන් නොසලකන ලදී. මානවයාත්, ස්වභාව ධර්මයාත් එකම කාසියේ පැති දෙක මෙන්විය. මෙවැනි ලෝක දැක්මක් සහිත ජන සමාජයන් තවමත් පවතී. අපගේ සමහර ගෝත්‍රික සමාජ (Tribal Societies) මීට කදිම නිදසුනකි.

දැනට අවුරුදු 2600 පමණ පෙර ග්‍රීසිය මුල් කරගෙන මානව කේන්ද්‍රීය (Anthropological Breakthrough) ලෝක දැක්මක් සකස් වුණි. එහිදී විශ්ලේෂනාත්මක චින්තනය වැඩිදියුණු වීමට පටන් ගැණුනි. එනම් ඕනෑම සංසිද්ධියක් දෙස බලා, ඒ ගැන විචාරශීලීව විග්‍රහාත්මකව, ක්‍රමානුකූලව සහ ගවේෂණාත්මකව අදහස් ඉදිරිපත් කිරීමේ බුද්ධිමය සම්ප්‍රදායක් ආරම්භවුණි. බටහිර දර්ශනය ලෙස වැඩි වර්ධනය වූයේ එම ග්‍රීක ලෝක දැක්මයි. සමස්ත බටහිර දර්ශනයම ප්ලේටෝගේ දර්ශනයේ අධෝලිපියක් ලෙස සැලකෙන්නේද ඒ කාරණය නිසයි (The Whole western Philophical Tradition is a Footnote to Plato).

මෙම විවරණාත්මක, දාර්ශනික සම්ප්‍රදායයට සමාන්තරව සහ සමකාලිනව බිහි වු තවත් ඓතිහාසික ප්‍රවනතාවයක් නම්, මනුෂ්‍ය අභ්‍යන්තරය දෙස හැරී බලා ඒ ගැන විශ්ලේෂණාත්මක (Interiority Analysis) ඥානයක් ලබාගැනීමයි. එක් පුද්ගල අභ්‍යන්තරය, පුද්ගල ආත්මය පෝෂණය කිරීම. එහි විවිධාකාරයේ අභ්‍යන්තර හැල හැප්පීම් වලට සවන් දීම සහ ඒවාට අවධානය යොමුකිරීම, අභ්‍යන්තරය පිරිසිදු කර ගැනීම මෙම ගැලවීමේ ප්‍රවනතාවයේ (Soteriolotical Breakthrough) මූලික ස්වරූපයයි. මෙහිදී අපගේ ඇතුලාන්තය ගැන අතිශයින්ම අවංකවී එහි තත්ත්වය ගැන, එහි පවතින සැබෑ යථාර්ථය ගැන බුද්ධිමය ලෙස. සදාචාරාත්මක ලෙස විනිශ්චය කරනු ලැබේ.

ප්ලේටෝ, ශාන්ත පාවුලු තුමා, ජෙරමියා දිවැසිවරයා, ශාන්ත අගුස්තීනු තුමා යනාදීන් මෙම ආත්ම ගවේෂණයට අඩි තාලම දමන ලදී. ආත්මය (Psyche, anima, nefesh) යන සංකල්පයෙන් නිරූපණය කිරීමට උත්සාහ කරන ලද්දේ එම අවබෝධයයි. ආත්මය යනු අප මිය ගියායින් පසු ඉතිරි වන දෙයක් පමණක් නොව, ජීවත්ව සිටින විට පවා අපගේ පෞරුෂත්වයේ සැබෑ හරයයි. අව්‍යාජත්වයයි, සත්‍යයයි. ගැඹුරයි, අපගේ චරිතයේ හරයයි, සාරයයි. ඒ අනුව අප සාමාන්‍ය දෛනික ව්‍යහාරයේ යම් කිසි පුද්ගලයෙක් සම්බන්ධයෙන් භාවිත කරන "ආත්මය පාවා දුන්නා", "ආත්මයක් නැහැ" යනාදී කියමන් වල ගැඹුරු අර්ථයක් ඇත.

එමෙන්ම ගාන්ධි තුමා වැනි ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ට 'මහත්මා' (මහ+ආත්ම) යනුවෙන් හැඳින්වීමද ඉතා හරවත් ක්‍රියාවකි. එනම් ශ්‍රේෂ්ඨ පුද්ගලයන් තුළ ගැඹුරට දියුණු වූ අභ්‍යන්තරයක්. සංවේදී සහ පාරිශුද්ධ ඇතුලාන්තයක්, දයා භරිත, කාරුණික, සමාව දෙන සුළු ආත්මයක් පැවතීම 'මහත්මා' භාවයට සුදුසු කමකි. එවැන්නන්ට ගැලවීම ලබාගැනීම එතරම් දුෂ්කර නොවේ. ඔවුන්ගේ ජීවිතයේ මූලික දිශානතිය යොමුවී ඇත්තේ විමුක්තියේ, ගැලවීමේ, නිදහසේ, සත්‍යයේ මාර්ගය දෙසටය.


අඛණ්ඩ ස්වයං විග්‍රහය (Self-analysis, Self-examination, Self-Scrutiny), ආත්ම සෝදිසිය (Soul-Searching or Heart-Searchin) මහාත්මා ගාන්ධි තුමා පවසන ආකාරයට ආත්මය ශල්‍යකර්මයකට භාජනය කිරීම (Self-Observation), ආත්ම දමනය (Self-mastery) යනාදිය මෙම ගැලවීමේ ක්‍රියාවලිය තුළ අඩංගුය.

සෑම සමාජ, දේශපාලන, ආර්ථික, සංස්කෘතික අරගලයක්ම මිනිස් ආත්මයේ, මිනිස් අභ්‍යන්තරයේ, මිනිසාගේ ඇතුලාන්ත බලවේගවල ප්‍රතිබිම්බයකි, පරාවර්තනයකි. සෑම සමාජ පෙරළියක්ම, දේශපාලන විප්ලවයක්ම, ජන කැරැල්ලක්ම, ජනතා අරගලයක්ම තනි පුද්ගල ආත්මයේ බලවේගයක් ලෙස හට ගන්නා දෙයකි. සෑම විප්ලවයකම පදනම මනුෂ්‍ය හදවතයි. සමාජය යනු ප්‍රසාරණය වූ මනුෂ්‍ය ආත්මයයි. එමෙන්ම තනි පුද්ගල ආත්මය යනු සංකෝචනය වූ සමාජයයි.

රටක පොදු චරිතය සකස් වන්නේ තනි පුද්ගල ආත්මයන් වල එකතුවක ප්‍රතිඵලයක් වශයෙනි. ඒ අනුව රටක් සමස්තයක් ලෙස පිරිහීමට පාත්‍ර වුවත් තනි පුද්ගලයකුට එම පිරිහීමේ ගොදුරක් නොවී, එම පිරිහීමට දායක නොවී සිටිය හැකිය. එමඟින් තනි තනි පුද්ගලයන්ට සමස්ත සමාජයටම ආලෝකයක්, ආදර්ශයක්, ආනන්දයක් සහ ආශිර්වාදයක් විය හැකිය. සමාජ අර්බුදය තව තවත් අධික වන තරමට එයින් විමුක්තිය ලබාගැනීමට ඇති හැකියාවද වැඩි වර්ධනය වේ. එමෙන්ම ගැලවීමේ අවස්ථාව වැඩිවන තරමට අප අර්බුදයට ලක්වීමට ඇති ඉඩ ප්‍රස්තාවද වැඩිවේ. මෙ ද්විත්ව ප්‍රවාහය ගැන අප සෑම මොහොතකම අවධියෙන් සහ අවධානයෙන් සිටිය විය යුතුවේ. ඒ සඳහා පදනම වැටෙන්නේ අඛණ්ඩ ස්වයං විග්‍රහය තුළිනි. අප යම්කිසි දෙයක් ගැන අවධියෙන් නොසිටිය හොත් එහි වහලෙක් බවට අප පත්වේ. සෑම මොහොතක් තුළම අවදියෙන් ජීවත්වීම ප්‍රඥාව තුළ වාසය කිරීමකි, ඉතා යහපත් ජීවිතයක් ගත කිරීමකි (Awareness is Holiness).

ඉදිරි කලාපයට... »

## සිහිකිරීමයි



### අතිගරු ජෝ. එම්මානුවෙල් වික්‍රමසිංහ පියතුමා

*කොළඹ සා. පීතර විදුහලේ හිටපු විදුහල්පති පියතුමා, අගරදගුරු පදවියේ හිටපු කොළඹ උතුර අනුනායක හිමි ස්වර්ගස්ථව 6 වසරක් සපිරිනි. සැමගේ යැදුම් පතන්නේ සියලු සහෝදර, ඥාති කැල සමග ඥාති පුත් ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමාය.*

**දේව වචනය... 3 පිටුවෙන්**

ගිහි පැවිදි පූජක සියල්ලන්ට පොදු කැඳවීමක් - ගිහි ජනතාව අතරින් තමයි පූජක - පැවිදි කැඳවීම් බිහිවන්නෙ. ගිහි පවුල්වල ශුද්ධවන්ත හා ප්‍රේමවන්ත භාවය දේව කැඳවීම් වලට තෝතැන්නක්. ශුද්ධවන්ත භාවය අප සැම සියලු දෙනාට පොදු හා මූලික කැඳවීමක්.

*ප්‍රශ්නය - ගිහි ජනතාව මේ ශුද්ධවන්ත භාවය කොහෙන්ද ලබාගත යුත්තේ, නැතිනම් සොයා ගත යුත්තේ?*

රදගුරු හිමි - ඉතා හොඳ ප්‍රශ්නයක් - ගිහියා මේ ශුද්ධවන්තභාවය මුලින්ම අත්දකින්නේ තමන්ගේම පවුලෙන් තම අම්මා - තාත්තා - වැඩිහිටි ඥාති මිත්‍රාදීන් වෙතින්. දෙවනුව සමාජ ජීවිතය තුළින්. එය තවත් පැහැදිලි කරන්නේ නම් මේ ක්ෂෙත්‍ර දෙකටම පොදු සාධකයන් ගැන එදා දෙවන වතිකාන මන්ත්‍රණ සභාව ඉගැන්නුවා.

'ගිහියන්ගේ සියලු වැඩපලද, යාච්ඤා හා ධර්මදූත ව්‍යාපාරද, විවාහක හා පවුල් ජීවිතද. එදිනෙදා වැඩකටයුතුද, මානසික/ ශරීරික විවේකය ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ ඉටුකරන්නේ නම් - ජීවිත දුෂ්කරතා ඉවසීමෙන් දරා ගන්නේ නම් ක්‍රිස්තුන් වහ්සේ කරණකොටගෙන ඒවා දෙවින් වහන්සේට ප්‍රසන්න වන සේක. මේ ඉගැන්වීමේ පදනම ඔබ වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ කුමක් කරතත්, ඒ සියල්ල ජේසුස් ස්වාමින් වහන්සේගේ නාමයෙන් කරමින් උන්වහන්සේ තුළින් දෙව්පියාණන් වහන්සේට ස්තුති කරන්න (කොලෙස්සි 3:17) යන්නයි. ඒ අනුව ගේදොර කටයුතු මෙන්ම ලෝකානුබද්ධ කටයුතු ගිහියාගේ ආත්මික ජීවිතයේ ක්‍රියාවලින් බැහැර නොකළ යුතුයි.

*ප්‍රශ්නය - ලෝකය සමග වඩාත් ගැටෙන්නේ ගිහියා - එසේනම් එහිදී ඔහුගේ කාර්ය භාරය කුමක්ද?*

රදගුරු හිමි - ගිහියාගේ ලෝකානුබද්ධ චරිතාංගය ආවේනික ලක්ෂණයක්. මේ සමාජය තුළ ලවණක් වීම, මුහුන් පිඩක් වීම ඔහුගේ කැඳවීමයි. මේ ලෝකය පාපිෂ්ඨ බවට පත්වුයේ මිනිසාගේ විෂමාචාර ගති පැවතුම් හින්දයි. ඒ නිසාම ක්‍රිස්තුන් වහන්සේ සිය ජීවිතය පූජා කර එය ගලවා ගත්තා. මේ ගලවා ගත් ලෝකය ශුද්ධවන්ත කිරීම ගිහියාගේ කාර්ය භාරයයි. ගිහි කැඳවීම තුළ ඔහුට පැවරෙන ප්‍රධාන වගකීමක් වන්නේද එයයි. ගිහියා තම කැඳවීමට පරිපූර්ණත්වය ලබාගන්නේ ද ඒ සඳහා යොදා ගන්නේද ක්‍රිස්තුන් වහන්සේ විසින් පියාණන් වහන්සේට මහිමය ලබාදීමට යොදාගත් මේ ලෝකයයි. 'සහෝදරයෙනි සැම කෙනෙක්ම තමා කැඳවීම ලැබූ තත්ත්වයෙහි දෙවියන් වහන්සේ සමඟ පවතිත්වා (1 කොරින්ති 7:24). ශුද්ධ වූ පාවුළු තුමා පෙන්නා දෙන්නේ එයයි.


*ප්‍රශ්නය - ගිහියා මුහුන දෙන නූතන අභියෝග මොනවාද?*

රදගුරු හිමි - නූතන අභියෝග රාශියක් මැද ගිහියාට තම සාක්ෂි දැරීම සිදුකරන්නට සිදුවී තිබෙනවා. ගිහියාට තම පවුල නඩත්තු කිරීමට යම් රැකියාවක නිරතවීමට සිදුවෙනවා. එහිදී සැබෑ කිතුනු ගිහියන් ලෙස තම කාර්යයේ වෘත්තීය නිපුණත්වය ප්‍රකට කරවන්නට ඔහු සමත් වෙතැයි සභාව අපේක්ෂා කරනවා. එසේ නැතිව කරන්නන් වාලේ නොකළ යුතුයි. සිය කාර්යය මනුෂ්‍ය උත්තරීත්ත්වය, මානව අභිමානය සුරකෙන හා කුළු ගැන්වෙන ලෙස ඉටුකිරීම කිතුනු කැඳවීමයි. එමෙන්ම දැනුවත්වූ ක්‍රිස්තියානි හෘදය සාක්ෂියක් ඇතිව කටයුතු කිරීමේ වගකීමෙන් බැඳී සිටිනවා. මේ තත්ත්වය තුළ වර්තමාන ප්‍රශ්න, ගැටලු, අභියෝග ඉතාමත් සංකීර්ණයි. ඒවායේ පැතිකඩ රැසක් පවතින අතර සැඟවුනු තැන් අනාවරණය කරගත යුතුයි. ශුද්ධාත්ම වරම් තුළ දේව අභිමතය කුමක්දැයි උගන්වන සභා මතයට අවනත විය යුතුයි. හුදු සිය මතිමතාන්තර සභා මතය ලෙස අර්ථ දැක්වීමේ මුලාවෙන් මිදී සැබෑ සත්‍යය නිසි පරිදි අවබෝධ කරගත යුතුයි.

උදාහරණයක් ලෙස ඇතැම් විට වෛද්‍ය මතය හරි දේ වැරැදියටත්, වැරැදි දේ හරි ලෙසත් දක්වනවා. ඇතැම් විට පහසුදේ - බහුතරයක් පිළිග න්නා දේ සමාජයේ ජීවත්වීම සඳහා හරි ලෙස පිළිගැනීම නිවැරැදි නැහැ. කෘතිම උපත් පාලනය, ගබ්සාව, අනායාස මරණය, සමාජ ඇබ්බැහිකම්, සංනිවේදනය ඔස්සේ සදාචාරයට හානිකර දේවල් සාධාරණීකරණය කිරීමෙන් සිදුවන හානිය බොහෝවිට වැඩි හඬකින් යටපත් කරනවා. ඒ ඒ ජන කොට්ඨාශවලට උචිත යැයි කියන එහෙත් මානව සමාජයට අහිතකර දේවල් මානව හිමිකම් ලෙස හුවා දැක්වීම, සමූල ඝාතන වාර්ගික සංහාර සාධාරණීය කිරීමේ අනතුරක් තිබෙනවා. මූලික අයිතිවාසිකම් ආරක්ෂා වීමේ මුවාවෙන් තව කෙනකුගේ අයිතීන් උල්ලංඝනය වන්නේ නම් එහි කිසිදු සදාචාරාත්මක බවක් ඇත්තේ නැහැ. පටු දේශපාලන මතිමතාන්තර පරම සත්‍යය ලෙස වැළඳ ගත යුතු නෑ.

*ප්‍රශ්නය - මෙවර ජාතික ගිහි ඉරුදින ඔබවහන්සේගේ ඇරියුම කුමක්ද?*


රදගුරු හිමි - මෙවර තේමාව වී ඇත්තේ 'දේව වචනය ගිහියාට අභියෝග යක්,' යන්නයි. ඇත්තෙන්ම මෙය ඉතාමත් කාලෝචිත තේමාවක්! සභාව තුළ ගිහියාගේ කාර්යභාරය/ දූත මෙහෙවර ඉටුකිරීමේදී ඉගැන්වීම, බෙදාහදා ගැනීම - සාක්ෂි දැරීම හා පෝෂණය ලබාගැනීම යන කිතුනු වටිනාකම් එල දැරිය යුතුයි. කිතුනු ජනවන්දනාවේ ප්‍රමුඛතම අංගය වන දිව්‍ය පූජාවට හුදු නිරීක්ෂකයන් ලෙස එක්වීමේ පිළිවෙතින් මැත්වී සහභාගිත්ව ජනකොටසක් බවට අපේ ගිහි ජනතාව පත්විය යුතුයි. මෙයින් ලබා ගන්නා පෝෂණය සිය පවුලේ, මීසමේ රදගුරු වසමේ කටයුතු වලට කැපවීමේ, මූලිකත්වය දීමේ හා නායකත්වය ගැනීමේ තත්ත්වය දක්වා වර්ධනය විය යුතුයි. ගිහියන් ලෙස ඔබ සැමදෙනා කැඳවීමක් ලබා තිබේ. කතෝලිකයකු ලෙස ඔබේ මේ ධර්මදූතික කැඳවීම බෞතිස්ම ස්නාපනයෙන් ක්‍රිස්තුන් වහන්සේ වෙතින් ලබා ඇති නිසා ඒ ඔස්සේ සමාජය තුළ කටයුතු කිරීමේ වගකීමෙන් ඔබ බැඳී සිටී. ඒ වගකීම සපුරන්නට ඔබ පෙරමඟ ගන්නේ නම් අපේ ගිහියා තව දුරටත් නිදාසිටින යෝධයෙක් වන්නේ කොහොමද?





වැලිසර මැක්ඩොනල්ඩ්ස් ආයතනය අසල කාමර 3 ක නිවසක් කුලියට දීමට. වාහන නැවතීමට හැකිය (සිංහ පාර)

**දු.ක. 071-5151999**
**071-6884762** (N0329)



මුර සේවය සඳහා පවුලක් අවශ්‍ය වී ඇත.

**විමසීම්**

**031-2240157**

(NG3693)


**ඥානාර්ථ ප්‍රදීපය... 1 පිටුවෙන්**

යෝජිත පදවි කතිකාවත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක දී පදවි කතිකාවත වැඩ සටහනේ මහ ලේකම් හා පදවි විවාහ අධිකරණ බාර ගරු විමල්සිරි ජයසූරිය පියතුමා තරයේ අවධාරණය කළේය.

වෙන්නප්පුව සකරියස් ශාලාවේ පැවති මේ වැඩසටහනේ දී කතිකාවත හා සම්බන්ධව ජනතාව මනාව දැනුවත් කිරීමට පියතුමා කටයුතු කළේය.

## 2012 සිග්නීස් (OCIC/ UNDA) උත්තමාචාර උළෙල සඳහා නිර්මාණ බාරගැනේ.

ගෙවුනු වසරේ සිනමා සහ රූපවාහිනී නිර්මාණකරයේ යෙදුනු විශිෂ්ටයන් හා විශිෂ්ට නිර්මාණයන් අගයා සම්මානයෙන් පුදනු ලබන සිග්නීස් (OCIC/ UNDA) උත්තමාචාර උළෙල 36 වෙනි වරටත් මෙම වසරේ සැප්තැම්බර් මස 01 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මේ සඳහා 2011 වසරේ ප්‍රදර්ශිත සියළුම සිංහල චිත්‍රපට ද එම වසරේ සියළුම රූපවාහිනී නාළිකා තුළින් විකාශිත කොටස් 75 නොඉක්මවූ ප්‍රාසාංගික ටෙලි නාට්‍යයන් හා ඒකාංගික ටෙලි නාට්‍යයන්ද සුදුසුකම් ලබති. එම වසරේම නිර්මිත රූපවාහිනී / සිනමා වාර්තාමය වැඩසටහන්, කෙටි දෘශ්‍යරූප නිර්මාණ (කෙටි චිත්‍රපට / වෙළඳ දැන්වීම / පූර්ව ප්‍රචාරක පට /සංගීත වීඩියෝ) හා සජීවීකරණ නිර්මාණද බාර ගැනේ. මෙම වසරේද දේශීය සිනමාව හා ඒ හා බද්ධ සිනමා කර්මාන්තයේ ප්‍රගමණය වෙනුවෙන් පෘථුල මෙහෙවරක නියැළුන නිර්මාණ කරුවන් තිදෙනකු වෙනුවෙන් "සිග්නීස් අන්තර් ජාතික ප්‍රණාමයද" දේශීය සිනමා සාහිත්‍යයේ උන්නතිය වෙනුවෙන් සාහිත්‍යකරණයේ යෙදෙන්නන් දිරිමත් කිරීම සඳහා පිදෙන "සිරිල් බී. පෙරේරා අනුස්මරණ සම්මානයද" පිරිනැමෙන අතර "ජයවිලාල් විලේගොඩ අනුස්මරණ සම්මාණය" පිදීම සඳහා "නූතන සන්නිවේදන ප්‍රවනතා හමුවේ දේශීය සිනමාවේ හෙට දවස" යන මැයෙන් ආධුනික විචාර තරඟය මෙවරද පැවැත්වේ.

සියලුම නිර්මාණයන් සංඛ්‍යාන දෘශ්‍ය දර්ශන තැටි (DVD) මගින් පමණක් 2012 මැයි 15 වෙනි දිනට ප්‍රථම සිග්නීස් ශ්‍රී ලංකා පර්ෂදය, අංක 19, බැල්කම් පෙදෙස, කොටා පාර, බොරැල්ල යන ලිපිනයේ පිහිටි අප කාර්යාලයට, කාර්යාල වේලාව (පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා) තුළදී ගෙනවිත් බාර දිය යුතු වේ. අයැදුම් පත්‍ර සහ වැඩි තොරතුරු සඳහා 011-2693425 හෝ 071-8954214 අංක ඇමතීමෙන් ලබා ගැනීමට පුළුවන. **ගරු බෙනඩික්ට් ජෝශප් පියතුමා, අධ්‍යක්ෂ**

## පුස්තකාල වලට නොමිලේ කතෝලික පොත්

යම් පරිත්‍යාගශීලී හිතවතෙක් මීසම්, දහම් පාසල්, තරුණ සමිති කතෝලික පුස්තකාල වලට නොමිලේ පොත් කීපයක් පරිත්‍යාග කිරීමට සූදානමින් සිටියි. ඒවා ප්‍රවාහන ගාස්තු නොමැතිව ලබා දෙන්න සූදානම්ය. පුස්තකාලයේ නම, වගකියන්නා, ලැබිය යුතු තැන, ලගම ප්‍රදීප පත්තර බෙදාහරින තැන, ලිඛිතව දැනුම් දෙන්න.

*පුස්තකාල වලට නොමිලේ බෙදා දෙන කතෝලික පොත් ව්‍යාපෘතිය, කතෝලික මුද්‍රණාලය, කොළඹ 08.*


ජා-ඇල, වැලිකඩ කතෝලික නිවසක නැවතී මාස 6 ක දරුවකු බලා ගැනීමට අවු. 40-45 අතර නිරෝගී කාන්තාවක් අවශ්‍යයි.
ග්‍රාම සේවා සහතිකය හෝ පියතුමාගේ ලිපිය සමග කථා කරන්න.
**දු.ක. 077-3824463**
(NG3694)

**මව් සෙවන ළමා නිවාසය**

කොළඹ ප්‍රදේශයේ පවත්වාගෙන යන පිරිමි ළමා නිවාසයකට කම්කරුවෙක් අවශ්‍ය වී ඇත. වයස 40-50 අතර ආයතනය තුළ නැවතී සේවය කළ යුතුය. ආහාර හා නවාතැන් සපයනු ලැබේ. පහත ලිපිනයට අයදුම් කරන්න.

**ලේකම් මව් සෙවන**
**අංක 12 මැදපාර මට්ටක්කුලිය,**
**කොළඹ 15.**
**සතියේ දින 011-3133455,**
**011-2529560**
(N0311)

**මව් සෙවන ළමා නිවාසය**

කොළඹ පවත්වාගෙන යන පිරිමි ළමා නිවාසයකට අවු. 40-50 අතර කතෝලික සහකාර පාලිකාවක් අවශ්‍ය වී ඇත. පළපුරුදු අය විය යුතු අතර ආයතනය තුළ නැවතී සේවය කළ යුතුය. සියලු විස්තර සහිත අයදුම් පතක් පහත ලිපිනයට යොමු කරන්න.

**ලේකම් මව් සෙවන**
**අංක 12 මැදපාර මට්ටක්කුලිය,**
**කොළඹ 15.**
**සතියේ දින 011-3133455,**
**011-2529560**
(N0310)


## ජාතික කිතුනු සාහිත්‍ය උළෙල 2012

බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව සංවිධානය කරන ජාතික කිතුනු සාහිත්‍ය උළෙල, 2012 ඔක්තෝබර් මස පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කෙරෙමින් පවතී. එම උත්සවයට සමගාමීව සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් කිතුනු ගීතිකා සාහිත්‍යයට උදාර සේවයක් කළ නිර්මාණකරුවන් හට උපහාර තිළිණ පිරිනැමීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව පද රචනය, සංගීතය (තනු නිර්මාණය, වාදනය) හා ගායනය යන නිර්ණායක ඔස්සේ පහත සුදුසුකම් සපුරණ නිර්මාණකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- ★ කතෝලික හා ක්‍රිස්තියානි (ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයට අයත් සාම්ප්‍රදායික සභාවන්ට පමණකි), ගිහි / පැවදි නිර්මාණකරුවන්ට අයදුම් කළහැකිය.
- ★ අයදුම්පත ඉදිරිපත් කළ හැක්කේ දැනට ජීවතුන් අතර සිටින කලාකරුවන්ට අදාළව පමණක් වන අතර එම නිර්මාණ 1980 වර්ෂයට පෙර නිර්මාණය කරන ලද ගීතිකා විය යුතුයි.
- ★ සියලු තොරතුරු ඇතුළත් වන සේ ඔබ වහන්සේ/ තමන් විසින්ම සකසා ගත් අයදුම්පත් අයදුම්කරු හෝ ඔබ වහන්සේ / ඔහු ඇය වෙනුවෙන් වෙනත් අයෙකුට හෝ ඉදිරිපත් කළ හැකිය.
- ★ අයදුම්කරුගේ නිර්මාණ පිළිබඳව ඇති ලිඛිත හා වෙනත් සාක්ෂි පිළිබඳව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර අවශ්‍ය විටෙකදී එම සාක්ෂි ඉදිරිපත් කිරීමට හැකි විය යුතුයි.
- ★ යම් අයදුම්කරුවකු ගීත රචනය, සංගීතය (තනු නිර්මාණය, වාදනය) හා ගායනය යන ක්ෂේත්‍ර එකකට වඩා වැඩි ප්‍රමාණයක නියැලුන ද සියලු තොරතුරු ඇතුළත්ව එක් අයදුම් පත්‍රයක් පමණක් ඉදිරිපත් කිරීම සෑහේ.
- ★ ඉහත කී ක්ෂේත්‍ර තුන අතුරින් යම් ක්ෂේත්‍රයකට අදාළව ලැබී ඇති අයදුම්පත් සම්බන්ධයෙන් සෑහීමකට පත් විය නොහැකි වුවහොත් එම ක්ෂේත්‍රයට අදාළව සම්මාන පිරිනොනැමෙනු ඇත.
- ★ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මගින් මීට පෙර සංවිධානය කරන ලද සාහිත්‍ය උළෙලවලදී සම්මානයට පාත්‍ර වූ නිර්මාණකරුවන්ට නැවත අයදුම් කළ නොහැක.
- ★ නියමිත දිනට පෙර නොලැබෙන අයදුම්පත් හෝ නිර්මාණ පිළිබඳව සාක්ෂි තහවුරු කිරීමට අපොහොසත් වන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

***ඉහත කොන්දේසි වලට යටත්ව සියලු අයදුම්පත් 2012 ජුනි මස 30 ට පෙර අධ්‍යක්ෂ, ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව, 155/10, කාසල් වීදිය, කොළඹ 08 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් බාර දිය හැකිය.***





සීදූවේ පදිංචි, රෝමානු කතෝලික, වයස 33, උස 5' 6", තලළුළු, කඩවසම්, නිවසක් සහිත පර්චස් 50 හිමි පවුල් බරින් තොර රජයේ කාර්මික ආයතනයක පාඨමාලාවක් හදාරා පිළිගත් ආයතනයක ස්ථිර සේවයේ සැලකිය යුතු වැටුපක් ලබන පුතුට රූමත්, චරිතවත්, දහමට ලැදි, රැකියාවක් හෝ ආදායමක් ලබන සාමාන්‍ය පවුලක දියණියක විශ්‍රාමික මව්පියෝ සොයති. දු.අ. 011-2258465. අංක NG3684, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.


කටුනායකට නුදුරු, රෝමානු කතෝලික, 1983.10.20 උපන්, උස 5' 8", ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සේවය කරන පුතුට සාමාන්‍ය පවුලකින් පැහැපත් දියණියක පියා සොයයි. අංක NG3680, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

මීගමුව, කතෝලික, 1980 උපන්, උස 5' 10", කඩවසම්, ඉතාලියේ රැකියාවැති, නිවසක් හිමි පුතුට රූමත්, චරිතවත් දියණියක මව්පියන් සොයයි. දු.අ. 071-4594223. අංක NG3706, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

මීගමුව, සිංහල, කතෝලික, 1984 උපන්, උස 5' 4", පැහැපත්, වත්කම් හිමි, ඕස්ට්‍රේලියාවේ උපාධිය ලබා එහි ප්‍රධාන ආයතනයක විධායක තනතුරක් දරණ, ඉහළ වැටුපක් ලබන වැඩිමහල් පුතුට ගුණ යහපත්, උපාධියක් ඇති, පැහැපත්,සිහින්සිරුරැති,දේපලැති, විවාහයෙන් පසු විදේශගත වීමට කැමති වැදගත් පවුලක දියණියක දෙමව්පියෝ සොයති. පුතු අගෝස්තු මස ලංකාවට පැමිණේ. සියලුම විස්තර දුරකථන අංකය සමග දන්වන්න. අංක NG3703, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

ජා-ඇලට නුදුරු, රෝමානු කතෝලික, අවු. 29, උස 5' 3", The Deep (Aquarium) හි සේවය කරන, සියලු දුසිරිතෙන් තොර, දහමට ලැදි, අංග සම්පූර්ණ නිවසක් සහිත පර්. 15 ක ඉඩම හා ප්‍රධාන පාරට නුදුරුව ව්‍යාපාරයක් කළ හැකි බිම් කොටසක් හිමි වැඩිමහල් පුතුට යහපත් ගතිපැවතුම් ඇති, චරිතවත් දියණියක දෙමව්පියෝ සොයති. දු.අ. 011-2234236, 077-8654596. අංක N0341, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

වයික්කාල, රෝ. කතෝලික, අවු. 34, උස 5', මේසන් රැකියාවේ නිරත, නිවසක් හිමි පුතුට සාමාන්‍ය පවුලක සහකාරියක දෙමව්පියෝ සොයති. අංක Q12N0448, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.



ගම්පහට නුදුරු, රෝමානු කතෝලික, අවු. 26, උස 5' 4", රජයේ රෝහලක සේවයේ නියුතු වෛද්‍ය දියණිය සඳහා වෛද්‍ය හෝ ඉංජිනේරු පුතකු දෙමව්පියෝ සොයති. සැලකිය යුතු දේපලක් ඇය සතුය. අමතන්න 077-3256645 අංක NG3695, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

මාදම්පෙට නුදුරු, රෝමානු කතෝලික, 1985 උපන්, උස 4' 10", වැඩිමහල් තලළුළු දියණියට (සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබා ඇත.) සාමාන්‍ය පවුලකින් ස්ථිර රැකියාවක් ඇති මතින් හා දුමින් තොර දහමට ලැදි ගුණ යහපත් පුතකු දෙමව්පියෝ සොයති. (හලාවත මීගමුව අතර විශේෂයි) දු.අ. 072-3115037. අංක NG3699, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

ගම්පහට නුදුරු, කතෝලික, අවු. 25, උස 5' 1", උගත්, (සුදු) ප්‍රසන්න පෙනුමැති, කන්‍යාරාමයක ඉගෙනීම ලැබූ පවුලේ එකම දියණියට වැදගත් පවුලකින් උගත්, රැකියාවක් කරන සියලු දුසිරිතෙන් තොර කඩවසම්, ගුණ යහපත් සහකරුවකු ව්‍යාපාරික පියා සොයයි. ඇය ව්‍යාපාර කළමණාකරණවේදී උපාධිය අපේක්ෂිකාවකි. වෘත්තීය සුදුසුකම් ලබා ඇත. සැලකිය යුතු දායාදයක් ඇයට හිමිය. සියලු විස්තර පළමු ලිපියෙන් බලාපොරොත්තු වේ. අංක NG3700, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.